ශ්‍රී ලංකා
විදුලි සංදේශ
නියාමන
කොමිෂන් සභාව

# වාර්ෂික වාර්තාව | 2017

ශ්‍රී ලංකා
විදුලි සංදේශ
නියාමන
කොමිෂන් සභාව

# වාර්ෂික වාර්තාව
# 2017

# අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩය



රටක විදුලි සංදේශ ක්ෂේත්‍රය සංවර්ධිත ලොව තුළ ප්‍රමුඛවූත් සැලකියයුතුවූත් සුවිශේෂී කාරණයක් වන අතර, එම රටවල සංවර්ධනයේ අත්‍යාවශ්‍ය අංගයකි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් හෙබි වර්ධිත ලෝකයක් කරා ගමන් කිරීමට මෙන්ම සෑහීමකට පත් විය හැකි සාක්ෂාත් කර ගැනීම් ළඟා කර ගැනීම අරභයා වර්තමානයේදී නවීන ශීඝ්‍රයෙන් වර්ධනය වන විදුලි සංදේශ තාක්ෂණය මෙන්ම තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ප්‍රධාන වශයෙන් වැදගත් වේ.

මූල්‍ය ඉලක්ක, නියාමන වෙනස්කම් සහ තාක්ෂණික වෙනස්වීම් පසුකළ 2017 වර්ෂයේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විදුලි සංදේශ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ සාර්ථකවූ රාජ්‍ය ආයතනයක් වශයෙන් සිය තත්ත්වය කෙරෙහි අවධානය යොමු කර ඇත. තිරසාර ලෙස වඩා ප්‍රශස්ත වූ ජීවන තත්ත්වයකින් යුතුව ශ්‍රී ලාංකීය ජනජීවිත සවිබල ගැන්වීම සහ වැඩිදියුණු කිරීම බෙහෙවින් ප්‍රශංසනීයය.

2017 වසරේදී කොමිෂන් සභාව විසින් සිදු කළ සමීක්ෂණයට අනුකූලව විදුලි සංදේශ පහසුකම් සැපයිය යුතු ඌන සංවර්ධිත සහ නොදියුණු ප්‍රදේශ හඳුනාගත් අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වඩා සාර්ථක පියවරක් වූ “ගමට සන්නිවේදනය” වැඩසටහන මගින් පොලොන්නරුව සහ කළුතර දිස්ත්‍රික්කවල නව සන්නිවේදන පහසුකම් ව්‍යාප්ත කිරීමට පියවර ගෙන ඇත.

පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු සහ නව තාක්ෂණයන් හඳුන්වාදීම මගින් මෙරටේ ජනතාවට වැඩි ප්‍රතිලාභ ලබාදීමට ජාත්‍යන්තර තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සංවිධාන සමඟ ප්‍රශස්ත සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් 2017 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ප්‍රශංසනීය වූ ක්‍රියාකාරකම්වල නිරත වී ඇත. විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන් සහ එවැනි පුහුණු මධ්‍යස්ථානවල ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම මෙරටේ සෙසු ජන කොටස් කෙරෙහි අවධානය යොමු කිරීමේ තවත් වැදගත් ක්‍රියාකාරකමකි.

2017 වසරේ කාර්යයන් සාක්ෂාත් කර ගැනීමෙහිලා සිය පරිශ්‍රමය සහ දායකත්වය ලබාදුන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිතුමාට, අධ්‍යක්ෂ ජනරාල් තුමාට සහ කාර්ය මණ්ඩලයට ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි. ඔවුන්ගේ දක්ෂතාවයන් සහ කැපකිරීම් නොමැතිව මේ කාර්යයන් සිදු නොවන්නට ඉඩ තිබිණි. කණ්ඩායමක් වශයෙන් ව්‍යාප්තවීම නිසා සමස්ථ ශ්‍රී ලාංකීය ජන ජීවිතවල තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ ඔවුන් නිර්මාණය කරන ලද අගය සහ අනෙක් අතට ඔවුන්ගේ පරිශ්‍රමය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සහ විදුලි සංදේශ තාක්ෂණය මගින් ශ්‍රී ලංකාවේ පරිවර්තනය වැඩිදියුණු කිරීමට සහ සවිබල ගැන්වීමට හැකිවිය. මෙරටේ පොදු මහජනතාවට සාධාරණ වූ මිල මට්ටමක් ලබාදීම පිණිස සාධාරණවූ තරඟකාරීත්වයක් මගින් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නවීන තාක්ෂණය හඳුන්වාදීමෙහිලා පෞද්ගලික අංශයේ ක්‍රියාකරුවන් සහ සේවා සැපයුම්කරුවන් විසින් දායකත්වය ලබා දී ඇත.



**මෛත්‍රීපාල සිරිසේන**
**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති**

# සභාපතිගේ පණිවුඩය

අද විදුලි සංදේශ සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය ඕනෑම රටක සංවර්ධන ඉලක්කවල අපේක්ෂිත ගමනාන්තය ළඟා කර ගැනීම පිණිස වැඩි වශයෙන් ඉවහල් වන මාධ්‍යයක් වී තිබේ. මෙම කාර්යයේදී තීරණ ගැනීම සඳහා නිරවද්‍ය තොරතුරු සැපයීම ප්‍රධාන සාධකයක් වන අතර තොරතුරු සන්නිවේදන තාක්ෂණය සහ විදුලි සංදේශනය මේ ආකාරයෙන් නිසි කාලයකදී වැදගත් කරුණු නිවැරදි කිරීමේ අරමුණින් ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරයි. තවද වර්තමානයේදී තොරතුරු සන්නිවේදන තාක්ෂණය / විදුලි සංදේශනයෙන් තොරව ලොවෙහි සංවර්ධනයක් නොමැත. රටකට බලපාන තොරතුරු සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් සංවර්ධනයේ වැදගත්කම සම්පූර්ණයෙන් අවබෝධ කර ගනිමින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සිය නියාමන කාර්යයන්වල නිරත වන අතරම 2017 වසරේදී මෙරටේ විශේෂ අවශ්‍යතා සහිත ජන කොටස්වලට තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ දැනුම ලබාදීමේ හැකියාව පිරික්සීම පිණිස ක්‍රමවත් වැඩසටහන් රැසක් ආරම්භ කර ඇත. මෙම වැඩසටහන් තුළ, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ඉලක්ක සාක්ෂාත් කර ගැනීම පිණිස පෞද්ගලික අංශය සමඟ අත්වැල් බැඳගෙන කටයුතු කර ඇත.

2017 වසර තුළදී , ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මෙරටේ විදුලි සංදේශ ක්ෂේත්‍රය සංවර්ධනය කරා මෙහෙයවීමේදී වඩා ඵලදායී ක්‍රියාකාරකම් රැසක් ආරම්භ කර ඇත. 19XX කෙටි සංකේත අංක හඳුන්වාදීම පුළුල් කිරීම, කදිරාන පිරික්සුම් මධ්‍යස්ථානයට අමතරව නව සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීම, දැනට ක්‍රියාත්මක නීති ශක්තිමත් කිරීම පිණිස පවත්නා පනත සඳහා නව සංශෝධන ඇති කිරීම, සමාජයීය වගකීමක් වශයෙන් අස්ථානගතවූ දුරකථන සොයාදීමට පොලීසියේ සහාය ලබා ගැනීම, ග්‍රාහකයන් සඳහා නව පහසුකමක් වශයෙන් අන්තර්ජාල වේගය මැනීම පිණිස නව තාක්ෂණය හඳුන්වාදීම, වැඩි ව්‍යාපාර ප්‍රගතිය අත්කරදීම පිණිස කුඩා ව්‍යවසායකත්ව සංවර්ධන අංශය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, නවීන විදුලි සංදේශ මෘදුකාංග භාවිතයන් හඳුන්වාදීම, කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම පිණිස වැඩි පහසුකම් සැපයීම අරභයා කොළඹ ප්‍රධාන කාර්යාලයේ නවීකරණ වැඩ ආරම්භ කිරීම, විනෝදාස්වාදය ගෙන දෙන පහසුකම් සහ ව්‍යාපාරික අවස්ථා වලින් සමන්විත අංගසම්පූර්ණ ස්ථානයක් බවට පත් කර ගැනීම පිණිස කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතියේ විනෝදාස්වාදය සපයන උද්‍යානයක් ස්ථාපනය කිරීමට ක්‍රියා කිරීම සහ පාරිසරික ගැටළු නිරාකරණය කිරීම පිණිස තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහ විදුලි සංදේශන අප ද්‍රව්‍ය කළමණාකරනය කිරීම 2017 වසරේදී සිදු කරන ලද නව ක්‍රියාකාරකම් කිහිපයකි.

නියාමන ක්‍රියාමාර්ග තුලින් 2017 වසරේදී කොමිෂන් සභාව විසින් උත්පාදනය කළ ආදායම 2017 වසරේදීද රජයේ ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රශස්ත ආදායම් ප්‍රභවයක් වී ඇත. 2017 වසරේදී අරමුදල සඳහා ප්‍රේෂණය කළ මුළු මුදල රුපියල් බිලියන 55.77 විය. ජංගම දුරකථන අංශය සම්බන්ධයෙන් මුළු කර්මාන්ත ආදායම ස්ථාවර තත්ත්වයක් ගන්නා ලද අතර ස්ථාවර ප්‍රවේශ දුරකථන අංශයේ වර්ධනය සියයට 7 වර්ධනයක් පෙන්නුම් කළේය.

2017 වසර කරා ආපසු හැරී බැලීමේදී , ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට 2017 වසරේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය අත්කරගත් ප්‍රගතිය පිළිබඳව සෑහීමකට පත් විය හැකිය. ජාත්‍යන්තර විදුලි සංදේශ සංවිධාන සමඟ පවත්වාගෙන ගිය අඛණ්ඩ සම්බන්ධතාවය පුහුණු සහ තාක්ෂණික පහසුකම් ඇතුළු ප්‍රතිලාභ රැසක් මෙරටට ගෙන ඒමට බෙහෙවින් ඉවහල් විය. මෙහිලා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා සහ  කාර්ය මණ්ඩලය ලබාදුන් ඉමහත් සේවය බෙහෙවින් ප්‍රශංසනීය වේ.

**සභාපති**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

# පටුන

**01 පරිච්ඡේදය ............................................................................ 1**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන්
සභාව (ශ්‍රී.ල.වි.ස.නි.කො.ස) ආරම්භය,
දර්ශනය, මෙහෙවර, අරමුණු සහ වගකීම්

**02 පරිච්ඡේදය ............................................................................ 7**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන්
සභාව සහ විධායක නිලධාරීන්

**03 පරිච්ඡේදය ............................................................................ 11**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන්
සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2017
වර්ෂයේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

**04 පරිච්ඡේදය ............................................................................ 21**

2017 වර්ෂය සඳහා අංශ අනුව
කාර්යසාධන වාර්තාව

**05 පරිච්ඡේදය ............................................................................ 73**

අභ්‍යන්තර විගණන කාර්යසාධනය සහ
විගණන කමිටු වාර්තා

**06 පරිච්ඡේදය ............................................................................ 79**

විගණනය කළ මූල්‍ය ප්‍රකාශනය

**07 පරිච්ඡේදය ............................................................................ 107**

විගණකාධිපතිගේ වාර්තාව

## කෙටි යෙදුම් ලැයිස්තුව

| | | |
|---|---|---|
| APNIC | Asia Pacific Network Information Center<br>ආසියා ශාන්තිකර ජාල තොරතුරු මධ්‍යස්ථානය |
| APT | Asia Pacific Telecommunity<br>ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාව |
| ARPU | Average Revenue per User<br>පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය |
| ASMS | Antenna Structure Management System<br>ඇන්ටනා ව්‍යුහ කළමණාකරන පද්ධතිය |
| BOI | Board of Investment<br>ආයෝජන මණ්ඩලය |
| CERT | Computer Emergency Readiness Team<br>පරිගණක ආපදා සූදානම් කිරීමේ කණ්ඩායම |
| CID | Criminal Investigation Department<br>අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව |
| CSR | Corporate Social Responsibility<br>ආයතනික සමාජ වගකීම් |
| CTO | Commonwealth Telecommunication Organization<br>පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය |
| CWG | Council Working Group<br>සංගම් කාර්ය කණ්ඩායම |
| DOA | Department of Agriculture<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| DTH | Direct to Home<br>සෘජු ගෘහස්ථ |
| FAO | Food and Agriculture Organization<br>ආහාර හා කෘෂිකර්ම සංවිධානය |
| GCI | Global Cyber Security Index<br>ගෝලීය සයිබර් ආරක්ෂණ දර්ශකය |
| GMDSS | Global Maritime Distress Safety System<br>ගෝලීය සමුද්‍ර ආපදා ආරක්ෂණ පද්ධතිය |
| HFDF | High Frequency Direction Finding<br>අධි සංඛ්‍යාත දිශා නිශ්චය කිරීම |
| ICT | Information and Telecommunications Technology<br>තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය |
| ICTA | Information and Communication Technology Agency<br>තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය |
| IMT | Institut Mines Telecom<br>මයින්ස් ටෙලිකොම් ආයතනය |
| ISP | Internet Service Provider<br>අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් |

| | | |
|---|---|
| IT | Information Technology<br>තොරතුරු තාක්ෂණය |
| ITOL | International Telecommunication Operators Levy<br>ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු |
| ITU | International Telecommunication Union<br>ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය |
| JICA | Japanese International Cooperation Agency<br>ජපන් ජාත්‍යන්තර සහයෝගීත්ව නියෝජිතායතනය |
| LT | Lotus Tower<br>නෙළුම් කුලුන |
| MFR | Master Frequency Register<br>ප්‍රධාන සංඛ්‍යාත රෙජිස්ටරය |
| MOA | Ministry of Agriculture<br>කෘෂිකර්ම අමාත්‍යාංශය |
| NIA | National Information Agency<br>ජාතික තොරතුරු නියෝජිතායතනය |
| OLAC | Outgoing Local Access Charges<br>පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු |
| OTT | Over the Top<br>විදුලි සංදේශ සේවා සැපයුම්කාර සමාගම් විසින් අන්තර්ජාල සම්මුති ජාලයක් ඔස්සේ සේවා සැපයීම |
| PCU | Project Consultancy Unit<br>ව්‍යාපෘති උපදේශන ඒකකය |
| PILD | Policy International Relation and License Division<br>ප්‍රතිපත්ති ජාත්‍යන්තර සම්බන්ධතා සහ බලපත්‍ර අංශය |
| PPP | Private Public Partnership<br>පෞද්ගලික රාජ්‍ය හවුල්කාරිත්වය |
| PSTN | Public Switching Telephone Network<br>පොදු ස්විචීකරණ දුරකථන ජාල |
| QOS | Quality of Service<br>සේවා තත්ත්ව |
| RMC | Regional Monitoring Centers<br>ප්‍රාදේශීය පිරික්සුම් මධ්‍යස්ථාන |
| RMS | Remote Monitoring Stations<br>දුරස්ථ පිරික්සුම් මධ්‍යස්ථාන |
| RTE | Radio Terminal Equipment<br>ගුවන් විදුලි පර්යන්ත උපකරණ |
| SAARC | South Asian Association for Regional Co-opration<br>ප්‍රාදේශීය සහයෝගීත්වය පිළිබඳ දකුණු ආසියානු සංගමය |
| SAFIR | South Asian Forum for Infrastructure Regulation<br>යටිතල පහසුකම් නියාමනය පිළිබඳ දකුණු ආසියානු සමුළුව |

| | | |
|---|---|
| SED | Small Enterprises Development<br>කුඩා ව්‍යවසාය සංවර්ධන |
| SLLRDC | Sri Lanka Land Reclamation and Development Corporation<br>ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව |
| SME | Small and Medium Sized Enterprises<br>කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් |
| TL | Telecommunication Levy<br>විදුලි සංදේශ බදු |
| TDC | Telecommunication Development Charges<br>විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව |
| TRCSL | Telecommunications Regulatory Commission of SrI Lanka<br>ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව |
| TSO | Telecommunications System Operators<br>විදුලි සංදේශ පද්ධති ක්‍රියාකරුවන් |
| UDA | Urban Development Authority<br>නාගරික සංවර්ධන අධිකාරිය |
| URL | Uniform Resorce Locator<br>ඒකරූපී සම්පත් නිවේශකය |
| VTC | Vocational Training Centers<br>වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන |
| WTISD | World Telecommunication and Information Society Day<br>ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය |

# වගුව

01: 2017 දී නිකුත් කරල ලද උපකරණ නිෂ්කාශනය සහ මාදිලි අනුමැතිය ....................................11

02: 2017 වර්ෂයේදී සංඛ්‍යාත වර්ණාවලි පරිහරණය කරන්නන් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව ..................................................................................................................12

03: 2017 දී නිකුත් කරන ලද නිෂ්කාශන ලිපි සංඛ්‍යාව ........................................................12

04: 2017 වර්ෂය තුළ යෙදවූ සාමාජික සහ දායක මුදල් .........................................................15

05: 2016-2017 කාලපරිච්ඡේදය සඳහා ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය (ARPU)......................................17

06: විදුලි සංදේශ බදු , සෙස් , විදුලි සංදේශ සංවර්ධන ගාස්තු බදු සහ පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු බදු 2016-2017 (රුපියල් මිලියන) ........................................................18

07: සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කරන්නන් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව 2017 ..........23

08: 2017 වර්ෂයේදී ලැබුණු පැමිණිලි සහ පැවැත්වූ විමර්ශන......................................................23

09: 2017 සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ලෙස භාවිතා කරන බවට හඳුනාගත් සංඛ්‍යාව සහ ගනු ලැබු නිවාරණ ක්‍රියා මාර්ග ..................................................................................24

10 :නිකුත් කරන ලද නිෂ්කාශන ලිපි සංඛ්‍යාව, 2017 ..................................................................24

11: කොන්ත්‍රාත්තුව පිළිබඳ සාරාංශය- නෙළුම් කුලුන ව්‍යාපෘතිය ..................................................34

12 : නෙළුම් කුලුන ව්‍යාපෘතියේ ප්‍රගතිය ....................................................................................35

13: ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල මුළු කර්මාන්ත ආදායම 2011 – 2017 (රුපියල් මිලියන) .........................................................................................43

14: 2012 – 2017 කාල පරිච්ඡේදය සඳහා ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ග්‍රාහක පදනමේ සංඛ්‍යාව ........43

15: 2013 – 2017 කාලපරිච්ඡේදය සඳහා ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල..............................................................................................................44

16: බදු වලින් පසුව ශුද්ධ ලාභය/(පාඩුව) 2011 – 2017 (රුපියල් මිලියන) ......................................44

17: ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල මුළු කර්මාන්ත ආදායම 2010 – 2017 (රුපියල් මිලියන) ..........................................................................................44

18: 2012 සිට 2017 දක්වා විදුලි සංදේශ බදු (රුපියල් මිලියන)......................................................45

19: සෙස් 2012 – 2017 (රුපියල් මිලියන) ..................................................................................45

20: විදුලි සංදේශ සංවර්ධන ගාස්තු බදු රැස්කිරීම්........................................................................46

21: පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු බදු රැස් කිරීම් ...........................................................46

22: ගමට සන්නිවේදනය සමීක්ෂණය 2017 (පොලොන්නරුව සහ කළුතර දිස්ත්‍රික්ක)..................47

23: 2017 වාර්ෂික සාමාජිකත්ව දායක මුදල් ගෙවීම ....................................................................54

24: ජාල අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වලට අදාල සංඛ්‍යා ලේඛන 2017 ......................61

25: 2017 වසරේදී වෙන් කරන ලද කෙටි සංකේත අංක (පෞද්ගලික ආයතන සඳහා)...................61

26: 2017 වසරේදී වෙන් කරන ලද කෙටි සංකේත අංක (රාජ්‍ය ආයතන සඳහා) ............................62

27: මාදිලි අනුමැතිය සහ උපකරණ නිෂ්කාශනය .......................................................................63

28: විදේශීය පුහුණු වැඩසටහන් 2017.......................................................................................64
29: දේශීය පුහුණු වැඩසටහන් 2017.........................................................................................67
30: ශ්‍රී ලංකා විදුලි සංදේශ කොමිෂන් සභාවේ ආදායම 2015-2017 ................................................70
31: ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ .......................................................................................72

## රූප සටහන්

01: ස්වයං වේග පරීක්ෂණ වාර්තාව ..........................................................................................29
02: ජාල වේගී පරීක්ෂණ ප්‍රතිඵල - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ස්ථාපිත.......30
03: ජාල වේගී පරීක්ෂණ ප්‍රතිඵල - ශ්‍රී ලංකා ව◌ිදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පිටත...........30

## ප්‍රස්ථාර

01:ජංගම සහ ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම්වල මුළු කර්මාන්ත ආදායම 2011-2017 ............43
02: 2012 සිට 2017 දක්වා විදුලි සංදේශ බදු .............................................................................45
03: සෙස් රැස්කිරීම (2012 – 2017).........................................................................................45
04: 2015-2017 දක්වා විදුලි සංදේශ බදු.................................................................................70
05: ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගේ බදු (2015-2017)..................................................71
06: මුළු ආදායම (2015-2017) ...............................................................................................71

# 01 පරිච්ඡේදය

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ල.වි.ස.නි.කො.ස) ආරම්භය, දර්ශනය, මෙහෙවර, අරමුණු සහ වගකීම්

### ආරම්භය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත, නම්වූ ප්‍රධාන පනත සංශෝධනය කිරීම සඳහා පාර්ලිමේන්තුවෙන් සම්මත කරන ලද, 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත යටතේ ස්ථාපනය කරන ලද රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක් වේ. මෙම වාර්තාවේ පනත යන්නෙන් 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන ) පනත මගින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත හැඳින්වෙන අතර කොමිෂන් සභාව යන්නෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හැඳින්වේ.

1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ප්‍රඥප්තිමය පනතට අනුකූලව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) මෙරටේ සියළුම විදුලි සංදේශ කරුණු මෙහෙයවන රාජ්‍ය බලධරයා වේ. නීතිමය පනතේ බලතල ප්‍රකාරව නීත්‍යානුකූල බලධාරියා වශයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) මෙරටේ සියළුම විදුලි සංදේශ කරුණු සම්බන්ධයෙන් වගකිවයුතු රජයේ බලයලත් ආයතනය වේ. ඒ අනුව කොමිෂන් සභාවට පාරිභෝගිකයින්ගේ සහ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වල යහපත නිසැක කරමින් මෙරටේ විදුලි සංදේශ සේවා වැඩිදියුණු කිරීමට පනත මගින් බලය පවරා ඇත.

### කොමිෂන් සභාව සහ කොමිෂන් සභා රැස්වීම්

කොමිෂන් සභාව කොමිෂන් සභා සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර ජනාධිපති ලේකම්වරයා නිල බලයෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිවරයා වේ.

එමෙන්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා, ප්‍රධාන විධායක නිලධාරියා වන අතර කොමිෂන් සභා සාමාජිකයෙකුද වේ. සෙසු සාමාජිකයින් තිදෙනා පිළිවෙලින් නීති, කළමණාකරන, මූල්‍ය ක්ෂේත්‍රවල විශිෂ්ඨතාවක් ලබා ඇත්තාවූ තැනැත්තන් වේ.

2017 වර්ෂයේදී කොමිෂන් සභාව කොමිෂන් සභා රැස්වීම් එකොලහක් පවත්වා ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විශේෂ ව්‍යාපෘති සහ පරිපාලනමය කරුණු, කොමිෂන් සභාවේ වාර්ෂික අයවැය, නියාමන කරුණු ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාව තීරණ ගැනීම, අනුමැතිය ප්‍රදානය කිරීම සහ ආවරණ අනුමැතිය ලබාදීම සිදු කරයි.

## දර්ශනය

*විද්‍යාත්මක හා නියාමන විශිෂ්ටතාව මගින් දියුණුවෙමින් ඉදිරියට යන විදුලි සංදේශ කර්මාන්තයේ විශ්වීය නියාමකයකු වශයෙන් පිළිගැනීමට ලක්වීම.*

## මෙහෙවර

*කුසලතාවයෙන් පිරිපුන් සදාචාර සම්පන්න ශ්‍රම බලකායක් මගින් තරඟකාරී වෙළඳපලෙහි සාධාරණත්වය හා යුක්තිය ප්‍රවර්ධනය කිරීමෙන් පිළිගත හැකි ගුණාත්මක බවකින් හා දැරිය හැකි මිලකින් යුක්ත සේවාවක් දීප ව්‍යාප්තව කලට වේලාවට ලබාදීමට වග බලා ගැනීම.*

## මෙහෙවර ප්‍රකාශනය අර්ථ නිරූපනය කිරීම

ශ්‍රී ලංකාවේ දිගු කාලීන සන්නිවේදන අවශ්‍යතාවයන් සපුරාලීම සහතික කරනු වස් සාධාරණත්වය, තරඟකාරීත්වය සහ ආයෝජන දිරිගන්වන නියාමන පරිසරයන් නිර්මාණය කිරීම උදෙසා සියළුම පාර්ශවකරුවන් සමඟ ස්වාධීන, විවෘත සහ පාරදෘශ්‍ය ආකාරයෙන් ක්‍රියා කිරීම තුලින් සියළුම පරිභරණය කරන්නන්ට සාධාරණ, යුක්තිසහගත සහ දැරිය හැකි මිල ගනන් යටතේ වැඩිදියුණු සහ ගුණාත්මක බවෙන් ඉහළ සන්නිවේදන තාක්ෂණ සේවා සැපයිය හැකි බව සහතික කිරීම.

## අරමුණු

විදුලි සංදේශ පනත ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සාක්ෂාත් කළ යුතු අරමුණු පහත දැක්වේ.

1. ජාතික අභිවෘද්ධියට හේතු වන හදිසි සේවා, පොදු දුරකථන කුටි සේවා, දුරකථන නාමාවලි තොරතුරු සේවා, සමුද්‍රීය සේවා සහ ග්‍රාමීය සේවා වැනි සේවාවන්වල අවශ්‍යතාවය සපුරාලමින් ශ්‍රී ලංකාව තුළ දේශීය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා සාධාරණව හා කාර්යක්ෂමව සැපයීමට වගබලා ගැනීම.
2. සෑම ක්‍රියාකරුවෙකුගේම බලපත්‍රයේ සඳහන් කර ඇති සේවාවන් සපයනු ලැබීම නිසැක කිරීම සඳහා එකී සෑම ක්‍රියාකරුවෙකුටම අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය සහ කළමණාකරන සම්පත් ඇති බවට සහ ඔවුන් විසින් ඒවා යොදා ගනු ලබන බවට වග බලා ගැනීම.
3. අය කරනු ලබන ගාස්තු සහ සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් මෙන්ම විදුලි සංදේශ උපකරණවල තත්ත්වය හා විවිධත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ, ගැනුම්කරුවන්ගේ සහ වෙනත් පාවිච්චිකරන්නන්ගේ සම්බන්ධතාවන් හා පොදුවේ මහජන යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.
4. විදුලි සංදේශ සේවා හා සම්බන්ධ වාණිජ කටයුතු වල නිරත තැනැත්තන් අතර ඵලදායී තරඟකාරිත්වයක් පවත්වාගෙනයාම සහ ප්‍රවර්ධනය කිරීම මෙන්ම ඒ තැනැත්තන්ගේ කාර්යක්ෂමතාව සහ පිරිමැසුම්දායක බව ප්‍රවර්ධනය කිරීම.

5. අභ්‍යන්තර සහ ජාත්‍යන්තර විදුලි සංදේශ පහසුකම් පිළිබඳව සීඝ්‍ර සහ අඛණ්ඩ සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.
6. අනවශ්‍ය ප්‍රමාදයන් හෝ බාධාවන් හෝ අවහිරතාවයන්ගෙන් තොරව විශ්වාසදායක සහ කාර්යක්ෂම සේවාවක් සැපයීමේ තම වගකීම ඉටු කිරීමට ක්‍රියාකරුවන්ට හැකිකම ඇති බවට නිසැක කිරීම.
7. විදුලි සංදේශ සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර ගැන නව තාක්ෂණික ක්‍රම වැඩි දියුණු කිරීම සහ ඒ ක්‍රම භාවිතා කිරීම.
8. ශ්‍රී ලංකාවෙන් පිටත සිය ව්‍යාපාරික ස්ථාන ඇති විදුලි සංදේශ සේවා බහුල වශයෙන් පාවිච්චිකරන්නන් ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාරික ස්ථාන පිහිටුවීම පිණිස දිරි ගැන්වීම.
9. ජාත්‍යන්තර සංක්‍රාන්ති සේවා සඳහා ශ්‍රී ලංකාව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම.

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වගකීම්

රජයේ ප්‍රධාන ආයතනයක් වන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ ජාතික නියාමන නියෝජිතායතනය වේ. කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වන්නේ නියාමන ක්‍රියාවලිය ස්ථායී ලෙස ශක්තිමත් කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම මගින් විදුලි සංදේශ කර්මාන්තයේ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම, මහජන යහපත ආරක්ෂා කිරීම සහ වර්ධනය වන තරඟකාරී වෙළඳපලේ උද්ගත වන අභියෝග වලට මුහුණ දීමයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ සේවා නොසපයන නමුත් කාර්යක්ෂමව හා ක්‍රමවත්ව විදුලි සංදේශ සේවා සැපයීමෙහිලා විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් දිරිගන්වයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාල පහසුකම් විශ්වීය මට්ටමට වැඩිදියුණු කිරීම පිණිස සියළුම විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් වලට සහාය වේ.

කොමිෂන් සභාවේ ප්‍රධාන වගකිම් පහත දැක්වේ.

1. පනතේ විධිවිධාන බලාත්මක කිරීම සහ බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ගේ බලපත්‍රයේ කොන්දේසි තරයේ පිළිපැදීම.

2. බලපත්‍රලාභී ක්‍රියාකරුවන් අතර නිදහස් සහ සාධාරණ තරඟකාරිත්වයක් පවත්වා ගැනීමට දිරි ගැන්වීම.
    2.1. දුරකථන ක්‍රියාකාර සමාගම් මහජන යහපත සලසන්නේද යන්න නිශ්චය කිරීම සහ අපක්ෂපාතී ලෙස හිතකර ක්‍රියාවන්හී නිරතවීම සඳහා තරඟකාරිත්වය පිරික්සීම.
    2.2. ජාල හා සේවා අතර අන්තර් සම්බන්ධතාවය ඇති කිරීමට වග බලා ගැනීම.
    2.3. විවෘත ප්‍රවේශය, අවහිරතා නැති කිරීම සහ විනිවිද පෙනෙන බලපත්‍ර ක්‍රියාවලියක් ඇති කිරීමට හැකි වන පරිදි පොදු නීති රාමුවක් සකස් කිරීම.

3. මිල
පොදු මහජනතාවට දුරකථන ක්‍රියාකාර සමාගම්වල මිල දරාගත හැකිද යන්න බව සැලකිල්ලට ගෙන සාධාරණ මිල සහතික කිරීම.

4. පාරිභෝගික ආරක්ෂාව
මහජනතාව සහ පාරිභෝගිකයන් විසින් ඉදිරිපත් කරන පැමිණිළි පිළිබඳව විමර්ශන පැවැත්වීමේදී සවන් දීමට ඇති කැමැත්ත, සන්නිවේදනය සහ මහජන සහභාගීත්වය දිරිගැන්වීම සහ මහජන සුරක්ෂිතතාවය ඇති කිරීම.

5. සමාජ නියාමනය
    i. විශ්වීය ප්‍රවේශය/සේවා
    ii. ග්‍රාමීය ප්‍රජාව, වැඩිහිටි ජනතාව සහ විවිධ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට විශ්වීය ප්‍රවේශ/සේවා සැපයීමට වග බලා ගැනීම.
    iii. හදිසි අවස්ථාවකදී ක්‍රියා කිරීම සඳහා පූර්ව සූදානමින් සිටීම.
    iv. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට විදුලි සංදේශ සේවා සැපයීම.

6. අඩු පහසුකම් සහ සීමිත සම්පත් නියාමනය කිරීම
    i. වර්ණාවලි කළමණාකරනය (Spectrum Management)
    ii. අංකනය (Numbering)
    iii. නීත්‍යානුකූල අවසරය ලබාදීම (Right of Way)
    iv. අවකාශ පරාස (Space Segment)
    v. අන්තර් සම්බන්ධතාවය (Interconnection)
    vi. ජාත්‍යන්තර සම්බන්ධතා මධ්‍යස්ථාන වලට ප්‍රවේශවීම (Access to International Landing Stations)
    vii. ප්‍රධාන ජාතික ජාල වලට ප්‍රවේශවීම (Access to Backbone)

7. ගුණාත්මක විදුලි සංදේශ සේවා
පාරිභෝගිකයා සෑහීමකට පත්වන ආකාරයෙන් අවශ්‍යතාවයන් සපුරාලන ලෙස සාධාරණ හා දරාගත හැකි පරිදි ඉහළ ගුණාත්මක භාවයකින් යුතුව විදුලි සංදේශ සේවා සැපයීමට වගබලා ගැනීම.

8. යහපාලනය ප්‍රවර්ධනය කිරීම
ස්වාභාවික යුක්තියේ මූලධර්ම පිලිපදිමින් කාලෝචිත තීරණ ලබාදීම, මහජන සහභාගීත්වය දිරිගැන්වීම හා විනිවිද පෙනෙන තීරණ ක්‍රියාවලියක් ඇති කිරීමට වග බලා ගැනීම.

9. සාධාරණ සහ ඒකපාර්ශවීය නොවූ තීරණ ලබාදීමට වග බලා ගැනීම.

10. සිවිල් සමාජය නවීන තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණයෙන් හෙබි දැනුවත් සමාජයක් බවට ගොඩනැංවීමට සහායවීම.

11. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ අදාල ජාත්‍යන්තර සංවිධාන විසින් විදුලි සංදේශ උපකරණ සහ තාක්‍ෂණික ප්‍රමිතීන් සම්බන්ධයෙන් පනවන නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට සියළුම විදුලි සංදේශ ක්‍රියාකරුවන් හා එක්ව කටයුතු කිරීමට වග බලා ගැනීම.

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන්

ඉහත අරමුණු සාක්ෂාත් කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පහත සඳහන් නියාමන කාර්යයන් ඉටු කිරීමෙහිලා නිරත වේ.

**1. බලපත්‍ර සඳහා අයදුම් කිරීමේ පටිපාටිය සහ බලපත්‍ර ප්‍රදානය කිරීම**

1.1. පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රය . පනතේ 17 වන වගන්තියට අනුකූලව කොමිෂන් සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් දෙන ලද බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක නොකළ යුතුය. කෙසේවුවද පනතේ 20 වන වගන්තියේ බලපත්‍ර ආදියෙන් නිදහස් කිරීම සඳහන් කර ඇත.

1.2. පනතේ 22 වන වගන්තිය යටතේ ගුවන් විදුලි සංඛ්‍යාත හා ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණ පාවිච්චි කිරීම සඳහා බලපත්‍රය.
විදුලි සංදේශ පනතේ 22 (1) වගන්තිය ප්‍රකාරව කිසියම් තැනැත්තකු විසින් තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ හැර යම් ගුවන් විදුලි සංඛ්‍යාතයක් හෝ යම් ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයේ යම් කොටසක හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද යම් නැවක හෝ ගුවන් යානයක පාවිච්චි නොකළ යුතුය.

1.3. පනතේ 21 වන වගන්තිය යටතේ වෙළඳ බලපත්‍ර
පනතේ 21 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත්කළ බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් යම් විදුලි සංදේශ උපකරණයක් වෙළඳාමක් වශයෙන් නිශ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, පැවරීම, කුලියට දීම, බදුදීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදු නොකළ යුතුය.

**2. අයක්‍රම නියාමනය කිරීම**

2.1. පනතේ 5 (ඔ) වගන්තියේ නියමයන් ප්‍රකාරව කොමිෂන් සභාවට ඇති බලතල අනුව අමාත්‍යවරයා විමසා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාකරුවන් විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සම්බන්ධයෙන් ක්‍රියාකරුවන්ගේ අවශ්‍යතා සැළකිල්ලට ගනිමින් අයක්‍රම හෝ අයක්‍රම තීරණය කිරීමේ ක්‍රම නිශ්චය කිරීම.

2.2. පනතේ 5(ඕ) ප්‍රකාරව අන්තර්ජාල ගාස්තු අනුමත කිරීම/නිශ්චය කිරීම.

**3. විදුලි සංදේශ පනත (ඒ යටතේ වූ නීති සහ රීති ඇතුලත්ව) සහ බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ගේ බලපත්‍රවල අනුකූලතාවය පිරික්සීම සහ සහතික කිරීම.**

**4. ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නිසි ලෙස පාවිච්චි කිරීමට වගබලා ගැනීම මෙන්ම පිරික්සීම සහ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කළමණාකරනය කිරීම.**

**5. පාරිභෝගික පැමිණිලි සහ විමර්ශන/පරීක්ෂණ පැවැත්වීමට ප්‍රතිචාර දැක්වීම.**

පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරුවකු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා පිළිබඳව විදුලි සංදේශ සේවා දායකයකු හෝ මහජනයා අතුරින් කෙනෙකු හෝ විසින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කරනු ලැබූ විට අවශ්‍යයයි කොමිෂන් සභාව සලකන විමර්ශනයක් කොමිෂන් සභාවට පැවැත්විය හැකි අතර කාරණයට අදාල අවස්ථානුගත කරුණු අනුව ගත යුතු ප්‍රතිකර්ම යෙදීමටද සැලැස්විය යුතුය.

පනතේ 9(2) වගන්තිය අනුව යම් විමර්ශනයක් පැවැත්වීමේදී, පනතේ 9(1) ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ඒ පැමිණිල්ලට හේතු වූ නිමිත්ත හෝ කාරණය නිරවද්‍ය කිරීම සඳහා අවශ්‍යයයි පෙනී යන පරිදි එවැනි ක්‍රියාමාර්ග ගන්නා ලෙස එකී දූරකථන ක්‍රියාකාර සමාගම් වලට නියම කළ හැකි අතර අවශ්‍යයැයි හැඟෙන පරිදි මූල්‍යය වන්දි ගෙවන ලෙසද නියම කළ හැකිය.

**6. විදුලි සංදේශ සේවාවල ගුණාත්මකභාවය සහ විවිධත්වය සම්බන්ධයෙන් මහජනතාවට තොරතුරු සැපයීම සහ මහජන ක්‍රියාවලීන් සහ ප්‍රසිද්ධ විභාග පැවැත්වීමේදී ඔවුන්ගේ සහභාගීත්වය දිරි ගැන්වීම.**

**7. විදුලි සංදේශ ක්ෂේත්‍රයට සම්බන්ධ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ/ජාත්‍යන්තර හා විදේශීය ආයතනවල කටයුතු වලදී ශ්‍රී ලංකා රජය නියෝජනය කිරීම.**

**8. කොමිෂන් සභාව විසින් නියෝග, උපදෙස් හා තීරණ නිකුත් කිරීම.**

ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව නියෝග, උපදෙස් සහ තීරණ නිකුත් කිරීම සම්බන්ධයෙන් විනිවිද පෙනෙන ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. ප්‍රසිද්ධ විභාග සහ සෙසු සමුළු වලට සහභාගීවන සහ ඒවා නියෝජනය කරන විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ක්‍රියාකරුවන්ට, පාරිභෝගිකයින්ට සහ වෙනත් ඒ සම්බන්ධ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට වැඩි අවස්ථාවක් ලබා දෙනු ලැබේ.

**9. විදුලි සංදේශ උපකරණ සහ මාදිලි අනුමැතිය සඳහා තාක්ෂණික ප්‍රමිතීන් සඳහන් කිරීම.**

## අන්තර් අංශ සහයෝගීත්වය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන් අංශ රැසක් විසින් ඉටු කරන ලදී. 2017 වසරේ කොමිෂන් සභාවේ අදාල අංශවල ප්‍රධාන කාර්යයන් සහ කාර්ය සාධනය මතු පරිච්ඡේදවල දැක්වේ. ඇතැම් ක්‍රියාකාරකම් කිසියම් අංශයක් යටතේ සඳහන් කර ඇතත් එම ක්‍රියාකාරකම් අදාල අංශය මගින් ඉටු කරනු ලැබ ඇත්තේ අනෙකුත් අංශවල සහාය ඇතිව බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

# 02 පරිච්ඡේදය

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ විධායක නිලධාරීන්

**කොමිෂන් සභාව**

| | | |
|---|---|---|
| ඔස්ටින් ප්‍රනාන්දු මහතා | - | සභාපති |
| එම්. කිංස්ලි ප්‍රනාන්දු මහතා | - | අධ්‍යක්ෂ ජනරාල්, සාමාජික 2017 සැප්තැම්බර් 12 දක්වා |
| පී.ආර්.එස්.පී.ජයතිලක මහතා | - | අධ්‍යක්ෂ ජනරාල්, සාමාජික 2017 සැප්තැම්බර් 13 සිට |
| ලලිත් සේනානායක මහතා | - | සාමාජික |
| බණ්ඩාර දිසානායක මහතා | - | සාමාජික |
| හේමන්ත වර්ණකුලසූරිය මහතා | - | සාමාජික |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විධායක නිලධාරීන්**

| | | |
|---|---|---|
| එම්.කිංස්ලි ප්‍රනාන්දු මහතා | - | අධ්‍යක්ෂ ජනරාල්, 2017 සැප්තැම්බර් 12 දක්වා |
| පී.ආර්.එස්.පී. ජයතිලක මහතා | - | අධ්‍යක්ෂ ජනරාල්, 2017 සැප්තැම්බර් 13 සිට |

**කොමිෂන් සභා කාර්යාලය**

| | | |
|---|---|---|
| ආර්.එස්.ගුණරත්න මහත්මිය | - | වැඩබලන කොමිෂන් සභා ලේකම් |

**පාලන සහ ආයතනික කටයුතු, මූල්‍ය සහ නීති කටයුතු**

| | | |
|---|---|---|
| පී.ආර්.එස්.පී. ජයතිලක මහතා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, පාලන සහ ආයතනික කටයුතු |

**පාලන සහ ආයතනික කටයුතු අංශය**

| | | |
|---|---|---|
| ඩබ්ලිව්.එම්.පී.පී.වීරසිංහ මහතා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| වී.ඒ.එන්. ප්‍රේමරත්න මහතා | - | සහකාර අධ්‍යක්ෂ |

**මූල්‍ය අංශය**

| | | |
|---|---|---|
| එම්.කේ.ජයන්ත මහතා | - | අධ්‍යක්ෂ |
| ඒ.එස්.හපුආරච්චි මහතා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |

**අනුකූලතා අංශය**

| | | |
|---|---|---|
| ආර්.එම්.ටී.කේ.පී.ලිවේරා මහත්මිය | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| එච්.පී.එච්.එම්.පතිරණ මහත්මිය | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |

**තරඟකාරිත්ව අංශය**

| | | |
|---|---|---|
| එච්.ඩබ්.කේ.ඉන්ද්‍රජිත් මහතා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| එච්.එම්.ශ්‍රියානි මහත්මිය | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| සී.එන්. පළිහවඩන මහතා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |

**නීති අංශය**

| | | |
|---|---|---|
| ජී.සී.පී.මොරගොඩ මහත්මිය | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| ආර්.එස්.ගුණරත්න මහත්මිය | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| එල්.එස්.පී.රුද්‍රිගු මෙනවිය | - | සහකාර අධ්‍යක්ෂ |
| අයි.එන්.මැතිව් මහතා | - | සහකාර අධ්‍යක්ෂ |

**වර්ණාවලි කළමණාකරන අංශය**

| | | |
|---|---|---|
| ඊ.එන්.පී.කේ.රත්නපාල මහතා | - | වැඩබලන අධ්‍යක්ෂ |
| එම්.සී.එම්. ෆාරුක් මහතා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| එල්.ගනේෂ්මූර්ති මහතා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| ජේ.ඒ.එස්.ගුණානන්දන මහතා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| එස්.ඒ.ආර්.කමලනයනා මහත්මිය | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| එම්.පී.ගුණසිංහ මහතා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |

**ජාල අංශය**

| | | |
|---|---|---|
| ආර්.ජී.එච්.කේ.රණතුංග මහතා | - | අධ්‍යක්ෂ |
| කේ.එස්.එම්. විශාකා මෙනවිය | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| එස්.ඊ.වාකිෂ්ට මහතා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| අයි.එම්.ජවුසි මහතා | - | සහකාර අධ්‍යක්ෂ |

**ප්‍රතිපත්ති, ජාත්‍යන්තර සම්බන්ධතා අංශය**

| | | |
|---|---|---|
| එම්.කේ.ජයසේකර මහතා | - | අධ්‍යක්ෂ |
| ආර්.එම්.ජේ.කේ.බී.රත්නායක මහතා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ |

**බලපත්‍ර පරිපාලන අංශය**

| | | |
|---|---|---|
| එච්.පී.කරුණාරත්න මහතා | - | අධ්‍යක්ෂ (2016 අගෝස්තු 16 දින සිට) |

**විශේෂ ව්‍යාපෘති අංශය**

| | | |
|---|---|---|
| ජේ.ඒ.එස්.ගුනානන්දන මහතා | - | වැඩබලන අධ්‍යක්ෂ |

**අභ්‍යන්තර විගණන අංශය**

| | | |
|---|---|---|
| යූ.ඒ.සමරතුංග මහත්මිය | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |



# 03 පරිච්ඡේදය

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2017 වර්ෂයේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන පනත ප්‍රකාරව රජයේ විදුලි සංදේශ නියාමන කටයුතු උදෙසා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) ස්ථාපනය කරන ලදි. අනිවාර්ය නියාමන කරුණු වලට අමතරව, කොමිෂන් සභාව ලොව ශීඝ්‍රයෙන් වැඩිදියුණු වන නවීන තාක්ෂණය සමඟ සම්බන්ධතාවය පවත්වා ගැනීමට සහ විදුලි සංදේශ ක්ෂේත්‍රය සඳහා වැඩි ප්‍රතිලාභ ලබා ගැනීම පිණිස ජාත්‍යන්තර විදුලි සංදේශ සංගම් සමඟ සාර්ථක සහ ඵලදායී සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම පිණිස වග කියනු ලැබේ. ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් සම්බන්ධයෙන්, මෙරටේ පාරිභෝගිකයින් සහ පොදු මහජනතාව සඳහා දරාගතහැකි මිල මට්ටමක් ලබා දෙමින් වැඩි යටිතල පහසුකම් වලින් සමන්විත ව්‍යාපාර හිතකර පරිසරයක් නිර්මාණය කිරීම පිණිස ප්‍රතිපත්ති සම්පාදනය කරයි.

2017 පෙර වර්ෂයේදී, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මෙරටේ විදුලි සංදේශ පාරිභෝගිකයන් සහ පෞද්ගලික දුරකථන ක්‍රියාකාර සමාගම් වලට මෙන්ම රටට ප්‍රතිලාභ රැගෙන එන ඵලදායී වැඩසටහන් රැසක නිරත වී ඇත. මෙම තාක්ෂණය සඳහා පවත්නා ඉහළ ඉල්ලුම නිසා 2017 වසරේදී 13XX සහ 19XX පරාසවල කෙටි සංකේත අංක වෙන් කරන ලද අතර රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන විසින් මෙම තාක්ෂණය භාවිතා කරමින් සිටී.

ජංගම සහ ස්ථාවර ප්‍රවේශ පාරිභෝගිකයන් සඳහා වඩා ප්‍රශස්ත සේවාවක් සැපයීම පිණිස 2017 වසරේදීද දුරකථන කුලුනු ඉදිකිරීම අඛණ්ඩව සිදු කරන ලද අතර 2017 වසරේදී ඉදිකරනලද නව කුලුනු 49 සමඟ මුළු කුලුනු සංඛ්‍යාව 6776 ක් විය. කුලුනු ඉදිකිරීම සම්බන්ධයෙන් මහජනතාව වෙතින් ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් කොමිෂන් සභාව අවධානය යොමු කරනු ලබන අතර කුලුනු ඉදිකිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරන අතරතුර එම පැමිණිලි සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග ගනු ලැබේ.

කොමිෂන් සභාව විසින් හඳුන්වාදුන් පටිපාටිය ප්‍රකාරව, දෝෂ රහිත විදුලි සංදේශ සේවාවක් පවත්වාගෙන යාම පිණිස ආනයනකරුවන්ට උපකරණ සඳහා මාදිලි අනුමැතිය සපයා ඇත. 2017 වර්ෂයේ මාදිලි අනුමැතිය පිළිබඳ සංඛ්‍යාලේඛන පහත වගුවේ දැක්වේ.

***වගුව 01: 2017 දී නිකුත් කරල ලද උපකරණ නිෂ්කාශනය සහ මාදිලි අනුමැතිය***

| විස්තරය | 2017 දී නිකුත් කරන ලද ලියකියවිලි සංඛ්‍යාව |
|---|---|
| උපකරණ නිෂ්කාශනය කිරීම් | 3475 |
| මාදිලි අනුමැතිය | 38 |

විදුලි සංදේශ ව්‍යාපාර ආශ්‍රිත ජංගම හා ස්ථාවර දුරකථන සහ උපකරණ වෙළෙඳාම වඩා ප්‍රචලිතවීම නිසා, 2017 වර්ෂයේදී අනුමැතිය සහ අයදුම්පත් සම්බන්ධ කටයුතු සිදු කිරීම පිණිස වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ලැබිණි. එමෙන්ම මෙම අංශය විසින් මේ සම්බන්ධයෙන් නව පටිපාටියක් හඳුන්වා දෙනු ලැබුණු අතර 2017 වර්ෂයේදී නව වෙළඳ බලපත්‍ර රැසක් නිකුත් කර ඇත. වැඩිදුරටත් මෙම අංශය විසින් කුලුනු ආශ්‍රිත විමර්ශන කටයුතු, ආනයන නිෂ්කාශන ලිපි නිකුත් කිරීම, කුලුනු ඉදිකිරීමේ කටයුතුවල නිරත වන අතරම පෞද්ගලික නිෂ්කාශන ලිපි සම්බන්ධයෙන්ද කටයුතු කර ඇත.

ගුවන් විදුලි සංඛ්‍යාත නිකුත් කිරීම සහ පාලනය කිරීම සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශය විසින් මෙහෙයවන අතර මෙම අංශය විසින් අවහිරතාවයන් වලක්වාලීම පිණිස උපකරණවල ප්‍රමිතිය පිළිබඳ අවශ්‍යතාවයන් සහ අනුකූලතාවය දැඩිව සහතික කරයි. 2017 වසරේදී ඇතැම් සේවා වර්ගීකරණයන්ට සංඛ්‍යාත බලපත්‍ර නිකුත් කිරීම වැඩිදියුණු වී ඇති අතර පහත වගුවේ විස්තර දැක්වේ.

***වගුව 02: 2017 වර්ෂයේදී සංඛ්‍යාත වර්ණාවලි පරිහරණය කරන්නන් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව***

| සේවාවේ වර්ගය | බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|
| | 2017 |
| *ස්ථාවර සේවා* | 153 |
| *විකාශන සේවා ( රූපවාහිනී සහ ගුවන් විදුලි)* | 66 |
| *ට්‍රන්කින් / පේජින්/ සිටිසන් බෑන්ඩ්* | 7 |
| *දත්ත / ගුවන් විදුලි ටෙලිමෙට්‍රි සේවා* | 49/39 |
| *ගුවන් සහ සමුද්‍ර සේවා* | |
| *(i) ගුවන් යානා මධ්‍යස්ථාන* | 74 |
| *(ii) නැව් මධ්‍යස්ථාන* | 91 |
| *(iii) සමුද්‍රීය ජංගම* | 1872 |
| *(iv) ගුවන් ජංගම සේවා* | 10 |
| *පෞද්ගලික ජංගම ගුවන් විදුලි සේවා* | 272 |
| *ආධුනික ගුවන් විදුලි* | 65 |

විදුලි සංදේශ වෙළඳපලේ ඉහළ ප්‍රවණතාවය නිසා, 2017 දී නිකුත් කරන ලද නිෂ්කාශන වාර්තා සම්බන්ධයෙන් ඇතැම් වර්ගවල වර්ධනයක් දක්නට ලැබිණි. වැඩිදියුණු වූ සේවා වර්ග පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

***වගුව 03: 2017 දී නිකුත් කරන ලද නිෂ්කාශන ලිපි සංඛ්‍යාව***

| සේවාවේ වර්ගය | නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව |
|---|---|
| | 2017 |
| *සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ ඇතුළු ස්ථාවර සේවා* | 649 |
| *විකාශන සේවා (රූපවාහිනී සහ ගුවන් විදුලි)* | 76 |
| *සෙලියුලර් ජංගම සේවා* | |
| *(i) බෙදාහැරීමේ බලපත්‍ර* | 7325 |
| *(ii) ජංගම ක්‍රියාකාර සමාගම්* | 1130 |
| *(iii) පෞද්ගලික ජංගම ගුවන් විදුලි* | 645 |
| *දත්ත සේවා / ගුවන් විදුලි ටෙලිමෙට්‍රි* | 152/39 |
| *චන්ද්‍රිකා සේවා* | 513 |
| *ආධුනික ගුවන් විදුලි* | 15 |
| *අඩු බල උපකරණ* | 2188 |

අවහිරතා අනාවරණය කර ගැනීම සහ අවම කිරීම බෙහෙවින් දුෂ්කර කටයුත්තක් වන බැවින් කොළඹ, කදිරාන සහ මහනුවර පවත්නා මෙහෙයුම් පද්ධති වලට අමතරව යාපනය, මඩකලපුව, මාතර, පුත්තලම, මන්නාරම, අනුරාධපුරය, ත්‍රිකුණාමලය සහ නුවරඑළිය ප්‍රදේශවල පිරික්සුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමට පියවර ගෙන ඇත.

ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ කර්මාන්තය නියාමනය කිරීමේදී නීති අංශය විසින් නීතිමය උපදෙස් ලබා දෙයි. කොමිෂන් සභාව පාර්ශවයක් වූ විවිධ නීතිමය නඩු 2017 වර්ෂයේදී කොමිෂන් සභාව මෙහෙයවන ලදී. නීති අංශය විසින් නඩු රැසක් සහ අධිකරණ නියෝග 1028 ක් මෙහෙයවන ලදී. වර්තමාන විදුලි සංදේශ පනතේ නව සංශෝධන සිදු කිරීමේ ක්‍රියාවලියේ නිරත වන අතර, කොමිෂන් සභාවේ බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙහිලා නීති, රීති යනාදී පටිපාටි ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇති අතර පනත උල්ලංඝනය කරන්නන්ට එරෙහිව ක්‍රියා කර ඇත.

පාරිභෝගික සම්බන්ධතා අංශය වඩා ප්‍රශස්ත විදුලි සංදේශ සේවාවක් සැපයීමේදී සමස්ථයක් වශයෙන් විදුලි සංදේශ ප්‍රජාවගේ, දුරකථන ක්‍රියාකාර සමාගම්වල සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ යහපත උදෙසා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. මෙයාකාරයෙන්, මෙම අංශය අවශ්‍ය වන්නේ නම් මූල්‍ය අලාභ වලට හිමිකම් ලබා ගැනීම පිණිස සහන ලැබිය යුතු පාර්ශවයට ඉඩසලසමින් අවිධිමත් සේවා කරුණු සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ පැමිණිලි සඳහා කටයුතු කර ඇත. මෙම අංශය විසින් පොලීසියේ සහාය ඇතිව අස්ථානගතවූ දුරකථන සොයා දීමට කටයුතු කර ඇති අතර, 2017 වසර අවසාන වන විට, ආසන්න වශයෙන් අස්ථානගතවූ දුරකථන සම්බන්ධ පැමිණිලි 165,000 සම්බන්ධයෙන් කටයුතු කිරීමට භාරගෙන ඇත.

දුරකථන භාවිතය සහ දුරකථන ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් මෙරටේ පොදු මහජනතාව දැනුවත් විය යුතු බව කොමිෂන් සභාව දැඩිව විශ්වාස කරන අතර එබැවින් කොමිෂන් සභාව ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් වැනි ප්‍රජාව සමඟ සෘජුව සම්බන්ධ වන පහළ පරිපාලනමය ඒකකවල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් පවත්වා ඇත. එමෙන්ම පොලීසියේ අදාල අංශවල පොලිස් නිලධාරීන් 2017 වසරේ පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් වලට සහභාගී වී ඇත. පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්, පුවත්පත් ලිපි, පත්‍රිකා බෙදාහැරීම, සහ රූපවාහිනී/ ගුවන් විදුලි විකාශන වැඩසටහන් 2017 දී පවත්වන ලද වෙනත් වැඩසටහන් වේ.

නිසි නියාමන ක්‍රියාමාර්ගවල බලාත්මකභාවය ස්ථාපනය කරමින්, විදුලි සංදේශ ක්ෂේත්‍රය සඳහා අඛණ්ඩ ආවේක්ෂණය සහතික කිරීම පිණිස, අනුකූලතා අංශය මෙරට මහජනතාව සඳහා සාධාරණ, කාර්යක්ෂම සහ ගුණාත්මක සන්නිවේදන සේවාවක් සැපයීම පිණිස කටයුතු කරයි. මේ වන විට මෙම අංශය සේවා තත්ත්ව (QOS), ආවේක්ෂණ (Surveillance) සහ අධිවේගී අන්තර්ජාල සේවා (Braodband) යන ඒකක තුනෙන් සමන්විත වේ. මෙම ඒකක සඳහා කොමිෂන් සභාව හඳුනාගත් ප්‍රධාන රාජකාරි ඉටු කිරීමට

පවරා ඇත. මෙම අංශය විසින් පිළිගත් සේවා තත්ත්ව ක්‍රමවේදයක් මගින් පොදු ස්විචීකරණ දුරකථන ජාල ක්‍රියාකරුවන්ගේ නියමිත පරාමිතීන් පරීක්ෂා කරන අතර 2017 වසරේදීද අවශ්‍ය අවස්ථා වලදී මේ සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන ඇත.

කොමිෂන් සභාවේ ආවේක්ෂණ අංශය විසින් බලපත්‍ර වලට අනුකූලව කටයුතු කිරීම පිරික්සීම, අනුමත නොකරන ලද අයක්‍රම පිළිබඳව පාලන ක්‍රියාමාර්ග වලට අනුගතවීම සහ මාදිලි අනුමැතිය නොලත් උපකරණ සහ අවසර නොලත් විදුලි සංදේශ උපකරණ වෙළෙන්දන් පිළිබඳව විමර්ශනය කිරීම සහ නියාමන කරුණු යනාදිය පිළිබඳ නීති සකස් කිරීම සිදු කරයි. 2017 වසරේ ප්‍රගතිය සැලකිල්ලට ගැනීමේදී මෙම අංශය විසින් නීති විරෝධී ලෙස ඇමතුම් අවසන් කිරීම් 803, මාදිලි අනුමැතිය නොලත් විකුණුම් අවස්ථා 36, අනුමත නොකරන ලද අයක්‍රම සම්බන්ධ අවස්ථා 13 ක් පවතී.

අධිවේගී අන්තර්ජාල සේවා ඒකකය අධිවේගී අන්තර්ජාල සේවා කරුණු, විශේෂයෙන් පාරිභෝගිකයන් සඳහා අන්තර්ජාල සේවාවල ගුණාත්මකභාවය සහ අනෙක් අතට දුරකථන ක්‍රියාකාර සමාගම් වලට ඔවුන්ගේ වෙළෙඳපොල තරඟකාරිත්වය පිළිබඳව තොරතුරු ලබාදෙන අන්තර්ජාල වේගය මැනීම පිළිබඳව සම්පූර්ණයෙන් වගකියනු ලැබේ. මේ වන විට “My Speed” සහ “Net Speed” නමින් මොරටුව විශ්ව විද්‍යාලය විසින් නිර්මාණය කරන ලද විශේෂ අන්තර්ජාල සේවාවල වේගය මැනීම පිණිස උපකරණ දෙකක් පවතී. “My Speed” පාරිභෝගිකයා විසින්ද “Net Speed” ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින්ද භාවිතා කරනු ලැබේ. අවසාන පරිහරණය කරන්නෙකුට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය වන වේග පරීක්ෂණ අයිකනය ක්ලික් කිරීමෙන් හෝ URL (Uniform Resource Locator) වේග පරීක්ෂණ භාවිතයට ඍජුව ප්‍රවේශ වීමෙන් ඕනෑම web browser එකක් මගින් “Net Speed” වෙත ප්‍රවේශ විය හැකිය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනුකූලතා අංශය මගින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ඔවුන්ගේ ව්‍යාපාර සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම සවිබල ගැන්වීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණින් “අඩු මට්ටමේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම සහිත” කණ්ඩායම් සඳහා සකස් කරන ලද පුහුණු වැඩසටහන්, ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කුඩා පරිමාණ සංවර්ධන ඒකකයේ සහයෝගීත්වය ඇතිව තායිලන්තය සහ මැලේසියාවේ අත්දැකීම් අනුව තිරසාර සංවර්ධනය කඩිනම් කිරීම පිණිස කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට මං සලසන විසඳුම් භාවිතාවන් සහිත දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ ක්‍රියාමාර්ග වලට මුලපුරා ඇත. කුඩා හා මධ්‍යය පරිමාණ ව්‍යවසායකයින්ට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම පාදක කරගත් ව්‍යාපාර මගින් තරඟකාරිත්වය හා සටන් කිරීමටත් ව්‍යාපාර වැඩිදියුණු කිරීමටත් හැකියාව ලබා දේ.

විදුලි සංදේශනය පිළිබඳ ජාත්‍යන්තර ආයතන විසින් සිය සාමාජික රටවල් සඳහා නව විදුලි සංදේශ තාක්ෂණය, නියාමන කරුණු සහ පිළිගත යුතු අවශ්‍ය නව ප්‍රතිපත්ති සම්පාදනය කිරීමෙහිලා විදුලි සංදේශ

ක්ෂේත්‍රය ආශ්‍රිත පහසුකම් සැපයීම පිණිස වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. 2017 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්තිමය කරුණු, පුහුණු ක්‍රියාකාරකම්, සම්මන්ත්‍රණ සහ නියාමන කරුණු වලට අදාල ප්‍රශස්ත ක්‍රියාකාරකම් රැසක කටයුතුවල නිරත වී ඇත.

සමාලෝචන වර්ෂය තුළදී, මෙම අංශය විසින් පහත විස්තර කර ඇති පුහුණු වැඩසටහන්, වැඩසටහන්, සමීක්ෂණ සහ වෙනත් වැදගත් කරුණු ඇතුළු ඵලදායී වැඩසටහන් රැසක නිරත වී ඇත.

- මැයි 17 දින ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය සැමරීම .
- 2017 සැප්තැම්බර් 12 - 15 දක්වා පවත්වන ලද ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන
- 2017 දෙසැම්බර් 11 සිට 15 දක්වා පවත්වන ලද ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය, ආහාර හා කෘෂිකාර්මික සංවිධානය - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව "ඊ - කෘෂිකර්මාන්තය සඳහා නවෝත්පාදන සහ භාවිතය සංවර්ධනය" පිළිබඳ පුහුණු වැඩසටහන
- 2017 ජූලි 7 සිට අගෝස්තු 16 දක්වා පවත්වන ලද ජාත්‍යන්තර තොරතුරු තාක්ෂණ ස්වේච්ඡාදායකයින්ගේ (IIV) වැඩසටහන
- 2017 ජූලි 24 සිට 26 දක්වා පවත්වන ලද ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ "17 වෙනි නියාමන ප්‍රතිපත්ති සමුළුව" (PRF -17)
- 2017 ජූලි 27 දින පවත්වන ලද 2018-2020 සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශනයේ "උපායමාර්ගික සැලසුම් පිළිබඳ අනුරූපී කණ්ඩායම" දෙවන රැස්වීම
- 2017 නොවැම්බර් 6 සිට 10 දක්වා පවත්වන ලද ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් සඳහා IPV4/IPV6 Routing පිළිබඳ දේශීය පුහුණු පාඨමාලාව
- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලෝක විදුලි සංදේශනය/ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ දර්ශක ප්‍රශ්නාවලිය පිළිබඳ සමීක්ෂණය

ජාත්‍යන්තර සංවිධාන සමඟ පවත්නා අඛණ්ඩ සාමාජිකත්වය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට වැදගත් වන්නේ ඔවුන් පුහුණු වැඩසටහන් සපයමින් නියාමන කරුණු වැඩිදියුණු කිරීමට සහායවීම මෙන්ම නවීන වැඩිදියුණු වෙමින් පවතින විදුලි සංදේශ තාක්ෂණය සම්බන්ධයෙන් ඉමහත් සහායක් දක්වන බැවිනි. අනුරූපී කාලපරිච්ඡේදය තුළ හිඟ සාමාජික මුදල් සහ දායක මුදල් පහත දැක්වේ.

*වගුව 04: 2017 වර්ෂය තුළ යෙදවූ සාමාජික සහ දායක මුදල්*

| ආයතනය | වටිනාකම(ශ්‍රී ලංකා රුපියල්) | ගෙවන ලද දිනය |
|---|---|---|
| ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය | 24,727,919.20 | 2017 මාර්තු |
| ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය | 23, 70,834.86 | 2017 මාර්තු |
| පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය | 5,000,835.94 | 2017 අප්‍රියෙල් |
| දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය-EBC AP VI | 2,315,429.50 | 2017 අප්‍රියෙල් |

2017 වර්ෂයේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විශේෂ ව්‍යාපෘති අංශයේ ප්‍රධාන අවධානය යොමු වූයේ කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය, හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතිය, කොළඹ ප්‍රධාන කාර්යාලය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සහ කදිරාන ප්‍රතිසංස්කරණය කිරීම සහ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහාය. නෙළුම් කුලුන ඉදිකිරීමේ ව්‍යාපෘතිය තුලින් රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශනය සලසන අතර ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ සහ ජාල හුවමාරු කිරීමේදී විදුලි

සංදේශනය පිළිබඳ කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කරයි. මෙම ප්‍රධාන අරමුණු වලට අමතරව, ඉහල උන්නතාංශයකින් යුතු නැරඹුම් මැදිරි, අවන්හල්, සහ සාප්පු සංකීර්ණ මෙම ව්‍යාපෘතිය තුලින් අත්කර ගත හැකි ප්‍රතිලාභ වේ.

මේ වන විට කොමිෂන් සභාව රාජ්‍ය / පෞද්ගලික හවුල්කාරිත්ව පදනමක් මත හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතිය භාරදීමට පාර්ශවයක් සෙවීමේ කටයුතුවල නිරත වන අතර බදු පදනම මත වසර දහයක කාලයක් සඳහා සීමාසහිත Toppan Forms (Colombo) සමාගම වෙතින් යෝජනාවලියක් ලැබිණි.

කොළඹ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පුළුල් කිරීමේ ව්‍යාපෘතිය, පාරිභෝගිකයින්ගේ සහ දුරකථන ක්‍රියාකාර සමාගම් සඳහා ප්‍රශස්තව හා කාර්යක්ෂමව පහසුකම් සැපයීම, කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම, සම්මන්ත්‍රණ සහ රැස්වීම් පැවැත්වීම පිණිස අවශ්‍ය ඉඩකඩ සැපයීම පිණිස 2017 වර්ෂයේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලද තවත් එක් ව්‍යාපෘතියකි. 2018 වර්ෂය අවසාන වන විට එම පුළුල් කිරීමේ වැඩකටයුතු අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය UHF/VHF සහ HF සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලියාපදිංචියලත් කලාපීය පිරික්සුම් මධ්‍යස්ථානයකි. අධි සංඛ්‍යාත දිශාව නිශ්චය කිරීමේ (HFDF) පද්ධතිය ප්‍රතිස්ථාපනය කරන ලද්දේ දේශීය හා ජාත්‍යන්තර වැදගත්කමින් යුතු කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් වඩා ප්‍රශස්ත ආකාරයෙන් මෙහෙයුම් කටයුතු සිදු කිරීම පිණිසය. කදිරාන පිරික්සුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සහ ඒ ආශ්‍රිත පහසුකම්වල වර්තමාන තත්ත්වය සැලකිල්ලට ගනිමින් එය නවීකරණය කිරීම මෙන්ම අළුත්වැඩියා කිරීම අවශ්‍ය විය. මේ ආකාරයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ඉල්ලීම මත මොරටුව විශ්ව විද්‍යාලය රු. 186,968,098/= වටිනාකමකින් යුතු ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇත.

සංවර්ධනය නොකරන ලද ඉඩම් වලට යාබදව සහ අවටින් කොළඹ විනෝදාස්වාදය සපයන උද්‍යානය ස්ථාපනය කිරීමට කටයුතු කිරීම පාර්ශවකරුවන්ට දිගු කාලීන පදනම මත නෙළුම් කුලුන සංකීර්ණයේ අගය වැඩි කිරීමට හේතු විය. නෙළුම් කුලුන සංකීර්ණය ඉදිරි වසර 25 තුළ වඩා ආකර්ශනීය ස්ථානයක් බවට පත් වනු ඇති බැවින්, මෙම විනෝදාස්වාදය සපයන උද්‍යානය තුළ, විනෝදාස්වාදය සපයන ක්‍රියාකාරකම් සහිතව බහුකාර්ය වාහන රථගාලක් ඉදිකිරීමට අපේක්ෂිතය. ඉඩම අත්පත් කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් දැනටමත් අනුමැතිය ලබා දී ඇති අතර, නාගරික සංවර්ධන අධිකාරිය මේ සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටී.

සේවා සැපයුම්කරුවන්ගේ යහපත ආරක්ෂා කරමින් පාරිභෝගිකයින් සඳහා වඩා ප්‍රශස්තවූ විදුලි සංදේශ සේවාවක් සැපයීමේ අරමුණින්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තරඟකාරිත්ව අංශය කොමිෂන් සභාව තුළ ප්‍රධාන කාර්යයක් ඉටු කරයි. මෙම අංශය පාරිභෝගිකයන් සම්බන්ධයෙන් දරාගත හැකි මිල මට්ටම, සේවා තත්ත්වය සහ සේවාව සැපයීමේ කාර්යක්ෂමතාවය සහතික කරයි. දුරකථන ක්‍රියාකාර සමාගම් සඳහා කොමිෂන් සභාව සාධාරණ තරඟකාරිත්වයකින් යුතු මිල අඩු ගුණාත්මක සේවාවක් නිසැක කරයි. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස, මෙම අංශය අයකුම නියාමනය කිරීම, අන්තර්ජාල සේවා පිරික්සීම, කර්මාන්ත තොරතුරු ප්‍රසිද්ධ කිරීම, දුරකථන ක්‍රියාකාර සමාගම්වල කාර්යසාධනය විශ්ලේෂණය කිරීම සහ සෙස් ඇතුලු විදුලි සංදේශ අයබදු රැස් කිරීමේ කටයුතු වල නිරත වී ඇත. ජාල සහ විදුලි සංදේශනය ආශ්‍රිත වෙනත් වැදගත් ක්ෂේත්‍රයන් වැඩිදියුණු කිරීම පිණිස මෙරටට ගෙන්වා ගැනීමට තොරතුරු තාක්ෂණ සහ විදුලි සංදේශනය පිළිබඳ විදේශීය ප්‍රවීනයන් දිරිගන්වන අතර මෙම අංශය විසින් එහි වීසා සම්බන්ධ කටයුතු සිදු කරයි.

ස්ථාවර ප්‍රවේශ දුරකථන සම්බන්ධයෙන් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය **(ARPU)** සියයට 6 කින් වර්ධනය වූ අතර, ජංගම දුරකථනවල සියයට 5 කින් අඩුවිය. එමෙන්ම පහත වගුවේ දක්වා ඇති පරිදි බදු වලින් පසු ශුද්ධ ලාභයේ ඊට සමාන ප්‍රතිඵලයක් පෙන්නුම් කර ඇත.

***වගුව 05: 2016-2017 කාලපරිච්ඡේදය සඳහා ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය (ARPU)***

| වර්ගය | 2016 | 2017 |
|---|---|---|
| ජංගම | 5,258 | 4,977 |
| ස්ථාවර ප්‍රවේශ | 21,691 | 22,911 |

ජංගම දුරකථන සඳහා විදුලි සංදේශ ක්ෂේත්‍රයේ කළ ආයෝජනය රුපියල් මිලියන 36,119 ක් වූ අතර, ස්ථාවර ප්‍රවේශ සඳහා කළ ආයෝජනය රුපියල් මිලියන 32,035 කි. පසුගිය වර්ෂය හා සන්සන්දනය කිරීමේදී ජංගම දුරකථන අංශයේ පමණක් ආයෝජනය ඉහල ගොස් ඇත.

2011 වසරේදී හඳුන්වාදුන් සියයට 20 විදුලි සංදේශ බද්ද 2014 දී සියයට 25 කින් ඉහල ගොස් ඇති අතර අන්තර්ජාල සඳහා වූ සියයට 10 සහනදායී විදුලි සංදේශ බද්ද 2017 වසරේදී අවලංගු කර ඇත. එබැවින් වගුවේ දක්වා ඇති පරිදි 2017 වසරේදී බදු රැස්කිරීමේ මඳ අඩුවීමක් පෙන්නුම් කරයි.

2017 වසර සඳහා සෙස් රැස් කිරීම මිලියන 4,209 ක්වූ අතර පසුගිය වසර 5 තුළ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කර ඇත.

වර්තමානයේදී WhatsApp Messenger, Viber, සහ Skype වැනි ( විදුලි සංදේශ සේවා සැපයුම්කාර සමාගම් විසින් අන්තර්ජාල සම්මුති ජාලයක් ඔස්සේ සේවා සැපයීම - OTT) සේවා මහජනතාව අතර වඩාත් ප්‍රචලිතව ඇත්තේ එම සේවාවන්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි බැවිනි. එබැවින් 2017 වර්ෂයේදී

international Voice traffic භාවිතය බෙහෙවින් පහල ගොස් ඇති අතර පහත වගුවේ දක්වා ඇති පරිදි විදුලි සංදේශ සංවර්ධන ගාස්තු බදු රැස්කිරීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. මෙම ප්‍රවණතාවය පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු (OLAC) වලද දක්නට ලැබුණු අතර එය පහත වගුවේ සංඛ්‍යා ලේඛන වලින් පිළිබිඹු වේ.

*වගුව **06:** විදුලි සංදේශ බදු , සෙස් , විදුලි සංදේශ සංවර්ධන ගාස්තු බදු සහ පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු බදු **2016-2017** (රුපියල් මිලියන)*

| වර්ෂය | 2016 | 2017 |
|---|---|---|
| විදුලි සංදේශ බදු | 30,346 | 29,133 |
| මුළු සෙස් | 4,067 | 4,212 |
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තු රැස් කිරීම් (රුපියල් මිලියන) | 8,690 | 6,218 |
| පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු රැස් කිරීම් (රුපියල් මිලියන) | 1,128 | 730 |

විදුලි සංදේශ අයක්‍රම සැලැස්ම අනුමත කිරීමේ අධිකාරිත්වය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට හිමිවන අතර, 2017 වසරේදී කොමිෂන් සභාව විසින් දිගු කාලීන පදනම මත සැලසුම් 3 ක් සහ ප්‍රවර්ධන මත සැලසුම් 18 ක් සඳහා අනුමැතිය ලබා දී ඇත. ප්‍රවර්ධන පාදක සැලසුම් මගින් මූලික වශයෙන් වෙළඳපල තත්ත්වය පරීක්ෂා කිරීමට අදහස් කරන අතර එය නිම කිරීමට ගත වන කාලය මාස තුනක් පමණි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 2017 වසරේදී පොලොන්නරුව සහ කළුතර දිස්ත්‍රික්කවල නොදියුණු සහ ඌන සංවර්ධිත ප්‍රදේශවල විදුලි සංදේශ පහසුකම් ව්‍යාප්ත කිරීම පිණිස "ගමට සන්නිවේදනය" නමින් සමීක්ෂණයක් කරන ලදී. එම සමීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන්, කොමිෂන් සභාවට එම දිස්ත්‍රික්ක දෙකේ විදුලි සංදේශ පහසුකම් වැඩිදියුණු කිරීම පිණිස ව්‍යාපෘතියක් හඳුන්වා දෙන ලදී.

එමෙන්ම විදුලි සංදේශ අපද්‍රව්‍ය කළමණාකරනය පරිසරයට බලපාන ප්‍රධාන ගැටළුවක් වී ඇති බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලදී. මෙම උපද්‍රවය තුරන් කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සියළුම දූරකථන ක්‍රියාකාර සමාගම් වලට සිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානවල අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ බඳුන් තබන ලෙස ඉල්ලා සිටින ලද අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සිය ප්‍රධාන කාර්යාලයේ අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ බඳුන් තබන ලදී. වැඩිදුරටත්, මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පාසල් දරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

ශීඝ්‍රයෙන් සංවර්ධනය වන විදුලි සංදේශ තාක්ෂණය ලබා ගැනීමෙහිලා දූරකථන ක්‍රියාකාර සමාගම් විදේශීය ප්‍රවීනයන්ගේ සේවාව ලබා ගැනීමට උත්සාහ කරන බැවින්, පසුගිය වසර දෙක තුළ තොරතුරු

සහ සන්නිවේදන තාක්ෂණය සහ විදුලි සංදේශනය පිළිබඳ විදේශීය ප්‍රවීනයන්ගේ සහ වෘත්තිකයන්ගේ වීසා අයදුම්පත් 395 ක් නිර්දේශ කර ඇති අතර අනුමැතිය සඳහා ජනාධිපති කාර්යාලයට යවා ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මෙරටේ මහජනතාවට ලබා දෙන අමතර සේවාවක් වශයෙන් දේශීය සහ ජාත්‍යන්තර තොරතුරු ලබා ගැනීමට සිය වෙබ් අඩවියට පිවිසීමට මහජනතාවට පහසුකම් සලසා ඇත.

වාර්ෂික වාර්තාවේ එක් එක් අංශ යටතේ විස්තර කර ඇති පරිදි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පාලන අංශය විසින් සිය අංශයේ කාර්ය මණ්ඩලයේ සහ වෙනත් අංශවල සම්පූර්ණ සහාය ලබා ගනිමින් සිය අංශය වෙත පැවරුණු රාජකාරි ඉටු කිරීමට කැපවී සිටී.

කාර්යක්ෂම සහ ඵලදායී ලෙස නිසි ආකාරයෙන් රාජකාරි ඉටු කරන රාජ්‍ය ආයතනයක් බවට පත් කිරීමෙහිලා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විගණන අංශය රජයේ මුදල් රීති සහ කොමිෂන් සභාවේ මූල්‍ය පටිපාටි සහ ශ්‍රී ලංකාවේ පිළිගත් විගණන ආයතනවල පිරිවිතර සහ ප්‍රමිතීන් කෙරෙහි අවධානය යොමු කරමින් සිය රාජකාරි ඉටු කරයි. එමෙන්ම මෙම අංශය මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම, වංචා අනාවරණය කර ගැනීම සහ විමර්ශනය කිරීම, වත්කම් ආරක්ෂා කිරීම මෙන්ම රජයේ විගණනය සඳහා පහසුකම් සැපයීමෙහිලා ඉහළ කළමණාකාරිත්වයට සහාය වේ. මෙම අංශය විසින් සාර්ථකව විගණන කමිටු රැස්වීම් හතරක් පවත්වා ඇති අතර එම රැස්වීම්වල පැන නැගුණු ගැටළු සාකච්ඡා කර ඊට අනුකූලව නිසි ක්‍රියාමාර්ග ගෙන ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය අංශය ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකරන ආයතනය විසින් ප්‍රසිද්ධ කළ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම්කරන ප්‍රමිති වලට අනුගතව රජයේ මූල්‍ය රීති සහ ක්‍රියාපටිවලට අනුකූලව මූල්‍ය කළමණාකරන කටයුතු පවත්වාගෙන යන අතර කොමිෂන් සභාවේ මූල්‍ය කටයුතුවල නිරත වේ. 2017 වසරේදී මෙම අංශය විසින් මූල්‍ය වාර්තාකරණය පවත්වාගෙන යන අතර මූල්‍ය පරිපාලනය, පිරිවැය පාලනය, ව්‍යාපෘති ඇගයීම, සංවර්ධන සැලසුම් සහ ක්‍රමෝපායශීලී තීරණ ගැනීමට සහාය වී ඇත.

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 27 දරන පනතින් පැවරුණු බලතල ප්‍රකාරව , ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 2017 වසරේදී ද මෙරටේ මහජනතාවට වඩා ප්‍රශස්ත ජීවන තත්ත්වයක් ලබාදීමේ සිය වගකීම ඉටු කර ඇත. මේ සම්බන්ධයෙන් පෞද්ගලික අංශය මෙරටේ පාරිභෝගිකයන් වෙනුවෙන් ලබාදුන් ක්‍රියාකාරී සහභාගීත්වය සහ කැපවීමෙන් යුතු වූ අගනා සේවය බෙහෙවින් ප්‍රශංසනීය හා අභිප්‍රේරණීය වේ. එමෙන්ම අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීමෙහිලා කොමිෂන් සභාව ලබාදුන් පරිශ්‍රමය බෙහෙවින් ඉවහල් විය.

# 04 පරිච්ඡේදය

## 2017 වර්ෂය සඳහා අංශ අනුව කාර්යසාධන වාර්තාව

### 4.1 සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශය

ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංඛ්‍යාත වර්ණාවලිය ආශ්‍රිතව පැවරුණු සියළුම වගකීම් ඉටු කිරීමටත්, සීමිත ජාතික සම්පතක් වශයෙන් ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කාර්යක්ෂමව කළමණාකරනය කිරීමේත් බලතල ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සංඛ්‍යාත කළමණාකරන අංශයට පවරා ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 10 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කිරීම සහ භූස්ථානගත චන්ද්‍රිකා කක්ෂයට අදාළ කරුණු කළමණාකරනය කිරීම සහ පාලනය කිරීමටත්, අවශ්‍ය අවශ්‍යතාවල එකී සියළුම සංඛ්‍යාත භාවිතය තහනම් කිරීම හෝ එහි භාවිතය අත්හිටුවීමට හෝ ආපසු ගැනීමට බලය පැවරී ඇති ශ්‍රී ලංකාවේ එකම නීත්‍යානුකූල බලධරයා වේ.

එමෙන්ම පනතේ 22 වන වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ගුවන් විදුලි සන්නිවේදන සේවා පරිහරණය කරන්නන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම, ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සංරක්ෂණය කිරීම සහ ගුවන් විදුලි සන්නිවේදන ස්ථාපනය කිරීම් මගින් නිපදවෙන විද්‍යුත් චුම්භක අවහිරතා අවම කිරීම පිණිස රීතිවල අනුකූලතාවය බලාත්මක කිරීමේ බලධාරියා වේ.

සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශයේ කාර්යයන්

- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ගුවන් විදුලි රීති (5 වගන්තිය) සහ ජාතික ප්‍රමුඛතාවයන්ට අනුකූලව ගුවන් විදුලි සංඛ්‍යාත පරාස වෙන් කිරීම;
- බලපත්‍රයේ 22 වන වගන්තිය ප්‍රකාරව සංඛ්‍යාත පැවරීම;
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සහ රටට අයත් චන්ද්‍රිකා කක්ෂ භාවිතා කිරීම සඳහා අවශ්‍ය රීති, තාක්ෂණික ප්‍රමිති, ස්ථාපනය කිරීම ;
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සැලසුම් කිරීම;
- ගුවන් විදුලි සන්නිවේදන උපකරණ සඳහා තාක්ෂණික ප්‍රමිති නියම කිරීම;
- රටේ සමාජ ආර්ථික ඉලක්ක සඳහා අදාල වැදගත්කම මත විවිධ සේවා ප්‍රමාණවත් පරිදි සැපයීම පිණිස ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කළමණාකරනය කිරීම;
- නීති විරෝධී ලෙස භාවිතා කරන, භාවිතයේ නොමැති සහ ඌන භාවිතය සහිත ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය අනාවරණය කර ගැනීම සඳහා ගුවන් විදුලි සංඛ්‍යයාත වර්ණාවලිය පිරික්සීම;

- ගුවන් විදුලි පර්යන්ත උපකරණ (Radio Terminal Equipment – RTE) සඳහා මාදිලි අනුමැතිය ලබා දීම.
- බලපත්‍රයේ නියම කරන ලද තාක්ෂණික ප්‍රමිති සහ පරාමිතීන්ට අනුකූලව සිය මෙහෙයුම් කටයුතු සිදු කිරීමට වගබලා ගැනීම පිණිස ගුවන් විදුලි සන්නිවේදන මධ්‍යස්ථානවල බලපත්‍ර අනුකූලතා විමර්ශන පැවැත්වීම;
- ගුවන් විදුලි සංඛ්‍යාත භාවිතා කිරීම සඳහා කලාපීය සහ ජාත්‍යන්තර සම්බන්ධීකරණය සහ සහයෝගීත්වය පවත්වාගෙන යාම;
- ගුවන් විදුලි සංඛ්‍යාත,පිහිටීම,සම්ප්‍රේෂණ බලය, ඇමතුම් සංඥා යනාදිය සම්බන්ධයෙන් ප්‍රධාන සංඛ්‍යාත රෙජිස්ටරය (Master Frequency Register -MFR)පවත්වා ගෙනයාම;
- නව තාක්ෂණයන් සහ සේවා සම්පාදනය කිරීම පිණිස නව සංඛ්‍යාත වර්ණාවලි අවකාශ නිදහස් කර ගැනීම සඳහා නිසි ගුවන් විදුලි සන්නිවේදන සේවා ක්‍රමවත්ව පවත්වාගෙන යා හැකි පරිදි විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නැවත සකස් කිරීම;.
- අවහිරතාවයන්ගෙන් තොරව අවසරලත් විමෝචන භාවිතා කිරීම, සහ අනුකූලතාවය පිරික්සීම, අවහිරතාවයන් ඇතිවන ආකාරය අනාවරණය කර ගැනීම මෙන්ම ඒවා නිරාකරණය කිරීම;
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කිරීම සඳහා ගෙවිය යුතු බලපත්‍ර ගාස්තු රැස් කිරීම;
- ආධුනික ගුවන් විදුලි සහ ගෝලීය සමුද්‍රීය ආපදා ආරක්ෂණ පද්ධතිය (Global Maritime Distress Safety System (GMDSS) පිළිබඳ විභාග පැවැත්වීම;

විදුලි සංදේශ පනතේ 22 වන වගන්තිය ප්‍රකාරව ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණ භාවිතා කරන කිසියම් තැනැත්තෙකු සතුව කොමිෂන් සභාව විසින් නිකුත් කරන වලංගු බලපත්‍රයක් තිබිය යුතුය. බලපත්‍රය, වෙනත් ආකාරයකින් සඳහන් නොවන්නේ නම් මිස, එම කරුණු තීරණය කිරීම පිණිස සාදන ලද රීති වල සඳහන් පරිදි ගාස්තුවක් ගෙවීමෙන් නිකුත් කරනු ලැබේ. බලපත්‍රයේ කොන්දේසි පැහැදිලිව සඳහන්වේ. බලපත්‍රයේ කොන්දේසි සේවාවෙන් සේවාවට වෙනස් වේ. මෙම කොන්දේසි කඩ කරනු ලැබූ අවස්ථාවලදී, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට උපකරණ මුද්‍රාතැබීම හෝ බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට බලතල ඇත. ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සේවා වර්ගයට අනුකූලව විවිධ පරාසයන්ට වෙන් කරනු ලැබේ. ගුවන් විදුලි තරංග, උපකරණයේ තාක්ෂණික පරාමිතීන් සහ භාවිතයන් වල ලක්ෂණ පදනම් කරගෙන සේවාවේ ස්වභාවය එකකින් අනෙකට වෙනස් වේ. එබැවින් ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශය විසින් සිදු කරන සේවා වර්ග කීපයකට බෙදා වෙන් කරනු ලැබේ. තැනැත්තෙකු හෝ සමාගමක් විසින් ආනයන නිෂ්කාශණය සඳහා ඉල්ලා සිටින විට එය නිකුත් කිරීමට පෙර, උපකරණය ක්‍රියා කරවීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ගුවන් විදුලි සංඛ්‍යාතයන් තිබෙන බව සහ උපකරණය අවශ්‍යය ප්‍රමිතිවලට අනුකූල බව ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශය විසින් සහතික කරනු ලැබේ.මෙම ක්‍රියා මාර්ගය බලපත්‍රලාභි සංඛ්‍යාත වර්ණාවලි පරිහරණය කරන්නන්ට පවතින ගුවන් විදුලි අවහිරතා අවම කරයි.

කෙසේ වුවද පරිහරණය කරන්නන් සිය සම්ප්‍රේෂණ වලට බලපාන අවහිරතාවයන්ට ලක්වීමේදී සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරණ අංශයට පැමිණිලි කරයි. එවිට එම අවහිරතාවය ඇතිවීමට හේතුවන ප්‍රභවය හඳුනාගෙන අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගනු ලැබේ.

**වර්ෂයේ ප්‍රගතිය**

2017 වර්ෂය තුළ නිකුත් කරන ලද ගුවන් විදුලි සංඛ්‍යාත සහ බලපත්‍ර සංඛ්‍යාව පිළිබඳ සංඛ්‍යාලේඛන මෙන්ම ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශය විසින් හඳුනාගත් අවහිරතා පිළිබඳ පැමිණිලි සහ අවසර නොලත් පරිහරණය කරන්නන් පහත දැක්වේ.

**සංඛ්‍යාත බලපත්‍ර නිකුත් කිරීම**

*වගුව 07: සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කරන්නන් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව 2017*

| සේවාවේ වර්ගය | බලපත්‍ර සංඛ්‍යාව | |
|---|---|---|
| | **2016** | **2017** |
| *ස්ථාවර සේවාව* | 122 | 153 |
| *විකාශන සේවාව (රූපවාහිනී සහ ගුවන් විදුලි)* | 54 | 66 |
| *ට්‍රන්කින්/පේජින්/සිටිසන් බෑන්ඩ්* | 7 | 7 |
| *දත්ත / ගුවන් විදුලි ටෙලිමෙට්‍රි සේවාව* | 15/33 | 49/39 |
| *ගුවන් සහ සමුද්‍ර සේවා* | | |
| *(i) ගුවන් යානා මධ්‍යස්ථාන* | 76 | 74 |
| *(ii) නැව් මධ්‍යස්ථාන* | 92 | 91 |
| *(iii) සමුද්‍රීය ජංගම* | 1112 | 1872 |
| *(iv) ගුවන් යානා ගමන් හැසිරවීම* | 11 | 10 |
| *පුද්ගලික ජංගම ගුවන් විදුලි සේවාව* | 252 | 272 |
| ආධුනික ගුවන් විදුලි | 17 | 65 |

**2017 වර්ෂයේදි ලැබුණු පැමිණිලි සහ විමර්ශන**

*වගුව 08: 2017 වර්ෂයේදී ලැබුණු පැමිණිලි සහ පැවැත්වූ විමර්ශන*

| සේවාව | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | | පැවැත්වූ විමර්ශන සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | **2016** | **2017** | **2016** | **2017** |
| *රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශනය* | 06 | 03 | 06 | 03 |
| *වෙනත් සේවාවන්* | 18 | 14 | 18 | 13 |

**ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ලෙස පරිහරණය කරන්නන් හඳුනා ගැනීම**

ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ආකාරයෙන් පරිහරණය කරන්නන් අනාවරණය කර ගැනීම පිණිස විශේෂ සංඛ්‍යාත පිරික්සුම් උපකරණ භාවිතා කරනු ලැබේ.මෙම උපකරණ මෙකී කාර්ය සඳහා සැලසුම් කරන ලද විශේෂ උපකරණවල සවි කරනු ලැබේ. පහත වගුවෙන් 2017 සඳහා ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ලෙස භාවිතා කරන බවට හඳුනාගත් භාවිතා කරන්නන් සංඛ්‍යාව දැක්වේ.

*වගුව 09: 2017 සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ලෙස භාවිතා කරන බවට හඳුනාගත් සංඛ්‍යාව සහ ගනු ලැබූ නිවාරණ ක්‍රියා මාර්ග*

| වර්ගය | හඳුනාගත් නීති විරෝධී භාවිතා කරන්නන් සංඛ්‍යාව | | ගනු ලැබූ ක්‍රියාමාර්ගය |
|---|---|---|---|
| | **2016** | **2017** | |
| විකාශන සේවා (රූපවාහිනී සහ ගුවන් විදුලි) | 03 | 03 | සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ලෙස භාවිතා කිරීම වැලැක්වීමට පියවර ගන්නා ලදී. |
| වෙනත් සේවාවන් | 01 | 01 | |

රැහැන් රහිත විදුලි සංදේශ උපකරණ ආනයනය කිරීම සඳහා නිකුත් කරන ලද නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව.

*වගුව 10 :නිකුත් කරන ලද නිෂ්කාශන ලිපි සංඛ්‍යාව, 2017*

| සේවා වර්ගය | නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව | |
|---|---|---|
| | **2016** | **2017** |
| *සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ ඇතුළු ස්ථාවර සේවාව* | 1243 | 649 |
| *විකාශන සේවාව (රූපවාහිනී සහ ගුවන් විදුලි)* | 323 | 76 |
| *සෙලියුලර් ජංගම සේවාව* | | |
| *(i) වෙළඳ බලපත්‍ර* | 4933 | 7325 |
| *(ii) ජංගම ක්‍රියාකරුවන්* | 1341 | 1130 |
| *(iv) පෞද්ගලික ජංගම ගුවන් විදුලි* | 940 | 645 |
| *දත්ත සේවාව / ගුවන් විදුලි ටෙලි මෙට්‍රි* | 125/07 | 152/139 |
| *චන්ද්‍රිකා සේවා* | 471 | 513 |
| *ආධුනික ගුවන් විදුලි* | 35 | 15 |
| *අඩු බලැති උපකරණ* | 1858 | 2188 |

**සංඛ්‍යාත පිරික්සීම සහ විමර්ශනය**

සංඛ්‍යාත කළමණාකරනයේදී ඉතා අත්‍යාවශ්‍ය අංගයක් වන්නේ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය අධීක්ෂණය කිරීමයි. බලපත්‍රයේ 22 වන වගන්තියෙන් අවහිරතාවයන්ගෙන් තොරව සහතිකලත් ගුවන් විදුලි සේවා භාවිතා කරන බව නිසැක කරනු ඇත.ගුවන් විදුලි සම්ප්‍රේෂක වලින් පරාස විමෝචනයන්ගෙන් බැහැරව අනවශ්‍ය සහ ව්‍යාජ විමෝචනයන් උත්පාදනය වන බැවින් අවහිරතාවයන්ගෙන් තොරව ගුවන් විදුලි සන්නිවේදන සේවා භාවිතා කිරීම බෙහෙවින් දුෂ්කර බව යථාර්ථයයි. එමෙන්ම එය අනපේක්ෂිතව අවහිරතාවයන්ට හේතු විය හැකි විකාශන වලට සංවේදී ආදායක මෙහෙයවයි.එබැවින් අවහිරතාවයන් අනාවරණය කර ගැනීම සහ අවම කිරීම බෙහෙවින් අසීරු කාර්යයක් වන අතර ඒවා අනාවරණය කර ගැනීම පිණිස නවීන තාක්ෂණික උපකරණ අවශ්‍ය වේ. සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශය විසින් කොළඹ, කදිරාන සහ නුවර ප්‍රාදේශීය පිරික්සුම් මධ්‍යස්ථාන (Regional Monitoring Centres) මෙන්ම යක්කල සහ කටුබැද්ද දුරස්ථ පිරික්සුම් මධ්‍යස්ථානද ස්ථාපනය කර ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතුව සිය ජංගම ක්‍රියාකාරකම් සඳහා නවීන සංඛ්‍යාත වර්ණාවලි ආවේක්ෂණ රථයක් ඇත.එමෙන්ම කදිරාන පිරික්සුම් මධ්‍යස්ථානයේ ස්ථාපනය කර ඇති නවීන අධි සංඛ්‍යාත දිශා නිශ්චය කිරීම සහ පිරික්සීමේ පද්ධතිය (Modern High Frequency Direction Finding -HFDF and Monitoring System) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේ සිට දුරස්ථව මෙහෙයවිය හැකිය.

## 4.2 නීති අංශය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ කර්මාන්තය නියාමනය සඳහා ව්‍යවස්ථාව යටතේ බලය පවරා ඇති නියාමන ආයතනයකි. කොමිෂන් සභාවට අර්ධ විනිශ්චය කාර්යයන් පැවරෙන අතර, මෙලෙස ස්වභාවික යුක්තියේ රීති සහ නීතිමය මූලධර්ම ප්‍රකාරව කොමිෂන් සභාවේ තීන්දු, තීරණ සහ නියෝග දෙනු ලැබේ.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ජනතාවගේ එදිනෙදා ජීවිතයේ කොටසක් බවට පත්වී ඇතත් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලාංකීය ජනතාවට මාර්ගගත සම්බන්ධතාවය සපයමින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙලෙස මහජනතාව විසින් අන්තර්ජාලය වැඩි වශයෙන් භාවිතා කරන අතර ඇතැම් පුද්ගලයන් සිය ජීවිතයේදී ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා මෙවලමක් වශයෙන් සහ ඇතැමුන් විශාල වශයෙන් සමාජයට එරෙහිව අපරාධ සිදු කිරීමට යොදා ගනී. එය නීතිමය සහ තාක්ෂණික විසඳුම් අවශ්‍ය නව අභියෝගයක් බවට පත්වී ඇත.

කොමිෂන් සභාව සියළුම නීති සහ නියාමන කරුණු සම්බන්ධයෙන් නීති අංශයේ නීති උපදෙස් අපේක්ෂා කරයි.එමෙන්ම මෙම අංශය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පාර්ශවයක් වන සියළුම නීතිමය කරුණු කළමණාකරනය කරයි. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරිමෙහිලා නීතිමය උපදෙස් සැපයීම පිණිස නීති අංශය කොමිෂන් සභාවේ සෙසු අංශවල සහ සෙසු ආයතන වලට සහාය වේ. මෙම අංශයේ ප්‍රධාන වගකීම් සහ කාර්යයන් වන්නේ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නීති, රීති, රෙගුලාසි සහ ප්‍රමිතිවලට අදාලව ප්‍රාථමික සහ ද්විතීයික නීති සම්පාදන කෙටුම්පත් කිරීම, නීති අර්ථ නිරූපනය කිරීම, නීති උපදෙස් ලබාදීම සහ නීති සමාලෝචනය කිරීමයි.එමෙන්ම බලපත්‍රලාභීන්, පාර්ශවකරුවන්, අමාත්‍යාංශ මෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සෙසු අංශ විසින් යොමු කරන කරුණු පිළිබඳ නීතිමය උපදෙස් සැපයීම මෙම අංශය විසින් සිදු කරයි. නියාමන කරුණු සම්බන්ධයෙන් නීතිමය දායකත්වය සපයන අතරම, විවිධ නීතිමය අධිකරණවල ගොනු කර ඇති නඩු සඳහා සහාය වීම මෙම අංශයේ වගකීම වේ.

2017 වර්ෂයේදී මෙම අංශය සංඛ්‍යාත සඳහා බලපත්‍ර දීම, වෙළඳ බලපත්‍ර දීම, අයක්‍රම,අනුකූලතා ගැටළු,පාරිභෝගික ගැටළු සහ පාරිභෝගිකයින්ගේ දැනුවත් කිරීමේ වැඩසටහන්, පරිපාලන සහ මානව සම්පත් කාර්යයන්, ජාල ආශ්‍රිත ගැටළු මෙන්ම, අන්තර්ජාලය සහ මාර්ගගත සන්නිවේදනය ආශ්‍රිත කරුණු යනාදිය වැනි නියාමන කරුණු ගණනාවක කටයුතු සිදු කර ඇත. මේ වන විට මෙම අංශය වර්තමාන විදුලි සංදේශ පනතේ නව සංශෝධනයන් සම්පාදනය කිරීමේ ක්‍රියාවලියේ නිරත වී සිටී.

### නඩු මගට බැසීම

මහාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ ගොනු කළ නඩු කිහිපයක් විභාග වෙමින් පවතී. එමෙන්ම ගුවන් විදුලි සංඛ්‍යාත වෙන් කිරීම, බලපත්‍ර ප්‍රත්‍යාදිෂ්ට කිරීම සහ රීති හා උපදෙස් වලට අනුකූලව කටයුතු නොකිරීම වැනි නියාමන ගැටළු පිළිබඳව කොමිෂන් සභාවට එරෙහිව නඩු පවරා ඇත.මීට අමතරව

අභියාචනාධිකරණයේ නියෝග ආශ්‍රිත කරුණු,දිස්ත්‍රික් උසාවියේ සහ වෙළඳ අධිකරණයේ මුදල් අයකර ගැනීම ආශ්‍රිත කරුණු, කම්කරු විනිශ්චය සභාවේ කම්කරුවන් ආශ්‍රිත කරුණු සහ කාර්මික අධිකරණයේ සහ මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්මාන්ත ආශ්‍රිතව විහිදුනු කරුණු සම්බන්ධයෙන් 2017 වර්ෂයේදී ගොනු කල නඩු විභාග වෙමින් පවතී.

නීති අංශය මගින් බලාත්මක කිරීමේ කොටසක් වශයෙන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත උල්ලංඝනය කරමින් සිදුකරන වැරදි වෙනුවෙන් අදාල තැනැත්තන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මුලපුරා ඇත.

**වෙනත් කරුණු**

එමෙන්ම පොලිසියට සිය විමර්ශන සිදු කිරීමට සහාය වීම පිණිස සේවා සැපයුම්කරුවන් මගින් ජංගම/ස්ථාවර දුරකථන සහ සම්බන්ධතා පිළිබඳ තොරතුරු ලබාගැනීමේ ඉල්ලීම් සම්බන්ධයෙන් උසාවි නියෝග ලබාගැනීමේ වර්ධනයක් දක්නට ඇත. 2017 වර්ෂයේදී උසාවි නියෝග 1028 ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

## 4.3 අනුකූලතා අංශය

ශ්‍රී ලංකා විදුලි සංදේශ කොමිෂන් සභාවේ (TRCSL) එක් ප්‍රධාන අරමුණක් වන්නේ ශ්‍රී ලංකාව තුළ විශ්වාසනීය සහ කාර්යක්ෂම දේශිය සහ ජාත්‍යාන්තර විදුලි සංදේශ සේවාවක් සැපයීමට වගබලා ගැනීමයි. මෙම කාර්යයේදී, විශ්වාසනීය, කාර්යක්ෂම සහ ගුණාත්මක විදුලි සංදේශ සේවාවක් සැපයීම පිණිස විදුලි සංදේශ සේවා ක්‍රියාකරුවන්ගේ සිය නියාමන බැදීම් ආශ්‍රිත පැමිණිලි තහවුරු කිරීම පිණිස අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග ගත යුතුය. මෙම අවශ්‍යතාවය මුදුන්පත් කර ගැනීමේදී විදුලි සංදේශ කර්මාන්තය අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ උචිත නියාමන ක්‍රියාමාර්ග බලාත්මක කිරීම අවශ්‍ය කෙරේ. පාරිභෝගික කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ පාරිභෝගිකයන් සෑහිමකට පත්වන ආකාරයෙන් ඔවුන්ගේ ගැටළු වලට සාධාරණ විසඳුම් ලබාදීම මෙන්ම ප්‍රජාවගේ අවශ්‍යතාවයන් වලට සරිලන ප්‍රශස්ථ සේවාවක් සැපයීම සහ විදුලි සංදේශ සේවා පද්ධතිය භාවිතා කිරීම පිළිබදව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ඇතුළු සමස්ථයක් වශයෙන් සියළුම පැතිකඩ වැඩිදියුණු කිරීම සිදු කරනු ලැබේ. මෙම වගකීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනුකූලතා අංශය විසින් සිදු කරනු ලැබේ. අනුකූලතා අංශය සේවා තත්ව, අධීක්ෂණ සහ අධිවේගී අන්තර්ජාල සේවා අංශ තුනෙන් සමන්විත වේ.

**සේවා තත්වය(QOS) ඒකකය**

බලපත්‍රයේ සඳහන් කර ඇති සේවා තත්ත්ව ප්‍රමිති සහ පොදු ස්විචිකරණ දුරකථන ජාල ක්‍රියාකරුවන්ගේ (PSTN) අන්තර් සම්බන්ධිය ගිවිසුම් වලට අනුකුලව කටයුතු කරන්නේද යන්න පිරික්සීම, පොදු ස්විචීකරණ දුරකථන ජාල ක්‍රියාකරුවන්ගේ (PSTN) ජාල කාර්ය සාධනය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ

නියාමන කොමිෂන් සභාව සකස් කරන ලද සේවා තත්ත්ව පරාමිති ඉලක්කගත අගය සාක්ෂාත් කර ගැනීම පිරික්සීම, පොදු ස්විචීකරණ දූරකථන ජාල ක්‍රියාකරුවන් විසින් හඬ සේවා සඳහා මිනුම්ගත සේවා තත්ත්ව පරාමිති අගයන් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විගණනය කල අගයන් අතර සන්සන්දනාත්මක වාර්තාවක් පිළියෙල කිරීම, කාර්ය සාධන මිනුම්වල නිරවද්‍යතාවය වැඩිදියුණු කිරීම සහ දැන ගැනීම පිණිස පොදු ස්විචීකරණ දූරකථන ජාල ක්‍රියාකාර සමාගම් අතර සන්සන්දනාත්මක වාර්තාව බෙදා හැරීම, කාලානුරූප විගණන සිදු කිරීම මගින් පොදු ස්විචීකරණ දූරකථන ජාල ක්‍රියාකාර සමාගම් සකස් කළ සේවා තත්ත්ව කාර්යසාධන මිනුම්වල නිරවද්‍යතාව ඇගයීම සහ විදුලි සංදේශ සේවාවල සේවා තත්වය සඳහා නීති සහ රෙගුලාසි පිළියෙල කිරීම මෙම ඒකකය විසින් සිදු කරනු ලැබේ.

මෙම අංශය විසින් 2017 වර්ෂයේදී සිදු කරන ලද ක්‍රියාකාරකම්:

- පොදු ස්විචීකරණ දූරකථන ජාල ක්‍රියාකාර සමාගම් මගින් ලැබෙන මාසික සේවා තත්ත්ව වාර්තා සැලකිරීම් විශ්ලේෂණය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී සේවා තත්ත්ව පරාමීතීන් වැඩිදියුණු කිරීම පිණිස ඔවුන් සමග සාකච්ජා පැවැත්වීම.
- 2017 වර්ෂයේ තෙවන කාර්තුව සඳහා අවශ්‍ය සන්සන්දනාත්මක වාර්තා පිළියෙල කිරීම සහ කාර්ය සාධන මිනුම්වල නිරවද්‍යතාවය වැඩිදියුණු කිරීම සහ දැනගැනීම පිණිස පොදු ස්විචීකරණ දූරකථන ජාල ක්‍රියාකාර සමාගම් අතර වාර්තා බෙදා හැරීම.
- පොදු ස්විචීකරණ දූරකථන ජාල ක්‍රියාකාර සමාගම් ජාල කවුළු මගින් ලබා ගන්නා කාර්යසාධන මිනුම් දත්ත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දෙනු ලබන සමීකරණය ප්‍රකාරව ගණනය කිරීම් සිදුකර, සේවා තත්ත්ව පරාමීතීන් ආකාරයෙන් වාර්තාව නැවත ලබාදීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දූරකථන ක්‍රියාකාර සමාගම්වල ජාල නිරීක්ෂණය කිරීම සහ ගණනය කිරීමේ ක්‍රමවේදය නැවත ඇගයීම සහ සේවා තත්ත්ව පරාමීතීන් ගණනය කිරීම පිණිස ජාල කවුළු මගින් සකස් නොකරන ලද දත්ත ලබා ගැනීම.

**ආවේක්ෂණ ඒකකය**

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නිකුත් කළ බලපත්‍ර නියමයන් සහ කොන්දේසි වලට අනුකූලව පොදු ස්විචිකරණ දූරකථන ජාල ක්‍රියාකාර සමාගම් කටයුතු කරන බව පිරික්සීම බලපත්‍රලාභී පොදු ස්විචිකරණ දූරකථන ක්‍රියාකාර සමාගම් විසින් අනුමත නොකරන ලද අයක්‍රම පැකේජ ලබාදීම පාලනය කිරීම පිරීක්සීම, විශ්ලේෂණය කිරීම සහ නියාමන ක්‍රියාමාර්ග අනුමත කිරීම, බලපත්‍රලාභි දූරකථන ක්‍රියාකාර සමාගම් විසින් නීති විරෝධී ලෙස දූරකථන ඇමතුම් අවසන් කිරීම පිළිබද පැමිණිලි විමර්ශනය කිරීම සහ අවශ්‍ය යැයි හැගෙන පරිදි සුදුසු නියාමන ක්‍රියාමාර්ග ගැනීම, බලපත්‍රලාභී වෙළෙන්දන් විසින් මාදිලි අනුමත නොකරන ලද විදුලි සංදේශ උපකරණ විකිණීම පිළිබද විමර්ශන පැවැත්වීම සහ බලපත්‍රයේ

නියාමනයන් සහ කොන්දේසි උල්ලංඝනය කිරීම පිළිබඳව අනාවරණය වන්නේ නම් ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියා මාර්ග ගැනීම, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නිකුත් කළ වෙළඳ බලපත්‍රයක් රහිතව නීති විරෝධී ආකාරයෙන් වෙළෙන්දන් විදුලි සංදේශ උපකරණ විකිණීම පිරික්සීම සහ විමර්ශන පැවැත්වීම මෙන්ම කිසියම් නීති විරෝධී ක්‍රියාවන් සම්බන්ධයෙන් අවශ්‍ය යැයි හැගෙන පරිදි සුදුසු නියාමන ක්‍රියාමාර්ග ගැනීම අනුකූලතා ක්‍රියාකාරකම් වලට අදාලව නීති සහ රීති පිළියෙල කිරීම ආවේක්ෂණ ඒකකය මගින් සිදු කරනු ලැබේ.

2017 වර්ෂයේදී සිදු කරන ලද ක්‍රියාකාරකම්/කාර්යයන්

- බලපත්‍රලාභී දූරකථන ක්‍රියාකාර සමාගම් නීති විරෝධී ආකාරයෙන් ඇමතුම් අවසන් කිරීම පිළිබද පැමිණිලි 803 සම්බන්ධයෙන් විමර්ශන සම්පූර්ණ කිරීම.
- වෙළෙන්දන් විසින් මාදිලි අනුමත නොකරන ලද විදුලි සංදේශ උපකරණ විකිණීමේ අවස්ථා 36 පිළිබඳ විමර්ශන සම්පූර්ණ කිරීම.
- දූරකථන ක්‍රියාකාර සමාගම් විසින් අනුමත නොකරන ලද අයකුම පැකේජ් ලබාදීමේ අවස්ථා 13ක් පිළිබඳව විමර්ශන පැවැත්වීම.

### අධිවේගී අන්තර්ජාල සේවා ඒකකය

ගුණාත්මකවූ අධිවේගී අන්තර්ජාල සේවා පිළිබඳ ලක්ෂණ විග්‍රහ කිරීමේදී වේගය පොදු මිනුම් ඒකකයක් වශයෙන් පිලිගෙන ඇත. විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නියාමකයා වශයෙන්, ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව සිය ජාතික අධිවේගී අන්තර්ජාල සේවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති අතර, එමගින් පාරිභෝගිකයන් සඳහා ගුණාත්මක අධිවේගී අන්තර්ජාල සේවා සැපයීම තුලින් නිරවද්‍ය තොරතුරු සැපයීමට අපේක්ෂා කෙරේ. නිරවද්‍ය තොරතුරු පිළිබඳව අවධානය යොමු කිරීමේදී එය දෙවර්ගයක් වන අතර, පළමුවැන්න පාරිභෝගික ආරක්ෂණය වන අතර දෙවැන්න වන්නේ එම තොරතුරු සේවා තරඟකාරිත්වය හමුවේ සිය අධිවේගී අන්තර්ජාල සේවා වැඩිදියුණු කර ගැනීමට සැපයුම්කාර සමාගම් දිරිගැන්වීමයි.

මෙම සන්දර්භය තුළ, ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව වෙනුවෙන්, මොරටුව විශ්ව විද්‍යාලය භාගත කිරීමේ වේගය ප්‍රකාරව අධිවේගී අන්තර්ජාල සේවා ඇගයීම සිදු කිරීමට හැකි වන පරිදි මෙවලමක් සැලසුම් කර ඇත. මෙම මෙවලම සංරචකයන් දෙකකින් සමන්විත වේ.

1. පාරිභෝගිකයින් විසින් ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාවේ වෙබ් අඩවිය ඔස්සේ වේගය මැනීම බාගත කිරීම
(the On-line Speed Test – MySpeed)

2. ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව විසින් භාවිතා කරන අධිවේගී අන්තර්ජාල සේවා වේග පිරික්සීම බාගත කිරීම
(ISP's Internet Speed Test – NetSpeed)

ඉහත භාවිතාවන් සහ අවශ්‍යතාවයන්ට පහසුකම් සැලසීම පිණිස වෙන් වෙන්වූ වෙබ් පාදක යෙදුම් දෙකක් ක්‍රියාත්මක කෙරේ. ReST (Representational State Transfer) service on Node.js , a server side platform built on Google Chrome's JavaScript Engine (V8 Engine) ජාල යෙදුම් නිසි ලෙස පවත්වාගෙනයාමේ පහසුකම් සැලසීමෙහිලා Node.js පහත ලක්ෂණ වලින් සමන්විත වේ.

- Asynchronous and event- driven
- Rich library of various JavaScript modules
- Very fast in code execution
- Single Threaded but Highly Scalable

මෙම සේවා දායකය භාවිතා කිරීම සඳහා HTML 5 enabled web browser අවශ්‍ය වේ.

අන්තර්ජාල සම්බන්ධතාවයේ වේගය මැනීමේ වෙබ් යෙදුම් සඳහා සිංගප්පූරුවේ ස්ථාපනය කරන ලද ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව සතු වෙබ් සර්වරයෙන් පහසුකම් සපයනු ලැබේ. දත්ත සමුදාය සම්බන්ධ සර්වරය සඳහාද එම සර්වරය මගින් පහසුකම් සැපයේ. විවිධ ප්‍රමාණවල බාගත කළ හැකි පොදු නමක් යටතේ ගොනුවූ දත්ත සිංගප්පූරුවේ සත්කාරක සර්වරය, ඇමරිකා එක්සත් ජනපදයේ සහ නෙදර්ලන්තයේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු වෙබ් සර්වර් යනාදී වශයෙන් විවිධ ස්ථාන තුනක පවතී.

“MySpeed” යෙදුම් ක්‍රමලේඛයේ ප්‍රධාන අරමුණ වන්නේ අන්තර්ජාල සේවා පරිභරණය කරන්නන්ට සිය සම්බන්ධතාවයේ වේගය මැනීම පිණිස අවස්ථාව සලසා දීමයි. පරිභරණය කරන්නන්ට සිය කැමැත්ත අනුව පොදු නමක් යටතේ ගොනුවූ දත්ත බාගත කර ගත හැකිය. සිය අන්තර්ජාල පුළුල් කළාප වේගය මැනීමට අවශ්‍ය අවසාන පරිභරණය කරන්නාට ශ්‍රී. ල.වි.ස.නි.කො.සභාවේ නිල වෙබ් අඩවියේ (www.trc.gov.lk) දැක්වෙන වේග පරීක්ෂණ කේතය ක්ලික් කර කිසියම් web browser මගින් හෝ වේග පරීක්ෂණ භාවිතය URL (http://speedtest.trc.gov.lk) සෘජුවම ප්‍රවේශවීමෙන් මෙම යෙදුම් ක්‍රමලේඛය භාවිතා කළ හැකිය.

***සටහන 01:ස්වයං වේග පරීක්ෂණ වාර්තාව***



"Net Speed" සියළුම අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් (ISP) විසින් සපයන අන්තර්ජාල සම්බන්ධතාවල වේගය මැනීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. මෙම යෙදුම් ක්‍රමලේඛය ක්‍රමානුකූල කාල අන්තරයකදී ස්වයංක්‍රීයව පවත්වාගෙන යාමට අවශ්‍ය නිසා අවම මිනිස් අන්තර් ක්‍රියාකාරිත්වයකින් යුතුව පවත්වාගෙන යාම පිණිස සැලසුම් කෙරේ. මෙම යෙදුම් ක්‍රමලේඛයේ මූලික නිර්මිතය "MySpeed" යෙදුම් ක්‍රමලේඛයට සමාන වන අතර යෙදුම් ක්‍රමලේඛය හා දත්ත සමුදාය උදෙසා පහසුකම් සැලසීමේදී සමාන ක්‍රම භාවිතා කරයි. කෙසේවුවද, Net Speed ක්‍රමලේඛක අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් ලබාදෙන විශේෂ පරිගණක / ලැප්ටොප් මගින් පවත්වාගෙන යනු ලැබේ. මෙම යෙදුම් ක්‍රමලේඛය පූර්ව නිශ්චිත පිහිටීමක සිට පූර්ව නිශ්චිත ගොනුවක් බාගත කිරීමෙන් browser එකක් මගින් පවත්වාගෙන යාමට නිර්මාණය කරනු ලැබේ. මෙම browser ක්‍රමානුකූල අන්තරයකදී යෙදුම් ක්‍රමලේඛය පවත්වාගෙන යාමට සකස් කරනු ලැබේ. URL, සත්කාරක සර්වරයේ අන්තර්ජාල මූලලේඛ ලිපිනය හා පූර්ව නිශ්චිත මෘදුකාංග පරිගණකගත කිරීම යන දෙකම අන්තර්ගතවේ. එම මෙහෙයුම් කාලය තුළදී, බාගත කරන ගොනුව ආශ්‍රිත සංඛ්‍යා ලේඛන හා අන්තර්ජාල වේගය දත්ත සමුදායේ තැන්පත් වේ. පරීක්ෂණ ප්‍රතිඵල දෛනිකව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ (www.trc.gov.lk) දැක්වේ.

***සටහන 02: ජාල වේගී පරීක්ෂණ ප්‍රතිඵල - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ස්ථාපිත***




***සටහන 03: ජාල වේගී පරීක්ෂණ ප්‍රතිඵල - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් පිටත***



## 4.4 පාරිභෝගික සම්බන්ධතා ඒකකය

විදුලි සංදේශ පනත ප්‍රකාරව, විදුලි සංදේශ සේවා ග්‍රාහකයකු හෝ මහජන සාමාජිකයෙකු දුරකථන ක්‍රියාකාර සමාගමක් සපයන විදුලි සංදේශ සේවා සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කල විටෙකදී කොමිෂන් සභාවට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට බලය පවරා ඇත. යම් විමර්ශනයක් පැවැත්වීමේදී ඒ පැමිණිල්ලට හේතුවූ නිමිත්ත හෝ කාරණය නිරවද්‍ය කිරීම සඳහා අවශ්‍යයයි කොමිෂන් සභාවට පෙනී යන පියවර ගණන ලෙස කොමිෂන් සභාව විසින් ඒ ක්‍රියාකරුට විධාන කළ හැකි අතර උචිත අවස්ථා වලදී මුදල් සහන සලසන ලෙසද විධාන කළ හැකිය.

පාරිභෝගික පැමිණිලි සම්බන්ධ ලිපිගොනු පවත්වාගෙන යාම විදුලි සංදේශ සේවා ආශ්‍රිතව කොමිෂන් සභාව වෙත ලැබෙන පාරිභෝගික පැමිණිලි අදාල පාර්ශව වෙත ඉදිරිපත් කරනු ලබන අතර මෙම ඒකකය විසින් පැමිණිලිකරු සඳහා සාධාරණවූත් යුක්තිසහගතවූත් විසඳුම් ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. සේවා සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන විසඳුම පිළිබඳව පැමිණිලිකරු සෑහිමකට පත් නොවන්නේ නම් එවැනි අවස්ථාවකදී අවශ්‍යයැයි හැගෙන පරිදි ගැටළුව සමථයකට පත්කිරීම සඳහා ගැටළුව සාකච්ඡා කිරීම පිණිස පාර්ශවයන් දෙකම සමන්විත රැස්වීමක් පවත්වනු ලැබේ.
අස්ථානගතවූ ජංගම දුරකථන පිළිබඳ ඉල්ලීම් මෙහෙයවීම සමාජීය වගකීම්වල කොටසක් වශයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අස්ථානගතවූ ජංගම දුරකථන සොයා දීම ක්‍රියාවලියේ ක්‍රියාකාරීව නිරත වේ. අස්ථානගතවූ ජංගම දුරකථන පිළිබඳ පැමිණිලි 250 සංඛ්‍යාවක් දෛනිකව අප වෙත ලැබේ.මේ වන විට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දළ වශයෙන් අයදුම්පත් 165,000 භාරගෙන ඇත. පසුගිය වර්ෂ කිහිපය තුළ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අස්ථානගතවූ ජංගම දුරකථන සොයාගැනීම සඳහා පොලිසියේ සහාය ලබාගෙන ඇත.

**මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්**

පාරිභෝගික පැමිණිලි විශ්ලේෂණය කිරීමේදී, දුරකථන භාවිතය මෙන්ම වෙනත් අදාල කරුණු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැදගත්කම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අවබෝධ කරගෙන ඇත. එබැවින් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පුළුල් වශයෙන් සංවිධානය කිරීමෙන් සමාජයට ඵලදායි සේවාවක් සපයන බව අවබෝධ කරගෙන ඇත. විදුලි සංදේශ සේවා නිසි පරිදි භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳව මහජනතාව දැනුවත් කළ යුතු බව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව දැඩි ලෙස විශ්වාස කරන අතර එය නියාමකයෙකුගේ සමාජමය වගකීමක් ලෙස සැලකේ.

1. පොලිස් නිලධාරින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන:
   ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විශේෂයෙන් විදුලි සංදේශනය ආශ්‍රිතව අපරාධ පරීක්ෂණ සෘජුව මෙහෙයවන පොලිස් නිලධාරින් සඳහා එකී දින වැඩමුළුවක් පවත්වන ලදී. මෙම වර්ෂය තුළ සම්පත් දායකයින්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන් සහ සේවා සැපයුම්කරුවන්ගේ සහභාගිත්වයෙන් වැඩමුළු දෙකක් පවත්වා ඇත.මීට අමතරව, විදුලි සංදේශ අංශය ආශ්‍රිත දේශන කටාන ජාතික පොලිස් ඇකඩමියේ,කළුතර පොලිස් පුහුණු විද්‍යාලයේ, මිරිහාන පොලිසියේ නිලධාරින්, කොළඹ විශේෂ කාර්ය බලකාය සහ ශ්‍රී ලංකා යුධ හමුදාව සඳහා පවත්වන ලදී.

2. ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන

   අපගේ අත්දැකීම් වලට අනුව මහජනතාවට සන්නිවේදනය සහ මාධ්‍ය සදාචාර සම්පන්නව භාවිතා කිරීම පිළිබඳව නිසි දැනුවත්භාවයක් තිබීම අවශ්‍ය වේ.එබැවින් පාරිභෝගික පැමිණිලි සහ මහජනතාව දැනුවත් කිරීමේ ඒකකය විසින් රටේ පරිපාලන ඒකකයේ පහලම මට්ටම ලෙස පිළිගැනෙන ග්‍රාම නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ආරම්භ කර ඇත. මෙම වැඩසටහන අනුව ප්‍රජාව සමඟ සෘජු සම්බන්ධතා පවත්වන ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල රැසක පවත්වන ලදී.වැඩමුළුවේදී ගත් වැදගත් තීරණ ප්‍රකාශ කරන ලද අතර පසු විපරම් කරුණු ප්‍රාදේශිය ලේකම් මගින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.මෙමගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 64ක් ආවරණය විය.

3. පාසල් විදුහල්පතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන්:

   පසුගිය වසරේදී අපට පාසැල් විදුහල්පතිවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් හතරක් පමණ පැවැත්වීමට හැකිවිය.

4. පුවත්පත් ලිපි, මෙම දැනුවත් කිරීමේ වැඩසටහන්වල කොටසක් වශයෙන්, පුවත්පත් ලිපි 40කට ආසන්න සංඛ්‍යාවක් ප්‍රසිද්ධ කරන ලදී.

5. රූපවාහිනි/ගුවන් විදුලි වැඩසටහන්: මහජනතාව දැනුවත් කිරීම සඳහා රූපවාහිනි වැඩසටහන් රැසක් පවත්වා ඇත.

6. පොස්ටර් සහ අත් පත්‍රිකා:

   ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සන්නිවේදනය යහපත් ආකාරයෙන් භාවිතා කිරීම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම උදෙසා පෝස්ටර් සහ අත්පත්‍රිකා ව්‍යාපාරයක් පවත්වා ඇත.

7. පාරිභෝගික ආරක්ෂණ නිර්නායක:

   පාරිභෝගික හිතකර පරිසරයක් නිර්මාණය කිරීම පිණිස පාරිභෝගික සම්බන්ධතා ඒකකය විසින් "පාරිභෝගික ආරක්ෂණ නිර්නායක" සකස් කරනු ලබයි.

## 4.5 විශේෂ ව්‍යාපෘති අංශය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආයතනික සැලැස්ම ප්‍රකාරව විශේෂ ව්‍යාපෘති අංශය ජාතික යහපතට මං සැලසෙන ව්‍යාපෘති මෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේලා වගකියනු ලැබේ. ප්‍රධාන වශයෙන් අවශ්‍ය යටිතල පහසුකම් සපයමින් විදුලි සංදේශ කර්මාන්තය වැඩි දියුණු කිරීම, ගොඩනැගිලි යනාදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ශ්‍රී ලංකා විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නව තාක්ෂණයක් හඳුන්වාදීමට ඉවහල්වන පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරීම සහ පරිහරණය කරන්නන්ගේ අත්දැකීම් ප්‍රවර්ධන කිරීම, විශේෂ ව්‍යාපෘති අංශයේ විෂය පථය යටතට ගැනෙන විශේෂ ව්‍යාපෘති ඉලක්ක විෂය ක්ෂේත්‍ර ක්‍රියාත්මක කිරීම මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

විශේෂ ව්‍යාපෘති අංශය විසින් 2017 වර්ෂයේදී කොළඹ නෙළුම් කුළුන, හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන ගොඩනැගිල්ල

පුළුල් කිරීම පිණිස ප්‍රධාන කාර්යාල නව ගොඩනැගිල්ල ඉදිකිරීම සහ කදිරාන නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී. ණය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන් වන (CEIEC, ALIT සහ සීමාසහිත තුඩාවේ සහෝදරයෝ (පෞද්ගලික)සමාගම) සහ EXIM බැංකුව හා අවශ්‍ය අනුමැතිය, සේවා සම්බන්ධතාවයන්, ගෙවීම් සහ ව්‍යාපෘති ආශ්‍රිත වැඩිදියුණු කිරීම් සඳහා භාණ්ඩාගාරය, රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, මහ නගර සභාව, ජල සම්පාදන මණ්ඩලය, ලංකා විදුලි බල මණ්ඩලය, නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා පොලීසිය, ආගමන විගමන දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය ඇතුළු අදාල රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම විශේෂ ව්‍යාපෘති අංශයේ ප්‍රධාන කාර්යයන් වේ.

ව්‍යාපෘති පාලනය කිරීම ව්‍යාපෘතිය භාර ඉංජිනේරු, ව්‍යාපෘති කමිටුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද කේවල් කිරීමේ කමිටුව සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සිදු කරන ලදි. මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති ඒකකය කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතියේ ඉංජිනේරු වන අතර, හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතියේ ඉංජිනේරු වශයෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව ක්‍රියා කරයි.

විශේෂ ව්‍යාපෘති අංශය ඉහත කමිටු වලින් සිදු කරන සියළුම තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් කටයුතු කරන අතර ව්‍යාපෘතියේ කාර්යභාරය නිසි පරිදි සිදු කිරීමට හැකි වන පරිදි ක්‍රමවත්ව රැස්වීම් පැවැත්වීමට කමිටු වලට පහසුකම් සපයා ඇත.

**කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය**

නගරය කේන්ද්‍රගතව පිහිටි විකාශන කුලුනු ලෝකයේ සියළුම සංවර්ධිත නගරවල දක්නට ලැබෙන පොදු ලක්ෂණයකි. රූපවාහිනි සහ ගුවන් විදුලි විකාශන වැඩසටහන් ඉදිරිපත් කිරීමට සහායවීම සහ විදුලි සංදේශ ජාල සඳහා කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම එවැනි ජාලවල ප්‍රධාන අරමුණ වේ.

එක් දිශාවක සිට,තනි ඇන්ටනාවක් භාවිතා කර, විකාශන සංඥා නිසි ලෙස භාර ගැනීම මහජනතාවට සැලසෙන ප්‍රධාන ප්‍රතිලාභයක් වන අතර, එවැනි සංවර්ධනය කිරීම් මගින් යටිතල පහසුකම් හුවමාරු කර ගැනීමට ඉඩ සැලසෙන බැවින් ප්‍රාග්ධනය සහ මෙහෙයුම් වියදම් අඩුවීම විකාශන සමාගම් වලට ලැබෙන ප්‍රධාන ප්‍රතිලාභ අතර වේ.

නගරය කේන්ද්‍රගතව ස්ථාපිත විකාශන කුලුනු මගින් නගරයේ ක්ෂිතිජයට අලංකාර පෙනුමක් ලැබෙන අතර, කොළඹ නගරයේ පවත්වන ගැටළුවක් වන, අහස උසට නැගුනු විකාශන කුලුනු අවම වීමෙන් නගරයේ අහස් ක්ෂිතිජයේ දර්ශනීය බව වැඩිදුරටත් වැඩිදියුණු වීමට ඉවහල් වේ.

සංකේතයක් බවට පත්වී ඇති නගරය කේන්ද්‍රගත විකාශන කුලුනු නගර මධ්‍යයේ ස්ථාපනය කරනු ලබන අතර ඉඩම් වටිනාකම ඇතුලු සංවර්ධන පිරිවැය බොහෝ දුරට ඉහල අගයක් ගනී. එබැවින් ආයෝජන තහවුරුකර අවශ්‍ය ආදායම නිසැක කර ගෙන කුලුනු සංකීර්ණයේ භාවිතය වැඩිදියුණු කිරීම සහ කුලුනු සංකීර්ණයේ මෙහෙයුම් පවත්වාගෙන යාම පිණිස ඉහල උන්නතාංශ නැරඹුම් මැදිරි, ආපන ශාලා, සාප්පු සංකීර්ණ වැනි ආකාර්ශනීය ස්ථාන රැසක් එකතු කරනු ලැබේ.

කොළඹ නෙළුම් කුලුනේ ප්‍රධාන ආකර්ශනීය ස්ථාන

- කොළඹ නගරය සහ ඊට තදාසන්න ප්‍රදේශවල අවට දර්ශනය අත්විඳිය හැකි පරිදි නරඹන්නන් සඳහා ඉහල උන්නතාංශයකින් යුතු නැරඹුම් මැදිරි
- උත්සව ශාලා දෙකක් -විවාහ මංගල උත්සව, සමාජ සහ ආයතනික කටයුතු
- විශේෂ අමුත්තන් සඳහා නවාතැන් පහසුකම් සැපයීම, භෝජනශාලා මෙහෙයුම් වලට සහාය කර ගැනීම පිණිස රජයේ තානායම
- විශාල සාප්පු සංකිරීණ සහ ආහාර භෝජනාගාර
- කැරකෙන අවන්හල්
- කොළඹ නගරය සහ තදාසන්න ප්‍රදේශවල විකාශන පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීම, එෆ්.එම් නාලිකා 50, ඩිජිටල් වීඩියෝ විකාශන සේවා 50 සේවා සැපයිය හැකි විකාශන කුලුනු.
- මහජනතාවට විවේකය ගතකළ හැකි පරිදි විශාල උද්‍යානයක්.

***වගුව 11: කොන්ත්‍රාත්තුව පිළිබඳ සාරාංශය- නෙළුම් කුලුන ව්‍යාපෘතිය***

| | |
|---|---|
| සේවා දායකයා(ආයෝජක) | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව |
| කොන්ත්‍රාත්කරු | CEIEC සහ ALIT |
| කොන්ත්‍රාත් වර්ගය | සැලැස්ම සහ ගොඩනැගිල්ල |
| ව්‍යාපෘති ඉංජිනේරු | මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන ඒකකය |
| කොන්ත්‍රාත් මුදල | ඇමරිකානු ඩොලර් මිලියන 104.3 |
| ආරම්භ කරන ලද දිනය | 2012 නොවැම්බර් 16 |
| කොන්ත්‍රාත් ව්‍යාපෘතිය අවසන් කරන දිනය | 2017 ඔක්තෝම්බර් 31(දින 912 මුල් ඉදිකිරීමේ කාලය+ශ්‍රී.වි.සං.නි.කො.ස. ප්‍රදානය කරන ලද දීර්ඝ කිරීමේ කාලය) |
| ප්‍රධාන කොන්ත්‍රාත්කරු සහ ව්‍යාපෘති ඉංජිනේරු විසින් ව්‍යාපෘතිය අවසන්කර භාරදීමට අපේක්ෂිත තාවකාලික දිනය | 2018 මැයි 31 |

*වගුව 12 : නෙළුම් කුලුන ව්‍යාපෘතියේ ප්‍රගතිය*

| විස්තරය | සම්පූර්ණ කරන ලද ප්‍රමාණය % |
|---|---|
| ඇන්ටනා ආධාරකය | 100% |
| ආධාරක පාදම පිරිසිදු කිරීම සහ පින්තාරු කිරීම | 80% |
| කුලුනු ශීර්ෂය සවි කිරීම | 97% |
| කුලුනු බඳ පින්තාරු කිරීම | 42% |
| අභ්‍යන්තර අලංකරණය | 50% |
| කුලුනු ශීර්ෂයට විදුලිය සැපයීම | 58% |
| කුලුනු ශීර්ෂයට ගිනි ජලය සැපයීම | 17% |
| කුලුනු ශීර්ෂයට ජලය සැපයීම සහ ජලපවාහනය | 60% |
| කුලුනු පාදමේ විදුලිය ස්ථාපනය කිරීම | 73% |
| කුලුනු පාදමට විදුලිය සැපයීම හා ජලපවාහනය | 66% |
| බාහිර විදුලි සැපයීම | 12% |
| කුලුනු පාදමේ ඉහල | 82% |
| කුලුනු ශීර්ෂය,පාදම සහ බඳ ආලෝකකරණය | 40% |
| විදුලි සෝපාන සහ විදුලි පියගැටපෙල | 50% |
| ගොඩනැගිලි කළමණාකරන තොරතුරු පද්ධතිය | 30% |

**හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානය**

අමාත්‍ය මණ්ඩලය විසින් 2012.06.14 දිනැති අංක 12/0836/501/019 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සලකා බලා 2012 ජුලි 04 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළැඹි තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථාන ව්‍යාපෘතිය(හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතිය) ස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. ව්‍යාපෘතියේ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව KPMG විගණන ආයතනය විසින් සකස් කරන ලද අතර තිරසාර පදනම මත වාණිජමය වශයෙන් ලාභ ලැබිය හැකි ව්‍යාපෘතියක් බවට පත් කිරීමෙහිලා වාණිජමය හවුල්කරුවන් සහ බදුකරුවන් සොයා ගැනීමේ වගකීම සහිතව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අනුග්‍රාහකත්ව නියෝජිතායතනය විය.

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRPC) ව්‍යාපෘති ඉංජිනේරු වශයෙන් පත්කරන ලද අතර අනුමත ටෙන්ඩර් පටිපාටිය මත, සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ(පෞද්ගලික) සමාගම වෙත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 2014 ජුලි 11 දින සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම වෙත වැඩබිම බාර දෙන ලද අතර ඉදිකිරීමේ වැඩ 2016 අගෝස්තු 11 දින ආරම්භ කරන ලදී.කොන්ත්‍රාත්තු කාලය දින 730කි.

සැලසුම්කර ඇති පරිදි, 2015 ජුනි වන විට ගොඩනැගිල්ලේ තෙවන මහල දක්වා සැලකිය යුතු පමණකින් ගොඩනැගිලි ව්‍යුහය සම්පූර්ණ කරන ලදී. නමුත් මෙම ප්‍රදේශයේ වෙනත් සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කල ආකාරයට ආරම්භවී නොතිබූ අතර, එය තොරතුරු තාක්ෂණ උද්‍යානයෙන් අපේක්ෂිත විවිධ ආදායම් උත්පාදන හැකියාවන් කෙරෙහි අහිතකර අන්දමට බලපානු ඇති බව ශ්‍රී ලංකා විදුලි

සංදේශ නියාමන කොමිෂන් සභාව, ආයෝජන මණ්ඩලය හා ජනාධිපති ලේකම් කාර්යාලය නිරීක්ෂණය කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මෙකී ව්‍යාපෘතිය ආශ්‍රිත කරුණු පරීක්ෂා කරන ලද අතර එම ගොඩනැගිල්ලේ තෙවන මහල දක්වා ඉදිකිරීම් අවසන් කිරීමට තීරණය කෙරිණි.

මෙම ව්‍යාපෘතියේ ඉංජිනේරු උපදේශක වශයෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව(SLLRDC) ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ කටයුතුවල තිරන වන අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ සීමාසහිත තුඩාවේ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම අතර එලැබුණු කොන්ත්‍රාත්තුව අවසන් විය. එබැවින් ව්‍යාපෘති ඉංජිනේරු වන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නිර්දේශය ප්‍රකාරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට සීමාසහිත තුඩාවේ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම සමගවූ කොන්ත්‍රාත්තුව අවසන් කිරීම හැර වෙනත් විකල්පයක් නොතිබිණි.

### 2017 දෙසැම්බර් 31 දින වන විට තොරතුරු තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතියේ වර්තමාන තත්වය

කොන්ත්‍රාත්කරු 2016 සැප්තැම්බර් 26 දින ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත වැඩබිම භාරදී ඇති අතර, එතැන් සිට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ආරක්ෂක කටයුතු සහ විදුලිය සඳහා මාසිකව රු.300,000/- දළ පිරිවැයක් දරමින් මෙම වැඩබිම නඩත්තු කරනු ලබයි.

ආර්ථික කළමණාකරනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාව විසින් දෙන ලද නියෝගය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, රාජ්‍ය හා පෞද්ගලික හවුල් පදනම මත මෙම ව්‍යාපෘතිය දියුණු කරමින් ඉදිරියට පවත්වාගෙනයාමේ හැකියාව මේ වන විට සලකා බලමින් පවතී.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පුවත්පත් දැන්වීමක් මගින් මේ පිළිබඳව උනන්දුවක් දක්වන සමාගම් වලින් දැනටමත් යෝජනා කැඳවනු ලැබීය. Toppan Forms (Colombo) Limited විසින් තොරතුරු තාක්ෂණ උද්‍යාන පරිශ්‍රය තිබෙන තත්වයෙන් වසර 10කට බදු පදනම මත ලබාගෙන අවශ්‍ය වැඩිදියුණු කිරීම් කිරීමට ඉදිරිපත් කරන ලද යෝජනාව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ලැබිණි.

### කොළඹ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පුළුල් කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කළමනාකාරිත්වය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය සඳහා පස්මහල් නව ගොඩනැගිල්ලක් යෝජනාකර ඇති අතර කොමිෂන් සභාව විසින් එම යෝජනාව අනුමත කරන ලදී. මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන ඒකකය ඉහත ව්‍යාපෘතිය සඳහා උපදේශකයෙකු වශයෙන් පත්කරන ලද අතර

මෙම අවශ්‍යතාවය සඳහා සුදුසු ගොඩනැගිල්ලක් සැලසුම් කරන ලෙස ව්‍යාපෘති උපදේශන ඒකකයෙන් ඉල්ලා සිටින ලදී.ව්‍යාපෘති උපදේශන ඒකකය මෙම යෝජිත ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 344 (මුළු ඉදිකිරීමේ ඇස්තමේන්තු පිරිවැයෙන් 5% උපදේශන ගාස්තුවත් ඇතුලත්ව) ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කළමනාකාරිත්වය විසින් දැනට පවතින ප්‍රධාන ගොඩනැගිල්ලට යාබදව වානේ වලින් සැදුම්ලත් පස්මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට තීරණය කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ නිර්මාණාත්මක ආකර්ෂණය,වැඩි පහසුව සහ ආරක්ෂාව සැපයීම පිණිස ප්‍රධාන ගොඩනැගිල්ල සහ පාලන ගොඩනැගිල්ල යා කරන පාලම් ප්‍රතිසැලසුම් කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 2018 වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරයි.

**නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ පරමාර්ථ අරමුණ සහ ප්‍රතිලාභ**

මෙම සංවර්ධන ව්‍යාපෘතියේ අපේක්ෂිත පරමාර්ථ සහ අරමුණු පහත දැක්වේ.

i. නියාමන සේවා ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත දිනපතා පැමිණෙන පොදු මහජනතාව, ක්‍රියාකරුවන් සහ විකාශන සමාගම් සඳහා වඩා ප්‍රශස්තව සහ කාර්යක්ෂමව සේවා පහසුකම් සැපයීම.
ii. ඵලදායිත්වය සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා යටිතල පහසුකම් අවශ්‍යතාවයන් සැපයීම.
iii. කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ පිරිවැය ඉතිරි කිරීමේ අරමුණු ඇතිව පරිශ්‍රය තුල රැස්වීම් සහ සම්මන්ත්‍රණ සඳහා පහසුකම් ප්‍රවර්ධනය කිරීම.

මෙම සංවර්ධන ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ප්‍රතිලාභ පහත දැක්වේ.

අ) මහජනතාව සඳහා වඩා ප්‍රශස්ථ සේවාවක් සැපයීම පිණිස අංශ ඵලදායි ලෙස ප්‍රතිසංවිධානය කිරීම.
ආ) මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්,සම්මන්ත්‍රණ සහ වැඩමුළු යනාදිය සඳහා වඩා උචිත ස්ථානයක් සැපයීම.
ඇ) ජාතික යහපත සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු ඉඩම් දේපල නිසි ලෙස පරිහරණය කිරීම.

**ව්‍යාපෘතියේ ප්‍රගතිය**

- සංවර්ධනය කිරීමේ බලපත්‍ර/ය ලබාගැනීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී.
- ආරම්භක සැලැස්ම සම්පූර්ණ කරන ලදී.

**කදිරාන ප්‍රතිසංස්කරණය සහ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය**

කලාපීය මට්ටමින් UHF/VHF ගුවන් විදුලි සංඛ්‍යාත විශ්ලේෂණ අවශ්‍යතාවයන් මෙන්ම ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් HF (අධි සංඛ්‍යාත) පිරික්සීම සහ දිශා නිර්ණය කිරීම සපුරාලීම පිණිස කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය පිරික්සුම් සහ දිශා - නිර්ණය කිරීමේ උපකරණ සහ පද්ධති වලින් සමන්විත වී ඇත. මෙම මධ්‍යස්ථානය HF පිරික්සීම සහ දිශාව නිර්ණය කිරීම සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලියාපදිංචි වී ඇත.

ලෝක බැංකු අරමුදල් ව්‍යාපෘතිය යටතේ Rohde සහ Schwarz විසින් සපයන ලද උපකරණ සහ පද්ධති ක්‍රියාත්මක කරමින්, 2000 දශකයට පෙර කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය ඉහල ප්‍රමිතියකින් යුතු පිරික්සුම් මධ්‍යස්ථානයක් බවට වැඩි දියුණු කරන ලදී.

ස්වාධීන අංග සම්පූර්ණ ප්‍රාදේශීය පිරික්සුම් මධ්‍යස්ථානයක් වශයෙන් කදිරාන පිරික්සුම් මධ්‍යස්ථානයේ නිල කාර්යයන් සිදු කිරීම පිණිස එක් ඉංජිනේරුවරයකු සහ විදුලි සංදේශ නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත පරිපාලන කාර්ය මණ්ඩලයක් සේවය කරන අතර, ජංගම සංඛ්‍යාත පිරික්සුම් ආවේක්ෂණ රථයක් (MFMSV) සහ ඩබල් කැබ් රථයකින් සමන්විතය. ප්‍රධාන කාර්යාලයේ හදිසි කාර්ය මණ්ඩල අවශ්‍යතාවයන් නිසා මීට වසර කිහිපයකට පෙර ප්‍රධාන කාර්යාලයේ බලධාරීන්ට මෙම මධ්‍යස්ථානය ඵලදායී ලෙස මෙහෙයවන ලද කාර්යමණ්ඩලය සහ වෙන් කරන ලද වාහන නැවත ගෙන්වා ගැනීමට සිදු විය.

ලෝක බැංකු අරමුදල් සපයන ව්‍යාපෘති යටතේ 2000 දශකය ආරම්භයේදී ලබාගත් භෞතික සහ පිරික්සුම් උපකරණ පසුගිය දශකය පුරා ක්‍රමිකව යල්පැන ගිය තත්ත්වයට පත් විය. මහජනතාව විසින් පිරික්සුම් මධ්‍යස්ථානය පිහිටි ඉඩම අනවසරයෙන් අල්ලා ගන්නා ලද අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කළමනාකාරීත්වය විසින් ඉතිරි ඉඩම් කැබැල්ල (අක්කර 53 ක් පමණ) සඳහා පිරික්සුම් මධ්‍යස්ථාන මායිම් සීමාකිරීමට තීරණය කරන ලදී. ඉතිරි ඉඩම් කැබැල්ල ආරක්ෂා කිරීම පිණිස ඉඩමෙන් ගලන ඇල මාර්ගය ඔස්සේ වෙන් වූ ස්ථාන දෙක සම්පූර්ණ කිරීමෙන් තොරව ආරක්ෂක තාප්පයක් ඉදි කරන ලදී. මෙම ආරක්ෂක තාප්පයේ කොටසක් කඩා වැටීමට ආසන්න අතර වැසි ජලය ගලා යාම සඳහා ඉඩකඩ සැලසීම පිණිස ගම්වාසීන් විසින් එම තාප්පයේ ස්ථාන කිහිපයකට හානි කර ඇත.

ලෝක බැංකු අරමුදල් ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද අධි සංඛ්‍යාත දිශා නිර්ණය කිරීමේ (HFDF) පද්ධතිය හැර සෙසු උපකරණ පරිභෝජනය කළ හැකි කාලය, නව තාක්ෂණයට අනුකූලවීම, නවීන පිරික්සුම් විශේෂාංග පහසුකම් ලබා ගැනීමට නොහැකිවීම පිළිබඳව අවධානය යොමු නොකරමින් තවමත් භාවිතයේ පවතී. එමෙන්ම ජාතික හා පැවති තීරණාත්මක වැදගත්කම නිසා ප්‍රමුඛතාවය දිය යුතු

කරුණක් ලෙස සලකා 2015 වසරේදී අධි සංඛයාත දිශා නිර්ණය කිරීමේ පද්ධතිය ප්‍රතිස්ථාපනය කරන ලදී.

පසුගිය දශකය පුරා නොසලකා හැර තිබූ ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත පහසුකම් නවීකරණය සහ ප්‍රතිසංස්කරණය කළ යුතුව ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ප්‍රධාන භූගෝලීය විෂය ක්ෂේත්‍ර වලට ඉවහල් කර ගැනීම සඳහා මෙහෙයුම් පහසුකම් ව්‍යාප්ත කිරීම පිණිස දීප ව්‍යාප්ත පදනමක් මත ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇත. කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය ප්‍රදේශීය කාර්යාලයක් ද වනු ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, කදිරාන පිරික්සුම් මධ්‍යස්ථානය නවීකරණය සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ලංසු ලියකියවිලි, ඉංජිනේරු ඇස්තමේන්තුව, සැලසුම් සහ නිර්මාණ ඉදිරිපත් කරන ලෙස මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන ඒකකයෙන් ඉල්ලා සිට ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තාක්ෂණික, පරිපාලන සහ සහායක කාර්ය මණ්ඩලයක් සහිතව කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථාන පරිශ්‍රයේ ප්‍රාදේශීය කාර්යාලයක් ස්ථාපනය කිරීමට අපේක්ෂා කෙරේ. එබැවින්, කාර්ය මණ්ඩලයේ නවාතැන් පහසුකම් සැලකිල්ලට ගෙන ස්ථිර ප්‍රාදේශීය කාර්යාලයක් සඳහා අවශ්‍ය සුදුසු පහසුකම් සැපයීමට යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම අවශ්‍ය කෙරේ. කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානයේ සැලකිය යුතු කොටසක් විවිධ පුද්ගලයන් විසින් අනවසරයෙන් අත්පත් කරගෙන ඇති බැවින් වැඩි දුරටත් ඉඩම බලෙන් අල්ලා ගැනීමෙන් මුදවා ගැනීම පිණිස ඵලදායී පියවර ගැනීම වැදගත්ය. එමෙන්ම ශක්තිමත් ආරක්ෂක තාප්පයක් සම්පූර්ණ කිරීම සහ ආරක්ෂක මුර පොලක් ස්ථාපනය කිරීම අවශ්‍යය.

මෙම සන්දර්භය තුළ , ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනාගත ඉලක්ක සපුරා ගැනීම සඳහා පහත නවීකරණයන් සහ ඉදිකිරීම් යෝජනා කෙරේ.

i. පවත්නා ආරක්ෂක පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම.
ii. පවත්නා ලේඛනාගාරය ප්‍රතිසංස්කරණය කිරීම.
iii. අනවශ්‍ය ගරාවැටුන ගොඩනැගිලි ඉවත් කිරීම.
iv. පවතින නිල නිවාස ප්‍රතිසංස්කරණය කිරීම.
v. පවතින පිරික්සුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම.
vi. ආරක්ෂක තාප්පය සම්පූර්ණ කිරීම සහ අවශ්‍ය පාලම් ඉදිකිරීම.
vii. නව කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම.
viii. ආරක්ෂක මුරපොල ස්ථාපනය කිරීම (අභ්‍යන්තර පාරවල්වල නව ප්‍රවේශ ගේට්ටුව, ආරක්ෂක කටයුතු සඳහා වැඩබිම අවම ඇවිදීමේ මංතීරු)
ix. ඉහළ පවතින වතුර ටැංකිය ප්‍රතිසංස්කරණය කිරීම.

පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම පිණිස මෙම අවශ්‍යතාවයන් මොරටුව විශ්ව විද්‍යාලය වෙත යොමු කරන ලදී. ක්ෂේත්‍ර වැඩබිම පරීක්ෂා කිරීමෙන් අනතුරුව මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන කමිටුව විසින් ඉහත 4.1 සිට 4.x දක්වා දැක්වෙන නවීකරණයන් සහ ඉදිකිරීම් සඳහා රු.186,968,098.00 (රුපියල් එකසිය අසූහය මිලියන නවසිය හැට අට දහස් අනූ අට) වටිනාකමකින් යුත් ව්‍යාපෘතිය සඳහා ගොඩනැගිලි සැලසුම් , ලංසු ලියකියවිලි සහ ඉන්ජිනේරු ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇත. මෙම ඇස්තමේන්තුවට අවිනිශ්චිත වියදම්, කොන්ත්‍රාත්කරුගේ ලාභය සහ ආන්තික වියදම් වලින් 10% අන්තර්ගත වේ.

ප්‍රවේශ ගේට්ටුව, අභ්‍යන්තර මාර්ග, වැඩබිම අවට ඇවිදීමේ මං තීරුවල විස්තරාත්මක සැලැස්ම සහ ප්‍රමාණික බිල්පත් ලැබිය යුතුව පවතින අතර ඇස්තමේන්තු ලැබී ඇත. මහාචාර්ය සමිත මානවඩු දැනුම් දී ඇත්තේ සමාලෝචනය කිරීම සඳහා මෙම ලියකියවිලි තාක්ෂණ ඇගයීමේ කමිටුව වෙත සෘජුවම ඉදිරිපත් කිරීම ඔහුගේ සැලැස්ම වන බවයි.

මෙම සංවර්ධන ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු සහ පරමාර්ථ පහත දැක්වේ.

i. කදිරාන ප්‍රාදේශීය කාර්යාලය පුළුල් කළ යුතු බැවින් අපේක්ෂිත කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
ii. වැඩබිමේ ආරක්ෂාව වැඩි දියුණු කිරීම.
iii. පිරික්සුම් උපකරණ සඳහා ආරක්ෂක ඉඩකඩ සැපයීම.
iv. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ වර්තමානයේ පවත්නා අධික වැඩ කොටස් අවම කරමින් වඩා ප්‍රශස්තව සහ කාර්යක්ෂමව නියාමන සේවා සැපයීම මෙන්ම යෝජිත කදිරාන කාර්යාලය, කටුනායක ගුවන්තොටුපලේ සිට දිවයිනට පැමිණෙන සිය විදුලි සංදේශ උපකරණ ආනයනය කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් නිශ්කාශන ලිපි ලබා ගැනීමට අවශ්‍ය මගීන්ට මෙන්ම මීගමුව සහ ඒ අවට ප්‍රදේශවල ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් සංඛ්‍යාත බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය තැනැත්තන්ට පහසු ස්ථානයක් වනු ඇත.
v. දේශීය / ජාත්‍යන්තර රැස්වීම් සහ සම්මන්ත්‍රණ සඳහා ස්ථානය සැපයීම.
vi. වැඩි දුරටත් අනවසරයෙන් ඉඩම අත්පත් කර ගැනීමෙන් ආරක්ෂා කර ගැනීම.

**මෙම සංවර්ධන ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ප්‍රතිඵල**

අ. ප්‍රාදේශිය කාර්යාලය මගින් වහජනතාව සඳහා ඵලදායී, විමධ්‍යගත වූ සේවා සැපයීම.

ආ. ප්‍රාදේශීය මට්ටමින් අවහිරතාවයන් සහ දෛනික පිරික්සුම් ක්‍රියාකාරකම් වල නිරතවීම.

ඇ. නීති විරෝධී ආකාරයෙන් සංඛ්‍යාත පරිහරණය කරන්නන් හඳුනා ගැනීම පිණිස ධාරිතාවය ඉහළ නැං වීම.

ඈ. මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් , සම්මන්ත්‍රණ සහ වැඩමුළු යනාදිය සඳහා සුදුසු ස්ථානයක් සැපයීම.

ඉ. ජාතික යහපත සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු ඉඩම සහ දේපල නිසි ලෙස පරිහරණය කිරීම.

**කොළඹ විනෝදාස්වාදය සපයන උද්‍යානය**

කොළඹ නෙළුම් කුලුන සංකීර්ණය ආශ්‍රිතව අවට ප්‍රදේශය සංවර්ධනය කිරීම දිගු කාලීනව සියළුම පාර්ශවකරුවන්ට එහි ප්‍රතිලාභ උපරිමව ලබා ගැනීමට ඉතා වැදගත් වේ. කොළඹ නෙළුම් කුලුන සංකීර්ණය අවට ප්‍රදේශය, මේ වන විට, සංවර්ධිත නොවූ තත්ත්වයක පවතින අතර කොළඹ නෙළුම් කුලුන සංකීර්ණය අවට ප්‍රදේශය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රධාන සැලැස්මක් ඒකාබද්ධව සංවර්ධනය කිරීමෙහි ලා විශේෂයෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය (UDA) වැනි අදාළ රාජ්‍ය ආයතන සමග කටයුතු කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට කදිම අවස්ථාවක් උදාවී ඇති අතර, ඉදිරි වසර 75 තුළ මෙම සමස්ථ ප්‍රදේශය මහජන ආකර්ශණයට ලක් වූ ප්‍රදේශයක් බවට පත් වනු ඇත. කොළඹ නෙළුම් කුලුන සංකීර්ණය අවට සියළුම අක්‍රමවත් සංවර්ධනයන් එහි දිගුකාලීන සාර්ථකත්වයට දැඩි බලපෑමක් වනු ඇත.

කොළඹ නෙළුම් කුලුන සංකීර්ණයට යාබද ඉඩම විනෝස්වාදය සපයන පහසුකම් සහිතව බහුකාර්ය රථගාල සංකීර්ණයක් ලෙස වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පියවර ගෙන ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් ඉඩම වෙන් කිරීම දැනටමත් අනුමත කර ඇති අතර, නාගරික සංවර්ධන අධිකාරිය ඉඩම අත්පත් කර ගැනීම සහ පැවරීම සඳහා වග කියනු ලැබේ.

මෙම පැතිකඩ තුළ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මී ළග කාර්යය වන්නේ සුදුසු ව්‍යාපාර සහ මූල්‍ය ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම සහ රටම ප්‍රතිලාභ ලබාදෙන ප්‍රශස්ත ක්‍රමය යෝජනා කරමින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම සහ විනිවිද භාවයෙන් යුතු පිළිගත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මත වෘත්තිමය ආයතනයක් මගින් සේවා මිලදී ගැනීමයි.

## 4.6 තරඟකාරීත්ව අංශය

තරඟකාරීත්ව අංශය විසින් පාරිභෝගිකයන්ගේ සහ දුරකථන ක්‍රියාකාර සමාගම් වල යහපත පිණිස කාර්යක්ෂම සහ පූර්ණ ස්වාධීන විදුලි සංදේශ සේවාවක් සැපයීමෙහි ලා නියාමන කටයුතු මෙහෙයවයි. මෙම අංශය විසින් සාධාරණ වූ ගාස්තු සහ ගුණාත්මක සේවා පවත්වාගෙන යන අතර අයක්‍රම, අන්තර්ජාල සේවා නියාමනය කිරීම, විදුලි සංදේශ කර්මාන්තයේ තොරතුරු ප්‍රසිද්ධ කිරීම, විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වල කාර්යසාධනය විශ්ලේෂණය කිරීම සහ අදාළ පාර්ශ්වයන් සඳහා අවශ්‍ය උපදෙස් සැපයීම සිදු කරනු ලැබේ. ඌන සංවර්ධිත ප්‍රදේශ සඳහා විදුලි සංදේශ පහසුකම් සැපයීම මෙම අංශය සිදු කරන තවත් එක් කාර්යයකි. මෙම අංශය විසින් විදුලි සංදේශ බදු, ජාත්‍යන්තර විදුලි සංදේශ බදු සහ සෙස බදු රැස් කරනු ලබයි. නව සේවා සපයන විදුලි සංදේශ තාකෂණය විකාශනය කිරීමෙහි ලා ක්‍රියා කරන විදේශීය විශේෂඥයින් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම දිරිගන්වමින් එම විදේශීය විශේෂඥයින්ගේ වීසා ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සහ අවසර ලබාදීම මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

තරඟකාරීත්ව අංශයේ කාර්යයන් පහත දැක්වේ.

- අයක්‍රම විශ්ලේෂණය කිරීම, පිරිවැය පාදක අයක්‍රම පිළියෙල කිරීම සහ නව අයක්‍රම යෝජනා පිරික්සීම.
- විශ්ලේෂණය කිරීම මගින් දුරකථන ක්‍රියාකාර සමාගම්වල මූල්‍ය සහ මෙහෙයුම් පරීක්ෂා කිරීම.
- විදුලි සංදේශ ක්ෂේත්‍රයේ විශ්ලේෂණයන් සිදු කිරීම.
- අන්තර් සම්බන්ධතාවය සම්බන්ධයෙන් ආර්ථිකමය කොන්දේසි ක්‍රියාත්මක කිරීම සහ අන්තර් දුරකථන ක්‍රියාකර නමාගම්වල අන්තර් සම්බන්ධීය වැඩපිළිවෙල අනුමත කිරීම.
- ග්‍රාමීය ප්‍රදේශ වල තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් පිළිබඳව කොමිෂන් සභාවට නිර්දේශ කිරීම.
- ග්‍රාමීය අංශයේ කටයුතු කඩිනම් කිරීම පිණිස ආර්ථිකමය දිරිගැන්වීම් යොදා ගැනීමට යෝජනා ඉදිරිපත් කිරිම.
- විදුලි සංදේශ කර්මාන්තයේ සංඛ්‍යාලේඛන තොරතුරු රැස්කිරීම සහ විශ්ලේෂණය කිරීම
- බදු සහ අයබදු රැස්කිරීම.
- ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ආශ්‍රිත ව්‍යාපෘතිවල නිරත විදේශීය විශේෂඥයින් සඳහා වීසා පහසුකම් සැපයීම.

මුළු කර්මාන්ත ආදායම: පහත ප්‍රස්ථාරයේ දැක්වෙන පරිදි 2017 වර්ෂය සඳහා මුළු කර්මාන්ත ආදායම රුපියල් බිලියන 209 ක් විය. ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම් වලින් ලැබුණු ආදායම සියයට 67 ක් වූ අතර, ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම් වලින් ලැබුණු ආදායම සියයට 29 කි. ඉතිරි සියයට 4 වෙනත් ආදායම් ලැබීම් විය.

*වගුව **13:** ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල මුළු කර්මාන්ත ආදායම*
***2011 – 2017** (රුපියල් මිලියන)*

| වර්ගය | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | වෙනස්වීම % 2012-2013 | වෙනස්වීම % 2013-2014 | වෙනස්වීම % 2014-2015 | වෙනස්වීම % 2015-2016 | වෙනස්වීම % 2016-2017 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජංගම | 101,704 | 111,586 | 119,144 | 125,120 | 137,770 | 139,990 | 10% | 7% | 5% | 10% | 2% |
| ස්ථාවර ප්‍ර වේශ | 43,403 | 46,318 | 48,652 | 51,138 | 55,591 | 59,718 | 7% | 5% | 5% | 9% | 7% |
| එකතුව | 145,107 | 157,904 | 167,796 | 176,258 | 193,361 | 199,708 | 9% | 6% | 5% | 10% | 3% |

*ප්‍රස්ථාරය **01:**ජංගම සහ ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම්වල මුළු කර්මාන්ත ආදායම **2011-2017***




පහත වගුවේ දැක්වෙන පරිදි පසුගිය වර්ෂය හා සන්සන්දනය කිරීමේදී ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ග්‍රාහක පදනම වර්ධනය වී ඇත.

*වගුව **14: 2012 – 2017** කාල පරිච්ඡේදය සදහා ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ග්‍රාහක පදනමේ සංඛ්‍යාව*

| වර්ගය | **2011** | **2012** | **2013** | **2014** | **2015** | **2016** | **2017** |
|---|---|---|---|---|---|---|---|
| **ජංගම** | 83,530 | 101,704 | 111,586 | 119,144 | 125,120 | 137,770 | 139,990 |
| **ස්ථාවර ප්‍රවේශ** | 43,660 | 43,403 | 46,318 | 48,652 | 51,138 | 55,591 | 59,718 |
| **එකතුව** | 127,190 | 145,107 | 157,904 | 167,796 | 176,258 | 193,361 | 199,708 |

| **වර්ගය** | වෙනස්වීම % **2011-2012** | වෙනස්වීම % **2012-2013** | වෙනස්වීම % **2013-2014** | වෙනස්වීම % **2014-2015** | වෙනස්වීම % **2015-2016** | වෙනස්වීම % **2016-2017** |
|---|---|---|---|---|---|---|
| **ජංගම** | 22% | 10% | 7% | 5% | 10% | 2% |
| **ස්ථාවර ප්‍රවේශ** | -1% | 7% | 5% | 5% | 9% | 7% |
| **එකතුව** | 14% | 9% | 6% | 5% | 10% | 3% |

**පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදාමේ සාමාන්‍යය**

ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම්වල පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය රු.4,977 ක් වූ අතර එය 2016 වර්ෂය සමග සන්සන්දනය කිරීමේදී සියයට 5 ක අඩුවීමකි. ස්ථාවර

දුරකථන ක්‍රියාකාර සමාගම්වල පරිභරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය රු.22,911 ක් වූ අතර එය සියයට 6 වැඩිවීමක් වේ. පසුගිය වසර 5 කාලපරිච්ඡේදය සඳහා සංඛ්‍යාලේඛණ පහත වගුවේ දැක්වේ.

*වගුව 15: 2013 – 2017 කාලපරිච්ඡේදය සඳහා ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල*

| වර්ගය | 2013 | 2014 | 2015 | 2016 | 2017 | වෙනස්වීම % 2013-2014 | වෙනස්වීම % 2014-2015 | වෙනස්වීම % 2015-2016 | වෙනස්වීම % 2016-2017 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ජංගම | 5,457 | 5,386 | 5,131 | 5,258 | 4,977 | -1% | -5% | 2% | -5% |
| ස්ථාවර ප්‍රවේශ | 17,112 | 17,954 | 19,659 | 21,691 | 22,911 | 5% | 9% | 10% | 6% |

**බදු වලින් පසු ශුද්ධ ලාභය/පාඩුව**: ජංගම දුරකථන මෙහෙයුම් වල බදු වලින් පසුව ශුද්ධ අලාභය රුපියල් මිලියන 1,960 වූ නමුත් ස්ථාවර ප්‍රවේශ මෙහෙයුම් වල බදු වලින් පසුව ශුද්ධ ලාභය රු. 1,577 ක් විය. පහත වගුවෙන් පසුගිය වසර 7 තුළ සංඛ්‍යාලේඛන දැක්වේ.

*වගුව 16: බදු වලින් පසුව ශුද්ධ ලාභය/(පාඩුව) 2011 – 2017 (රුපියල් මිලියන)*

| වර්ගය | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|
| ජංගම | (1,017) | (1,970) | (143) | 2,974 | (3,552) | 2,747 | 2,437 |
| ස්ථාවර ප්‍රවේශ | 1,285 | 3,304 | 2,964 | 1,723 | 898 | 688 | 1,897 |
| එකතුව | 268 | 1,134 | 2,821 | 4,670 | (2,654) | 3,435 | 540 |

**ආයෝජන**: ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම්වල ආයෝජනය රුපියල් මිලියන 36,119 ක් වූ අතර, එය පසුගිය වර්ෂය හා සන්සන්දනය කිරීමේදී සියයට 36 වැඩිවීමක් විය. ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල ආයෝජනය රුපියල් මිලියන 321,035 ක් වූ අතර, පසුගිය වර්ෂය සමග සන්සන්දනය කිරීමේදී එය සියයට 43 අඩුවීමක් විය. පහත වගුවෙන් එම සංඛ්‍යා ලේඛන දැක්වේ.

*වගුව 17: ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල මුළු කර්මාන්ත ආදායම 2010 – 2017 (රුපියල් මිලියන)*

| වර්ගය | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|
| ජංගම | 24,387 | 41,999 | 29,508 | 49,509 | 23,444 | 22,703 | 27,121 | 36,151 |
| ස්ථාවර ප්‍රවේශ | 9,646 | 14,055 | 20,610 | 19,052 | 21,640 | 26,245 | 58,963 | 42,112 |
| එකතුව | 34,033 | 56,054 | 50,118 | 68,561 | 45,085 | 48,948 | 80,084 | 78,263 |

**විදුලි සංදේශ බදු (TL):** 2011 වසරේදී විදුලි සංදේශ බදු හඳුන්වාදෙන විට සැපයුම් වටිනාකම සියයට 20 ක් විය. අන්තර් ජාල සේවා සඳහා බදු සියයට 10 වූ අතර අධිවේගී අන්තර් ජාල සේවා ප්‍රවර්ධනය කිරීම සඳහා එය සහනදායක අනුපාතයක් විය. 2014 වර්ෂයේදී විදුලි සංදේශ බදු සියයට 25 දක්වා වැඩි වූ නමුත් අන්තර් ජාල සේවාවල විදුලි සංදේශ බදු නොවෙනස්ව පැවතිණි. 2017 වර්ෂයේදී මෙම බදු අවලංගු වූ අතර එය අන්තර්ජාල සේවාවල ආදායම පහත වැටීමට හේතු වී ඇත.

*වගුව 18: 2012 සිට 2017 දක්වා විදුලි සංදේශ බදු (රුපියල් මිලියන)*

| වර්ෂය | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|
| විදුලි සංදේශ බදු | 17,263 | 18,450 | 26,055 | 27,859 | 30,346 | 29,133 |

*ප්‍රස්ථාරය 02: 2012 සිට 2017 දක්වා විදුලි සංදේශ බදු*




**සෙස් බදු:** විදුලි සංදේශ පනතට අනුව සෙස් බද්දක් එකතු කිරීම සිදුකර ඇති අතර පසුගිය වසර හය සඳහා වූ එකතු කිරීම් පහත පරිදි දැක්වේ.

*වගුව 19: සෙස් 2012 – 2017 (රුපියල් මිලියන)*

| වර්ෂය | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|
| මුළු සෙස් බදු | 3,515 | 3,500 | 3,652 | 3,841 | 4,067 | 4,212 |

*ප්‍රස්ථාරය 03: සෙස් රැස්කිරීම (2012 – 2017)*



**ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු (ITOL):** සෑම විදුලි සංදේශ ක්‍රියාකාර සමාගමක් විසින් විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC) වශයෙන්, ශ්‍රී ලංකාව තුළ ආරම්භ කරන හෝ අවසන් කරන ලැබෙන සහ පිටතට යැවෙන ඇමතුම් සඳහා විදුලි සංදේශ ක්‍රියාකරු බදු ලෙස හඳුන්වන බද්දක් ගෙවිය යුතුය. නව විදුලි සංදේශ තාක්ෂණය වැඩිදියුණු වීම නිසා Viber, WhatsApp, Massanger Skype සේවා යනාදී විදුලි සංදේශ සැපයුම්කාර සමාගම් විසින් අන්තර්ජාල සම්මුති ජාලයක් ඔස්සේ සේවා සැපයීමේ භාවිතාවන් (Over The Top – OTT) මගින් පාරිභෝගිකයන්ට ජාත්‍යන්තර ඇමතුම් ලබා ගත හැකිය. මෙම පරිවර්තනය අන්තර් ජාල හඬ භාවිතය පහත වැටීමට හේතු වී අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් විදුලි සංදේශ සංවර්ධන බදු රැස් කිරීම සැලකිය යුතු මට්ටමකින් පහත වැටී ඇත.

*වගුව 20: විදුලි සංදේශ සංවර්ධන ගාස්තු බදු රැස්කිරීම්*

| වර්ෂය | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තු බදු රැස් කිරීම් (රුපියල් මිලියන) | 5,861 | 8,689 | 6,202 |

**පිටතට යැවෙන දේශීය ප්‍රවේශ බදු (OLAC):** සියළුම පිටතට යැවෙන ඇමතුම් සඳහා ජාත්‍යන්තර දුරකථන ක්‍රියාකාර සමාගම් වලින් මිනිත්තුවකට රුපියල් 3.00 ක් අය කරනු ලබන අතර පසුගිය වර්ෂ තුන තුළ අය කරන ලද බදු පහත වගුවේ දැක්වේ.

*වගුව 21: පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු බදු රැස් කිරීම්*

| වර්ෂය | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු බදු රැස් කිරීම් (රුපියල් මිලියන) | 1,529 | 1,125 | 729 |

**ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය:** තොරතුරු ව්‍යුහය දිවයින පුරා ජනතාවට සහ ස්ථාන වලට ලැබෙන විට පුරවැසියන්ගේ දෛනික ජීවිත්ය දැනුවත් කිරීම සම්පූර්ණ වනු ඇත. එමෙන්ම පරිහරණය කරන ජනතාව, ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ජනවාර්ගිකත්වය සහ භාෂාමය වශයෙන් වෙනස් වන නිසා සන්නිවේදන සේවා වලට ප්‍රවේශ වීම සාධාරණ සහ දරාගත හැකි විය යුතුය. කාලානුරූපව සංශෝධනය කිරීම සහ පිරික්සීමට යටත්ව මෙම අරමුණ සඳහා වර්තමාන නවීන සන්නිවේදන තාක්ෂණය සමග ඉහළ සම්ප්‍රේෂණ වේගය ලබාගත යුතුය.

මේ අයුරින්, 2018 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නොදියුණු අඩු පහසුකම් සහිත ප්‍රදේශ වල සිය විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම පිණිස දුරකථන ක්‍රියාකාර සමාගම් ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව දිවයිනේ නොදියුණු සහ අඩු පහසුකම් සහිත ප්‍රදේශ වැඩිදුරටත් හඳුනා ගැනීම සඳහා ‘‘ගමට සන්නිවේදනය’’ නමින් 2017 වසරේදී අධ්‍යයනයක් සිදු කර ඇති අතර පොළොන්නරුව සහ කළුතර දිස්ත්‍රික්කවල නියමු සමීක්ෂණයක් පවත්වා ඇත. එහිදී රැස්කර ගන්නා ලද තොරතුරු පහත දැක්වේ.

*වගුව 22: ගමට සන්නිවේදනය සමීක්ෂණය 2017 (පොලොන්නරුව සහ කළුතර දිස්ත්‍රික්ක)*

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව | ග්‍රාම නිලධාරින් සංඛ්‍යාව | ග්‍රාම නිලධාරින්ගෙන් ලැබුණ ප්‍රතිචාර සංඛ්‍යාව | නොදියුණු ග්‍රාම නිලධාරි කොට්ඨාශ සංඛ්‍යාව | අඩු පහසුකම් සහිත ග්‍රාමනිලධාරි කොට්ඨාශ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| කළුතර | 14 | 789 | 697 | 6 | 60 |
| පොලොන්නරුව | 07 | 295 | 200 | 4 | 26 |
| මුළු එකතුව | 21 | 1084 | 897 | 10 | 86 |

මෙම ප්‍රදේශ දෙකේ නියමු ව්‍යාපෘතිය මගින් හඳුනාගත් නොදියුණු සහ අඩුපහසුකම් සහිත ප්‍රදේශවලට සේවය සැපයීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පියවර ගෙන ඇත.

**විදුලි සංදේශ / තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය:** ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නියාමන කරුණක් වශයෙන්, කොමිෂන් සභාව විදුලි සංදේශ/තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම හෝ ප්‍රතිචක්‍රීයකරණය කිරීම සඳහා විදුලි සංදේශ කර්මාන්තයේ නියැලෙන්නන් සහ මහජනතාව දිරිගැන්වීම සඳහා ක්‍රමෝපායන් හා මාර්ගෝපදේශන සලකා බලයි. මේ ආකාරයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අපද්‍රව්‍ය එක් රැස් කිරීමේ බඳුන් කොමිෂන් සභා පරිශ්‍රයේ දැනටමත් තබා ඇති අතර දිවයිනේ පුරා පිහිටි සිය පාරිභෝගික මධ්‍යස්ථානවල අපද්‍රව්‍ය එක් රැස් කිරීමේ බඳුන් තබන ලෙස සියළුම දුරකථන ක්‍රියාකාර සමාගම් වලින් ඉල්ලා ඇත. මේ සම්බන්ධයෙන් අබලි ස්ථාවර දුරකථන, ජංගම දුරකථන බැටරි සහ වෙනත් අබලි උපකරණ එක් රැස් කරන ලෙස ඉල්ලා ඇත. ජිනීවා හි පවත්වන ලද ITU – D අධ්‍යයන කණ්ඩායම 2 රැස්වීමේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අබලි විදුලි සංදේශ/තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උපකරණ බැහැර කිරීම සහ ප්‍රතිචක්‍රීයකරණය කිරීමෙහිලා ක්‍රියාකාරීව දායක වී ඇත. මේ සම්බන්ධයෙන් දරුවන් දැනුවත් කිරීම පිණිස පැසැල් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

**අයක්‍රම නියාමනය:** ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ බලාත්මක වන විදුලි සංදේශ පනත ප්‍රකාරව රජයේ ප්‍රතිපත්ති, නීති, රෙගුලාසි සහ මාර්ගෝපදේශන වලට යටත්ව දුරකථන ක්‍රියාකාර සමාගම්වල අයක්‍රම සැලැස්ම අනුමත කිරීම සඳහා බලධාරීත්වය පවරා ඇත. මේ ආකාරයෙන් "දිගු කාලීන පදනම" සහ "ප්‍රවර්ධන පදනම" නමින් හඳුන්වන අයක්‍රම සැලසුම් වර්ග 2 ක් තිබේ. කොමිෂන් සභාවේ නිශ්චය කිරීම් හෝ සංශෝධන හඳුන්වා දෙන තෙක් දිගු කාලීන පදනමේ අයක්‍රම සැලසුම් ක්‍රියාත්මක වේ. වෙළඳපල අවස්ථා පරීක්ෂා කිරීම සඳහා දුරකථන ක්‍රියාකාර සමාගම් වලට තාවකාලික අයක්‍රම සැලැස්මක් ඉදිරිපත් කළ හැකි අතර කොමිෂන් සභාව මාස තුනක කාලපරිච්ඡේදයක් සඳහා පැවැති සැලැසුම් අනුමත කරයි. දුරකථන ක්‍රියාකාර සමාගම තාවකාලික අයක්‍රම සැලසුම් අඛණ්ඩව පවත්වාගෙන යාමට කැමති වන්නේ නම්, එය දිගුකාලීන අයක්‍රම සැලැස්මක් බවට පත්වේ. 2017

වසරේදී අනුමත කරන මුළු අයක්‍රම සැලසුම් සංඛ්‍යාව 21 වන අතර, එයින් තුනක් දිගුකාලීන පදනමද සැලසුම් දහඅටක් ප්‍රවර්ධන පදනම මත ද වූහ. 2017 වර්ෂයේදී හඬ ඇමතුම සහ කෙටි පණිවුඩ සේවා පාදස්ථ මිල නොවෙනස්ව පැවතුණි.

**වීසා අයදුම්පත්‍ර නිර්දේශ කිරීම**: විදුලි සංදේශ කර්මාන්තයේ සීඝ්‍ර වෙනස්කම් සැලකිල්ලට ගනිමින් නව තාක්ෂණයට අනුව සිය සේවා සහ ජාල වැඩි දියුණු කිරීමට දුරකථන ක්‍රියාකාර සමාගම් උත්සාහ දරයි. මේ ආකාරයෙන් දුරකථන ක්‍රියාකාර සමාගම් විදේශීය විශේෂඥයන් සහ වෘත්තිකයන් සේවයට බඳවා ගන්නා අතර එම වීසා අයදුම්පත්‍ර නිර්දේශ කිරීම සහ අනුමැතිය සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. 2017 වර්ෂයේදී මෙම අංශය විසින් මෙවැනි ආකාරයේ වීසා අයදුම්පතු 395 ක කටයුතු සිදු කර ඇත.

**විදුලි සංදේශ කර්මාන්තයේ තොරතුරු මෙහෙයවීම**: විදුලි සංදේශ කර්මාන්තයේ දත්ත සහ තොරතුරු එක් රැස් කිරීම මෙම අංශයේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලැබේ. එමෙන්ම ඒ මත රාජ්‍ය ආයතන අදාළ පාර්ශවයන් සහ ජාත්‍යන්තර ආයතන වලට බෙදා හැරීම මෙම අංශය විසින් සිදු කරනු ලැබෙ.

## 4.7 ප්‍රතිපත්ති, ජාත්‍යන්තර සම්බන්ධතා අංශය

ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්බන්ධතා අංශ විදුලි සංදේශ අංශය ආශ්‍රිත කරුණු පිළිබඳව ප්‍රතිපත්තිමය උපදෙස් ලබාදෙන අතර ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (API), කලාපීය සහයෝගිත්වය පිළිබඳ දකුණු ආසියානු සංගමය (SAARC), පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය (CTO) යනාදීය සඳහා කොමිෂන් සභාවේ සහභාගිත්වය සම්බන්ධිකරණය කිරීම වැනි ජාත්‍යන්තර සම්බන්ධතා ක්‍රියාකාරකම්වල නිරත වේ.

**ශ්‍රී ලංකාවේ ජාතික අධිවේගී අන්තර්ජාල ප්‍රතිපත්තිය(ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ විශේෂඥ සහායක වැඩසටහන):** වඩා ප්‍රශස්ත අන්තර්සම්බන්ධිය ශ්‍රී ලංකාවක් සඳහා තාක්ෂණයේ නව්‍යතාවයන් දිරිගැන්වීම පිණිස ශ්‍රී ලංකාව සඳහා අධිවේගී අන්තර්ජාල සැලැස්මක් පිළියෙල කිරීමෙහිලා සේවා සැපයුම්කරුවන්, සම්බන්ධතා සැපයුම්කරුවන්, අන්තර්ගත සැපයුම්කරුවන් සහ උපකරණ සැපයුම්කරුවන් ඇතුළු සියළුම පාර්ශවකරුවන් සමඟ එක්ව ක්‍රියාකරමින් අන්තර් අමාත්‍යාංශ සහ කර්මාන්ත මට්ටමින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකාවේ ඉදිරි දැක්ම වූ ජාතික අධිවේගී අන්තර්ජාල ප්‍රතිපත්තියක අවශ්‍යතාවය අධ්‍යයනය කිරීම සඳහා කමිටුවක් පත්කර ඇත. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ විශේෂඥයින්ගේ මඟ පෙන්වීම

යටතේ ''ජාතික අධිවේගී අන්තර්ජාල සැලැස්ම'' සහ ''ක්‍රමෝපායශීලී ක්‍රියාකාරී සැලැස්ම'' පිළියෙල කිරීම සඳහා අඩිතාලම දමන ලදි.

**ශ්‍රී ලංකාවේ බලපත්‍රකරණ රාමුව සමාලෝචනය කිරීම (ජාත්‍යාන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රවීන සහයක වැඩසටහන):** ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පවතින ජාත්‍යාන්තර ප්‍රවනතාවයන්ට අනුකූලව නව බලපත්‍රකරණ රාමුව වැඩිදියුණු කර ගැනීම සඳහා ජාත්‍යාන්තර විදුලි සංදේශ සංගමයේ සහය ඉල්ලා ඇත.බලපත්‍රලාභී ක්‍රියාකරුවන් සිය යෙදවුම් සපයා ඇත.ජාත්‍යාන්තර විදුලි සංදේශ සංගමයේ විශේෂඥයන් ක්‍රියාකරු යෙදවුම් පාදක කරගෙන පාර්ශවකරුවන් සඳහා වැඩමුළුවක් පවත්වා ඇත.ජාත්‍යාන්තර විදුලි සංදේශ සංගමයේ විශේෂඥයයින් විසින් වාර්තාව ඉදිරිපත් කරන ලදී.

**ජාත්‍යාන්තර විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය 2017:** සෑම වසරකම මැයි 17වන දිනට යෙදේ. 2017 වසරේ ජාත්‍යාන්තර විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනයේ තේමාව වූ ''දත්ත සමූහය තුලින් විපුල බලපෑම'' යන්නවූ අතර සංවර්ධනය සඳහා දත්ත සමූහයේ බලපෑම කෙරෙහි අවධානය යොමු කළ අතර එහි අරමුණ වූයේ සංවර්ධන සන්දර්භයන් තුළ අවිධිමත්, සංකීර්ණ, නිරන්තරයෙන් නොසකසනලද දත්ත ක්‍රියා කාරීව තොරතුරු බවට පත්කරගන්නේ කෙසේද යන්න සොයා බැලීමයි.

ජාත්‍යාන්තර විදුලි සංදේශ සංගමය 152 වන සංවත්සරය සැමරීම පිණිස සාමාජික රටවලට ආරාධනය කරන ලද අතර ජාත්‍යාන්තර විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනයේ තේමාව පිළිබඳව ශ්‍රී ලාංකීය ප්‍රජාව දැනුවත් කරන ලදී.මෙම උත්සවය 2017 මැයි 17වන දින ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේදී සමරනු ලැබීය. මෙම උත්සවය සඳහා කොමිෂන් සභාවේ සියළුම කාර්ය මණ්ඩලය සහභාගී වූහ. ජනාධිපතිතුමා ,අග්‍රාමාත්‍යතුමා සහ ජාත්‍යාන්තර විදුලි සංදේශ සංගමයේ ඉතිහාසය පිළිබඳ වීඩියෝවක් සහ පුළුල් දත්ත පිළිබඳ වීඩියෝවක් සහ ව්‍යාපෘති සහ ජාත්‍යාන්තර විදුලි සංදේශ සංගමයේ නිර්දේශ (ITU-R) ඇතුලත් වීඩියෝ දර්ශන මෙම වැඩසටහනට ඇතුලත් විය.

**ජාත්‍යාන්තර විදුලි සංදේශ සංගමය(ITU) සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නවෝත්පාසන සහ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා තොරතුරු සහ සන්නිවේදනය තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන:** ජාත්‍යාන්තර විදුලි සංදේශ සංගමය(ITU) සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ(TRCSL) නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා තොරතුරු සහ සන්නිවේදනය තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන 2017 සැප්තැම්බර් 12 සිට 15 දක්වා කොළඹදී **ශ්‍රී ලංකා** විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ජාත්‍යාන්තර විදුලි සංදේශ සංගමය(ITU) විසින් ආරම්භ කරන ලදී.

මෙම පුහුණු පාඨමාලාවේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ පළාත් ආවරණය වන පරිදි එවැනි පුහුණු පාඨමාලා පවත්වන "පුහුණුකරුවන් පුහුණුකිරීමේ" ව්‍යාපෘතිය යටතේ ධාරිතාවය ගොඩනැංවීමයි.මෙම පුහුණු පාඨමාලාව සඳහා පුහුණුවන්නන් වශයෙන් ශිෂ්‍යයන් 40ක් ඉලක්කගත වූහ. සෙනෙහස අධ්‍යාපන සම්පත් පර්යේෂණ සහ තොරතුරු මධ්‍යස්ථානය, කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පාසල, ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය (ව්‍යවසායකත්ව අංශය), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන ආයතන සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය මෙම පුහුණු වැඩසටහනට සහභාගී වූහ.

සිසුන්ගේ ව්‍යවසායකත්ව අපේක්ෂා මුදුන් පමුණුවා ගැනීම සහ ඔවුන්ගේ ව්‍යාපාර ආරම්භ කිරීම සහ වැඩිදියුණු කිරීමට ඉඩසැලසෙන පරිදි ශිෂ්‍යයන් අතර ප්‍රායෝගික ව්‍යවසායකත්ව නිපුණතා වැඩිදියුණු කිරීම ; සහ ජාත්‍යන්තර පරිචයන් සලකා බැලිය හැකි නිසා ආසියා ශාන්තිකර කලාපයේ විවිධ රටවල සිද්ධි අධ්‍යයනය විශ්ලේෂණය කිරීම මෙම පුහුණු පාඨමාලාවේ අරමුණ විය.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රධාන උපදේශක සමීර් ශර්මා මහතා මෙම වැඩසටහනේ සම්බන්ධීකරණ නිලධාරියා වූ අතර ජාත්‍යාන්තර විදුලි සංදේශ සංගමයේ විශේෂඥ මයාර් මුහමද් ඛාන් මහතා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ විශේෂඥ අවියා කලිදා නිලා මහත්මිය ජාත්‍යාන්තර විදුලි සංදේශ සංගමයේ විශේෂඥ පීටර් ආජන්ටි මහතා සම්පත්දායකයන් ලෙස සිය දැනුම මෙම වැඩසටහනට එක් කළේය.
https://www.itu.int/en/ITU-D/RegionalPresence/AsiaPacific/Pages/Events/2017/SepPIE/presentations_PIE.aspx

**ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය -ආහාර හා කෘෂිකර්ම සංගමය-ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ඊ කෘෂිකර්මාන්තය සඳහා නවෝත්පාදන සහ යෙදවුම් සංවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන:** ඊ කෘෂිකර්මාන්තය සඳහා නවොත්පාදන සහ යෙදවුම් සංවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන 2017 දෙසැම්බර් 11 සිට 15 දින දක්වා ශ්‍රී ලංකාව, පේරාදෙණිය, කෘෂිකර්මාන්ත දෙපාර්තමේන්තුව, ජාතික කෘෂිකාර්මික තොරතුරු සහ සන්නිවේදන මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. මෙම වැඩසටහන ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය(ITU) , ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL),කෘෂිකර්ම අමාත්‍යාංශය සහ ආහාර හා කෘෂිකාර්මික සංවිධාන(FAO) විසින් ඒකාබද්ධව මෙම වැඩසටහන සංවිධානය කරන ලදී.

මෙය දෙවන පුහුණු පාඨමාලාව වූ අතර 2017 සැප්තැම්බර් 12-15 දක්වා ශ්‍රී ලංකාව,කොළඹදී පවත්වන ලදී.

මෙම පුහුණු පාඨමාලාවේ ප්‍රධාන අරමුණු වූයේ ගොවීන්ගේ ව්‍යවසායකත්ව අපේක්ෂා මුදුන් පමුණුවා ගැනීමට සහ ඔවුන්ගේ ව්‍යාපාර ආරම්භ කිරීම සහ වැඩිදියුණු කිරීමට ඉඩසැලසෙන පරිදි ගොවින් අතර

ප්‍රායෝගික ව්‍යවසායකත්ව කුසලතා වැඩිදියුණු කිරීම; පළාත් මට්ටමින් පුහුණු පාඨමාලා හඳුන්වාදෙන පුහුණුකරුවන් පුහුණු කිරීම; සහ ජාත්‍යන්තර සිද්ධාන්ත සලකා බැලිය හැකි නිසා ආසියා ශාන්තිකර කලාපයේ විවිධ රටවල සිද්ධි අධ්‍යයනය විශ්ලේෂණය කිරීමයි.

මෙම පුහුණු පාඨමාලාව කෘෂිකර්ම අමාත්‍යාංශයට අවශ්‍ය ආකාරයෙන් සකස් කෙරිණි. මෙම පුහුණු වැඩසටහනේ ප්‍රථම දින දෙක සඳහා පොදු ප්‍රේක්ෂකයන් සහභාගීවූ අතර අවසන් දින තුන සඳහා අරමුණ සිශානුගත වැඩසටහන් පිළිබඳ දැනුමින් හෙබි වැඩසටහන්කරුවන් සහභාගීවූහ. මෙම පුහුණු වැඩසටහනේදී කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා නව ජංගම යෙදවුම් වැඩිදියුණු කළ අතර වැඩසටහන් සමාප්ති අවස්ථාවේදී ඒවා ප්‍රසිද්ධ කරන ලදී.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ජ්‍යෙෂ්ඨ උපදේශක සමීර් ෂර්මා මහතා,ජාත්‍යාන්තර විදුලි සංදේශ සංගමයේ විද්‍යාඥයන් වන ෂයාර් මුහමද් කාන් සහ පීටර් ආගන් යන මහත්වරුන් මෙම වැඩසටහනේ සම්පත්දායකයන් වූහ.වැඩිදුර විස්තර සඳහා https://www.doa.gov.lk/ICC/index.php/en/2016-05-09-08-54-3/78-itu-fao-doa-trcsl-training-on-innovation-application-development-for-e-agriculture

**කොරියානු ජාතික තොරතුරු නියෝජිතායතනය (NIA)/ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU)/ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) 2017 ජාත්‍යාන්තර තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡාදායක වැඩසටහන (IIV):** ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන්ගේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ දැනුම සහ කුසලතාවය වැඩිදියුණු කිරීමේ අදහසින් ජාත්‍යාන්තර විදුලි සංදේශ සංගමය සහ කොරියානු ජාතික තොරතුරු නියෝජිතායතනයේ සහයෝගිත්වයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් කොරියානු ජාතික තොරතුරු නියෝජිතායතනය, ජාත්‍යාන්තර විදුලි සංදේශ සංගමය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 2017 ජාත්‍යාන්තර තොරතුරු තාක්ෂණ ස්වේච්ඡාදායක (iiv) වැඩසටහන සම්බන්ධීකරණය කරන ලදී.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පුහුණු වැඩසටහන පැවැත්වීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණි කොරියානු උපාධි අපේක්ෂකයින් දොලොස් දෙනෙකුගෙන් සමන්විත ස්වේච්ඡාදායක කණ්ඩායම් තුනක් විසින් 2017 ජුලි 07 දින සිට අගෝස්තු 16 දක්වා අධ්‍යාපන මධ්‍යස්ථාන තුනකදී මෙම වැඩසටහන පවත්වන ලදී. මෙම IIVs වැඩසටහනේදී කොළඹ දිස්ත්‍රික්කයේ බස්/ජය/විජේරාම මහ විද්‍යාලීය පරිගණක පුහුනු මධ්‍යස්ථානය, කළුතර දිස්ත්‍රික්කයේ, බස්/කළු/මතු/මෙරිල් කාරියවසම් මධ්‍ය මහා විද්‍යාලයි පරිගණක පුහුණු මධ්‍යස්ථානය ගම්පහ දිස්ත්‍රික්කයේ බස්/මීග/ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මහා විද්‍යාලය විශේෂ අධ්‍යාපන ඒකකවල ගුරුවරුන් සහ විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයයන් පුහුණු කරන ලදී. විශේෂ අධ්‍යාපන ඒකකවල ගුරුවරුන් සහ විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයයන් සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සඳහා මානව සම්පත් සංවර්ධන

වැඩසටහනක් වශයෙන් මෙම NIA-ITU-TRCSL ජාත්‍යන්තර තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡාදායක (IIV) වැඩසටහන සැලසුම් කරන ලදී.

“ITI”,“SSUGAR”සහ “POCARI” යනුවෙන් හඳුන්වන මෙම IIV කණ්ඩායම් කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල සේවාවන් සඳහා යොමු කරන ලදී.IIV තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ වැඩසටහනේ විෂය මාලාවට Microsoft Office, Android Development, Adobe Photoshop, Google Apps, Internet & email (අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල), විශේෂ අධ්‍යාපන අවශ්‍යතාවයන් සහිත ශිෂ්‍යයන් සඳහා වන විශේෂ මෘදුකාංග සහ කොරියන් භාෂාව, සංගීතය, සංස්කෘතිය වැනි විවිධ විෂය පැතිකඩ හඳුන්වාදීම යනාදී විෂය කරුණු ඇතුළත් විය.

**ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය(APT) 17 වැනි ප්‍රතිපත්ති සහ නියාමන සමුළුව(PRF-17):**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) සත්කාරත්වයෙන් සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ(APT) සංවිධානත්වයෙන් යුතුව ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ(APT) ප්‍රතිපත්ති සහ නියාමන සමුළුව(**(PRF-17):** ජූලි 24 සිට 26 දින දක්වා ශ්‍රී ලංකාව, කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේදී පවත්වන ලදී.

ශ්‍රී ලංකාවේ ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මෙම වැඩසටහනේ ප්‍රධාන ආරාධිත අමුත්තා විය.ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ මහ ලේකම් අරවින් හෝරංසි මහත්මිය විසින් පිළිගැනීමේ කථාව පවත්වන ලදී. ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සභාපති යසුෂිකෝ තත්වාකි මහතාගේ ප්‍රධාන දේශනය ජපානයේ අභ්‍යන්තර කටයුතු සහ සන්නිවේදන අමාත්‍යාංශයේ අභ්‍යන්තර කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල් සෙයිජි ටකාජි මහතා විසින් පවත්වන ලද අතර එහි සමාරම්භක දේශනය පවත්වන ලද්දේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපති /ජනාධිපති ලේකම් ඔස්ටින් ප්‍රනාන්දු මහතා විසිනි.

මෙම සමුළුව සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සාමාජිකයින්, ආශ්‍රිත සාමාජිකයින්,අනුබද්ධ සාමාජිකයින්,ජාත්‍යන්තර සංවිධාන සහ වෙනත් ආශ්‍රිත ආයතනවල සාමාජිකයින්ගෙන් සමන්විත දේශිය සහ විදේශිය නියෝජිතයින් 150 කට අධික පිරිසක් සහභාගී වූහ.2017 ප්‍රතිපත්ති සහ නියාමන සමුළුවේ පොදු අරමුණ වූයේ කලාපයේ විදුලි සංදේශ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති සම්පාදකයන්ට සහ නියාමකයන්ට විදුලි සංදේශ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ ඇතිවන වෙනස්කම්වල ප්‍රතිඵලයක් වශයෙන් මුහුණ දෙන ගැටළු පිළිබඳ සාකච්ඡාවක් සඳහා පොදු වේදිකාවක් ඇති කිරීම, සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සාමාජිකයින්ට අදාල ප්‍රධාන ගැටළු සාකච්ජා කිරීම සහ බෙදාහදා ගැනීම සඳහා අවස්ථාවක් සැපයීම.

**2018-2020 වසර සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ උපායමාර්ගික සැලැස්ම පිළිබඳ සංසද කණ්ඩායමේ දෙවන රැස්වීම(CGSP-2):** මෙම රැස්වීම 2017 ජුලි 27 දින ශ්‍රී ලංකාවේ කොළඹදී පවත්වන ලද අතර, මීට පෙර 2017 ජුලි 24 සිට 26 දින දක්වා එම ස්ථානයේදීම ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ 17 වරනා ප්‍රතිපත්ති සහ නියාමන සමුළුව(PRF-17) පවත්වන ලදී.මෙම වැඩසටහන සඳහා සත්කාරකත්වය දැක්වෙන ලද්දේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසිනි.

2018-2020 ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ක්‍රමෝපායශිලි සැලැස්ම පිළිබඳ සංසද කණ්ඩායමේ විෂයය පථයට 2018-2020 කාලපරිච්ඡේදය සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ උපායමාර්ගික සැලැස්ම සැලසුම් කිරීම සහ සම්බන්ධීකරණය කිරීම, 2018-2018 උපාය මාර්ගික සැලසුම කෙටුම්පත වැඩිදියුණු කිරීම, උපාය මාර්ගික සැලසුම් කෙටුම්පත සකස් කිරීම සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ 14 වැනි මහා සභා සැසිය(GA-14) සඳහා ප්‍රතිඵල වාර්තා කිරීම ඇතුලත් විය. CGSP-2 රැස්වීමේ අරමුණ වුයේ 2018-2020 උපායමාර්ගික සැලැස්මේ පලමු කෙටුම්පත පිළිබඳව ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සාමාජිකයන්ගෙන් ලැබුණු ප්‍රතිචාර පිළිබඳව සාකච්ජා කිරීමයි.

මෙම රැස්වීමට අාසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ මහලේකම් කාර්යාලය සහ එම සංගමයේ සාමාජිකයන්, අනුබද්ධ සාමාජිකයන්ගෙන් සමන්විත දේශිය සහ විදේශිය නියෝජිතයන් හතලිස් පහක් සහභාගි වූහ.

**ශ්‍රී ලංකාවේ ක්‍රියාකරුවන් සඳහා IPV4/IPV6 BGP Routing පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ දේශිය පුහුණු පාඨමාලාව:** ශ්‍රී ලංකාවේ ක්‍රියාකරුවන් සඳහා IPV4/IPV6 BGP Routing පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ දේශිය පුහුණු පාඨමාලාව ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) සහ ආසියා ශාන්තිකර ජාල තොරතුරු මධ්‍යස්ථානය (APNIC) විසින් සංවිධානය කරන ලදී. මෙම පුහුණු වැඩසටහන 2017 නොවැම්බර් 06 සිට 10 දින දක්වා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා කාර්යාලයේදී පවත්වන ලදී. මෙම පාඨමාලාවට IPv4 මෙන්ම IPv6 සහ Cisco IOS JunOS and /or Huawei router configuration commands පාදක කරගත් සැලකියයුතු ප්‍රායෝගික කාර්යයන් ඇතුලත් විය. මෙම පුහුණු පාඨමාලාව සඳහා ඉලක්කගත කණ්ඩායම වූයේ ජාත්‍යාන්තර සහ/හෝ බහු සැපයුම්කරු සම්බන්ධතාවය සහිත පුළුල් පරාසයක සේවා සැපයුම්කාර ජාලය මේ වන විට ස්ථාපනය කරන ලද හෝ පවත්වාගෙන යන හෝ අන්තර්ජාල සම්බන්ධතා ඒකකයකදී සහභාගීවීමට සලකා බලන තාක්ෂණික කාර්ය මණ්ඩලයයි. මෙම පාඨමාලාව සඳහා ආසියා ශාන්තිකර ජාල තොරතුරු මධ්‍යස්ථානයේ (APNIC) බෙයි(ජෙසිකා) වෙයි මහතා සහ අනුරාග් බාතිය මහතා විසින් උපදේශකත්වය ලබා දුන් අතර පුහුණු පාඨමාලාව සඳහා හතලිස් දෙනෙකු සහභාගි වූහ.

**ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලෝක විදුලි සංදේශ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ දර්ශක ප්‍රශ්නාවලි සමීක්ෂණය:** ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ඉල්ලීම මත, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙනත් අංශවල සහ පාර්ශවකරුවන්ගේ සහාය ඇතුව ලෝක විදුලි සංදේශනය සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ දර්ශක පිළිබඳ සමීක්ෂණයක් පවත්වන ලදී. ලොව පුරා රාජ්‍යයන්, ජාත්‍යන්තර සංවිධාන, සංවර්ධන බැංකු සහ පෞද්ගලික අංශයේ විශ්ලේෂකයන් විසින් ගෝලීය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සංවර්ධන තත්ත්වය විශ්ලේෂණය කිරීම පුළුල්ව සිදුකරන බැවින් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සංවර්ධන දර්ශකය ගණනය කිරීම සඳහා ගෝලීය දත්ත එක්රැස් කිරීම/වැඩිදියුණු කිරීම මෙම සමීක්ෂණයේ අරමුණයි. මෙම සපයන ලද දත්ත ලෝක විදුලි සංදේශ/තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ දර්ශක දත්ත සමුදාය,ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සංඛ්‍යාලේඛන ප්‍රකාශන, ලෝක බැංකු ප්‍රකාශන යනාදිය වැඩිදියුණු කිරීම සඳහා භාවිතා කරන ලදී.

**ජාත්‍යන්තර සංවිධානවල වාර්ෂික දායකත්වය:** ශ්‍රී ලංකාව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය(ITU) ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය(APT), දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ සංගමය(SATRC) පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය(CTO) සහ යටිතල පහසුකම් නියාමනය පිළිබඳ දකුණු ආසියානු සංගමයේ(SAFIR) සාමාජිකයෙකි. මෙම ආයතනවල සාමාජිකත්වය අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස වාර්ෂික පදනම මත දායක මුදල් ගෙවනු ලැබේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් කරන ලද ජාත්‍යන්තර විදුලි සංදේශ ආයතන සාමාජිකත්ව ගෙවීම් පහත දැක්වේ.

*වගුව 23: 2017 වාර්ෂික සාමාජිකත්ව දායක මුදල් ගෙවීම*

| ITU | APT | CTO | SATRC-EBC Action Plan IV |
|---|---|---|---|
| 24,727,919.20<br>මාර්තු 2017 | 23,70,834.86<br>මාර්තු 2017 | 5,000,835.94<br>අප්‍රේල් 2017 | 2,315,429.50<br>අප්‍රේල් 2017 |

මෙම ආයතන වල සහයෝගිත්වය ඇතිව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට විදුලි සංදේශනය/ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රවල ධාරිතාවය ඉහල නැංවීම පිණිස තාක්ෂණික සහාය,විශේෂඥ සහාය, ව්‍යාපෘති වැඩසටහන් සහ ශිෂ්‍යත්ව අවස්ථාව ලැබිණි.

එමෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ජාත්‍යන්තර ආයතන සංවිධානය කරන වැඩමුළු නියෝජනය කිරීම මෙන්ම සිය දායකත්වය සහ කථනමය සහාය ලබාදෙන ලදී. මෙම ජාත්‍යන්තර ආයතනවල සහයෝගිත්වය ඇතිව, ජාතික රැස්වීම්, පාර්ශවකරුවන් සහභාගිත්ව වැඩසටහන් සහ සත්කාරක වැඩසටහන් පවත්වන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මෙම සමුළුවේදී අධ්‍යයන කණ්ඩායම් සහ මාර්ගගත ප්‍රශ්නාවලි ක්‍රියාකාරකම් වලට දායකත්වය ලබාදෙන ලදී.

## 4.8 බලපත්‍ර කළමණාකරන අංශය

1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව කිසියම් තැනැත්තෙකුට විදුලි සංදේශ පද්ධතියක් ස්ථාපනය කිරීම හෝ පවත්වාගෙන යාම හෝ විදුලි සංදේශ සේවාවක් සැපයීම පිණිස බලපත්‍රයක් තිබීම අවශ්‍ය වේ. මේ ආකාරයෙන් , ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව දුරකථන ක්‍රියාකාර සමාගම් අතර පවතින වෙනස්කම් සැලකිල්ලට ගෙන පහසුකම් පාදක කරගත් හෝ පහසුකම් පාදක කර නොගත් වශයෙන් බලපත්‍රකරණ ප්‍රවේශයක් තෝරා ගෙන ඇත.

**පහසුකම් පාදක කරගත් බලපත්‍ර:** විදුලි සංදේශ සේවා සැපයීමෙහිලා කුමන හෝ ආකාරයේ පොදු විදුලි සංදේශ ජාල තොරතුරු පද්ධතියක් ස්ථාපනය කරන හෝ පවත්වාගෙන යාම දැක්වෙන සහ ස්වභාවික සම්පත්(සංඛ්‍යාත වර්ණාවලිය සහ/හෝ නීත්‍යානුකූල අවසරය ලබාදීම අංකනය)භාවිතා කිරීම පිණිස මෙම වර්ගයේ බලපත්‍ර අවශ්‍ය වේ.

**පහසුකම් පාදක කර නොගත් බලපත්‍ර:** පහසුකම් පාදක කර නොගත් යන්නෙන් කිසියම් පෞද්ගලික දුරකථන ක්‍රියාකාර සමාගමකින් ස්වකීය විදුලි සංදේශ සේවා සැපයීම හෝ තෙවන පාර්ශවයකට ස්වකීය විදුලි සංදේශ බලපත්‍ර විකිණීම හෝ එකතු කල අගය මත සේවා සැපයීම පිණිස විදුලි සංදේශ ජාල මූලිකාංග(සම්ප්‍රේෂණ ධාරිතාවය සහ ස්විචිකරණය)බද්දට ගැනීමට අදහස් කරන දුරකථන ක්‍රියාකාර සමාගම් අදහස් වේ.

**බලපත්‍ර වර්ගීකරණය:** පෞද්ගලික බලපත්‍රවලට ස්ථාවර විදුලි සංදේශ ජාල සහ සේවා ඇතුලත්වේ. මෙම වර්ගය යටතේ අන්තර්ජාල ප්‍රවේශ පහසුකම් සහිත ස්ථාවර සහ රැහැන් රහිත ප්‍රවේශ ජාල සහ අන්තර්ජාල සේවා සැපයුම්කරු(ISP) සේවා , අගය එකතු කළ සේවා හෝ කිසියම් උපයෝගී සේවා ඇතුළු ස්ථාවර විදුලි සංදේශ ජාල හෝ ජාල මූලිකාංග ස්ථාපනය කිරීමට අවසර ලබාදී තිබේ.

**ජංගම විදුලි සංදේශ ජාල සේවා:** මෙයට ස්ථාවර පාදක විදුලි සංදේශ ජාල, ජාත්‍යන්තර පොදු ජංගම විදුලි සංදේශ සේවා, ජාත්‍යන්තර රෝමින් සේවා, ට්‍රන්කින් සේවා, එකතු කළ අගය මත සේවා, මහා පරිමාණ සේවා, සම්ප්‍රේෂණ සහ වෙනත් උපයෝගී සේවා ඇතුලත්වේ.

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ බලපත්‍රකරණ පටිපාටිය:** අයදුම්පත්‍රය විදුලි සංදේශ පනතේ 17 වන වගන්තියට සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පිළිගත් 2006 බලපත්‍රකරණ මාර්ගෝපදේශන සහ පටිපාටි වලට අනුකූල විය යුතුය. බලපත්‍ර ප්‍රදානය කිරීමේදී, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විවෘත, සාධාරණ සහ විනිවිදභාවයෙන් යුතු ලංසුකරණ ක්‍රමවේදයක් සලකා බලනු ලබයි.

- විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අභිලාෂය දක්වන පාර්ශවයන් 2006 බලපත්‍රකරණ මාර්ගෝපදේශන සහ පටිපාටිවල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව සිය යෝජනා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව බලපත්‍ර ප්‍රදානය කිරීම 2006 බලපත්‍රකරණ මාර්ගෝපදේශන සහ පටිපාටිවල සවිස්තරාත්මකව විස්තර කර ඇති පරිදි විවෘත, සාධාරණ සහ විනිවිද පෙනෙන පොදු තරඟකාරී ලංසුකරණ ක්‍රියාවලියක් මත සිදු කරයි.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නිකුත් කළ යුතු බලපත්‍ර සංඛ්‍යාව පිළිබඳව පූර්ව වශයෙන් නිශ්චය නොකරයි. කෙසේ වෙතත් පොදු යහපත සලකා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ස්වභාවික හා/හෝ සීමිත සම්පත් අවහිරතා ඇති විට ඇතැම් සේවා සඳහා ලබා ගත හැකි බලපත්‍ර සංඛ්‍යාව සීමා කළ හැකිය.
- බලපත්‍රලාභියා ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් විය යුතුය.
- ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිර්දේශය මත විදුලි සංදේශ භාර අමාත්‍යවරයා විසින් පෞද්ගලික බලපත්‍ර විශේෂිත නොවන පදනමක් මත නිකුත් කෙරේ.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් බලපත්‍ර අයදුම්පත්‍රය 2006 බලපත්‍ර මාර්ගෝපදේශන සහ පටිපාටිවලට අනුකූල නොවන්නේදැයි සලකා බලනු ලැබේ.
- තාක්ෂණික-ආන්තික ප්‍රවේශ වලට අනුකූලව අයදුම්කරුවන්ට, කිසියම් ගැටලුවක් පැන නගින්නේ නම් බලපත්‍ර කොන්දේසි මගින් පනවන සීමාකිරීම් සහ මහජන යහපත පිළිබඳ කරුණු වලට යටත්ව, ස්වකීය වාණිජමය තීරණ පාදක කරගෙන, ඔවුන්ගේ යෝජිත මෙහෙයුම් සඳහා වඩාත් සුදුසු තාක්ෂණය තෝරා ගැනීමට නිදහස ඇත. කෙසේ වෙතත්, බලපත්‍රය ලබා දෙන විට ඔවුන්ගේ ජාලයන් සහ සේවා සැපයුම් වල සිදුවන ඕනෑම වෙනස්වීමක් සඳහා බලපත්‍රලාභියා විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ.
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය හිඟ වීමෙන්, රැහැන් රහිත තාක්ෂණික විසඳුම් යෙදවීමට අදහස් කරන දුරකථන ක්‍රියාකාර සමාගම් වලට සන්සන්දනාත්මක තෝරාගැනීමේ ක්‍රියාවලියක් සහ/හෝ විකල්පයක් මඟින් සංඛ්‍යාත වර්ණාවලිය වෙන් කරනු ලැබේ. ලබා දෙනු ලබන ගුවන් විදුලි සංඛ්‍යාත බලපත්‍ර සංඛ්‍යාව ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය ලබාගත හැකි වීම මත රඳා පවතී.
- විදුලි සංදේශ නියාමකයා වශයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ජාතික අංකන සැලැස්ම පාලනය සහ කළමනාකරණය කිරීම සිදු කරයි. සීමිත අංකන සම්පත් කාර්යක්ෂම ආකාරයෙන් භාවිතා කිරීම නිසැක කිරීම පිණිස අංක වෙන් කරයි. එමෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තරඟකාරීත්වය සඳහා සම අවස්ථා සලසා දීම පිණිස අංක වෙන් කිරීමේ ක්‍රියාවලිය සාධාරණ හා විනිවද පෙනෙන ආකාරයෙන් සිදු කිරීමට වග බලා ගනී.
- පහසුකම් පාදක කර ගත් බලපත්‍රලාභීන්ට පහසුකම් පාදක කර නොගත් බලපත්‍රලාභීන් විසින් සපයන සේවාවන් සැපයීමටද හැකිවේ. පෞද්ගලික බලපත්‍ර වලින් සෙසු බලපත්‍රලාභී විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වල ව්‍යාපාරික පාරිභෝගිකයන් සහ මහජනතාව ඇතුලත් විය හැකි පරිදි තෙවැනි පාර්ශව වලට සිය සේවා සැපයීමට අවසර ලැබේ. පෞද්ගලික බලපත්‍රලාභීන්ට ශ්‍රේණිගත කරන ලද බලපත්‍රලාභීන් සඳහා සේවා සැපයීමට හැකි නමුත් අනෙක් අතට ඔවුන්ට පෞද්ගලික බලපත්‍රලාභීන් සඳහා සේවා සැපයිය හැකි නොවේ.
- පෞද්ගලික බලපත්‍ර වසර දහයක කාලපරිච්ජේදයක් සඳහා නිකුත් කරන නමුත්, පහසුකම් පාදක කර නොගත් බලපත්‍ර වල වලංගුභාවය වසර පහකට සීමාවේ. බලපත්‍රය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්වය හෝ/සහ විවිධ කොන්දේසි, කාර්ය සාධනය මත පදනම්ව එහි මුල් කාලය නොඉක්මවන කාලපරිච්ජේදයක් සඳහා යාවත්කාලින කල හැකිය.
- බලපත්‍ර ගාස්තුව සපයන සේවා වර්ගය පදනම් කරගෙන ශ්‍රී ලංකා විදුලි සන්දෙන්ස නියාමන කොමිෂන් සභාව විසින් කලින් කල නිශ්චය කරනු ඇත. බලපත්‍ර ගාස්තු විදුලි සංදේශ පනත සහ

වෙනත් නීති රීති යටතේ කොමිෂන් සභාවේ වගකීම්, කාර්යයන් සහ බලතල පවත්වාගෙන යාම, වැය වන වියදම් සපුරාලීමට භාවිත කරනු ලැබේ. මීට අමතරව, බලපත්‍රලාභියා මුළු පිරිවැටුපෙන් 3% ප්‍රමාණයක් වාර්ෂික සෙස් ගාස්තු වශයෙන් ගෙවීම අවශ්‍ය වේ.

- විදුලි සංදේශ සේවා සැපයුම්කරුවකු විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන තොරතුරු වල රහස්‍යභාවය ආරක්ෂා කිරීමට ඉල්ලා සිටිය හැකි අතර එලෙස ආරක්ෂා කරන ලෙස අයදුම්කරු ඉල්ලා සිටින සියළුම තොරතුරු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් හෙළිදරව් කිරීමෙන් හෝ භාවිතා කිරීමෙන් තොරව ආරක්ෂා කළ යුතුය.

**බලපත්‍රකරණ රාමුව පිළිබඳව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුණු:** වෙළෙඳපොල වර්ධනය හා සමාජයේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා වඩාත් හිතකර පරිසරයක් ඇති කිරීම පිණිස කොමිෂන් සභාව තාක්ෂණික පරිවර්තනයන් සහ ඊළඟ පරම්පරාවේ ජාල කෙරෙහි අවධානය යොමු කරයි. එමෙන්ම මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පහත සඳහන් ලක්ෂණ සලකා බලනු ලැබේ.

**රාමුව**

- තරඟකාරීත්වය වර්ධනය කිරීම
- සේවා තත්ත්වය
- දුරකථන ඝනත්වය
- නව තාක්ෂණය ව්‍යාප්ත කිරීම
- කාර්යක්ෂමතාවය සහ කේන්ද්‍රගතවීම
- විවෘත ප්‍රවේශය

**නව බලපත්‍ර නිකුත් කිරීම**

- සීමාසහිත US කේබල් සේවා (පෞද්ගලික) සමාගම සඳහා ශ්‍රී ලංකාවේ ඍජු ගෘහස්ථ (DTH) සේවා සැපයීම පිණිස වසර පහක බලපත්‍ර කාලපරිච්ඡේදයක් සඳහා 2017 අගෝස්තු 25 දින නව බලපත්‍රයක් නිකුත් කරන ලදී.

**බලපත්‍ර අලුත් කිරීම**

- සීමාසහිත ලංකා බෙල් සමාගම - ස්ථාවර රැහැන් රහිත බලපත්‍රය
- සීමාසහිත භාරතී එයාටෙල් ලංකා (පෞද්ගලික) - ජංගම විදුලි සංදේශ බලපත්‍රය
- සීමාසහිත භාරතී එයාටෙල් ලංකා (පෞද්ගලික) - ජාත්‍යන්තර සේවා බලපත්‍රය
- සොසයිටි ඉන්ටනැෂනලි ද ටෙලිකොමියුනිකේෂන්ස් ඒරෝනෙටික්ස් (Societe Internationale de Telecommunications Aeronautiques - SITA) - ස්ථාවර ගුවන් විදුලි සංදේශ සේවා
- සීමාසහිත ඩයලොග් ටෙලිවිෂන් (පෞද්ගලික) සමාගම - ඍජු ගෘහස්ථ (DTH) සේවා

## 4.9 ජාල අංශය

ජාල අංශය රජයේ හෝ පෞද්ගලික විදුලි සන්දේශනය ආශ්‍රිත ජාල සම්බන්ධ කරුණු නියාමනය කිරීමෙහිලා වගකියනු ලැබේ.

පොදු විදුලි සංදේශ ජාල සඳහා ජාතික අංකන සැලැස්ම කළමනාකරණය කිරීම, සංඥා සංකේත අංක, ජාල සංකේත අංක වෙන් කිරීම, ඉලක්ක හඳුනාගැනීම, යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම, විදුලි සංදේශ උපකරණ බලපත්‍ර වෙළඳුන්ට ලබා දීම, ජාල උපකරණ සඳහා මාදිලි අනුමැති සහතික පත්‍ර සහ රේගු නිෂ්කාශනය නිකුත් කිරීම, ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාල සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම සවිබල ගැන්වීම ජාල අංශයේ විෂය පථය යටතට ගැනේ.

විදුලි සංදේශ පනත ප්‍රකාරව ඉහත සඳහන් කරන ලද විෂය ක්ෂේත්‍රයන් යටතේ 2017 වසරේදී ජාල අංශය විසින් කරන ලද කාර්යයන් පහත දැක්වේ.

**අංකනය**

ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාල සඳහා අවශ්‍ය අංකනය සීමිත සම්පතක් වන බැවින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශන කර්මාන්තයේ ජාතික අංකන සැලැස්ම කළමනාකරණය කරයි. රටේ විදුලි සංදේශ ජාල සඳහා ලබාගත හැකි අංකන සම්පත් භාවිතා කිරීම සඳහා රාමුව සහ මාර්ගෝපදේශන අංකන සැලැස්මේ සඳහන් වේ. අංකනය සීමිත සම්පතක් වන බැවින්, නිසි සැලසුමකින් යුතුව කළමනාකරණය කර ඇත. එබැවින් අංකන සැලැස්ම කර්මාන්තයේ නව සංවර්ධනයන් සහ වත්මන් ප්‍රවනතාවයන් රඳාපවත්නා කර්මාන්තයේ ඉල්ලුමට අනුකූලව කලින් කල වෙනස් වේ.

- ජාතික අංකන සම්පත කළමනාකරණය කිරීම.
- රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා කෙටි සංකේත අංක වෙන් කිරීම.
- කෙටි සංකේත අංක ආශ්‍රිත කරුණු සම්බන්ධව විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් සම්බන්ධීකරණය කිරීම.
- ඉලක්ක හඳුනාගැනීම.
- ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා අංශයේ සම්බන්ධීකරණය සහිතව, ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සහාය ඇතිව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් සඳහා IPv4/IPv6 BGP Routing දේශීය පුහුණු පාඨමාලාව පැවැත්වීම.

**යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම**

ජාල අංශය මඟින් සිදු කරන තවත් ප්‍රධාන කාර්යයක් වන්නේ තඹ හෝ දෘශ්‍ය තන්තු ජාල, මුහුද යට කේබල් මධ්‍යස්ථාන සහ විදුලි සංදේශ ඇන්ටනා කුළුණු වැනි විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීමේ පහසුකම් සැපයීමයි. විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් පවතින ජාල ව්‍යාප්ත කිරීම සඳහා අවසරය ලබා ගැනීම සහ ඉහත සඳහන් භෞතික යටිතල පහසුකම් භාවිතා කරමින් නව සේවා හඳුන්වාදීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරයි.

ජාල අංශය අනෙකුත් අදාල රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අදාල අනුමැතීන් නිකුත් කිරීම මගින් ඒවාට පහසුකම් සපයයි.

විදුලි සංදේශ කර්මාන්තයේ තිරසාර සංවර්ධනය පවත්වාගෙන යන අතරම, පාරිසරික බලපෑම්, සෞඛ්‍ය හා ආරක්ෂක ගැටළු, ජාතික ආරක්ෂාව මෙන්ම මහජන යහපත ආශ්‍රිත කරුණු කෙරෙහිද අවධානය යොමු කරයි. මේ සම්බන්ධයෙන් මෙම අංශය විසින් සිදු කරන කාර්යයන් පහත දැක්වේ.

- විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම ආශ්‍රිත කරුණු පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය වැනි රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම.
- අලුතින් මිලදීගත් ඇන්ටනා ව්‍යුහ කළමනාකරණ පද්ධතියක් (Antena Structure Management System - ASMS) මගින් ඇන්ටනා ව්‍යුහ ඉදිකිරීමේ අයදුම්පත්‍ර සම්බන්ධයෙන් කටයුතු කිරීම. 2017 වර්ෂයේදී ඇන්ටනා ව්‍යුහ කළමනාකරණ පද්ධතියට ඇතුලත් කරන ලද ඇන්ටනා ව්‍යුහ දත්ත ප්‍රමාණය 80%ක් වන අතර අදාල දුරකථන ක්‍රියාකාර සමාගම් සමඟ පද්ධතිය ලබා ගන්නා දත්ත පිරික්සීම දැනටමත් ආරම්භ කර ඇත.
- බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකර සමාගම් වලට සිය යටිතල පහසුකම් සංවර්ධනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙහිලා පහසුකම් සැපයීම.
- විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- විදුලි සංදේශ කුළුණු සම්බන්ධ මහජන පැමිණිලි මෙහෙයවීම.
- විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාපෘතිය ආශ්‍රිතව පෞද්ගලික/ අයතනිකමය වශයෙන් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා අධ්‍යයනය කිරීම, නිර්දේශ කිරීම සහ ඒ සම්බන්ධ වාර්තා ඉදිරිපත් කිරීම.
- ඇන්ටනා ව්‍යුහ අනුමත කිරීමේ ක්‍රියාවලියේදී පැන නගින ප්‍රයෝගික දුෂ්කරතා පිළිබඳව අවධානය යොමු කෙරෙන ඇන්ටනා ව්‍යුහ මාර්ගෝපදේශන සංශෝධනය කිරීම අවසන් කිරීම සහ මහජන සෞඛ්‍ය ආරක්ෂාව සහ වෙනත් කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් විදුලි සංදේශ කර්මාන්තයේ අඛණ්ඩ සංවර්ධනයට පහසුකම් සැලසීම.
- ඉහල ගොඩනැගිලිවල සන්නිවේදන සේවා සැපයීම සඳහා තාක්ෂණික ප්‍රමිති මාර්ගෝපදේශන පිළියෙල කිරීම.

**කේබල් රූපවාහිනී සේවා වල නීති විරෝධී ආකාරයෙන් පවත්වාගෙන යන මෙහෙයුම් පාලනය කිරීම**

විදුලි සංදේශ පනතේ 22 (අ) (1) වගන්තිය ප්‍රකාරව කිසිම තැනැත්තෙකු විසින් කොමිෂන් සභාව තත් කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අවසරය යටතේ හැර කිසිම පරිශ්‍රයක කේබල් වැඩ සිදු නොකළ යුතුය. ජාල අංශය අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ සහාය ඇතිව දිවයින පුරා නීති විරෝධී ආකාරයෙන් පවත්වාගෙන යන කේබල් රූපවාහිනී සේවා සැපයීම පාලනය කිරීමේ කටයුතුවල නිරත වී සිටියි.

**මාදිලි උපකරණ සහ උපකරණ නිෂ්කාශනය**

විදුලි සංදේශ පනතේ 5(ක) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට විදුලි සංදේශ පද්ධතියට සම්බන්ධ කල හැකි විදුලි සංදේශ උපකරණ වර්ග අනුමත කිරීමට

බලය ඇත. විදුලි සංදේශ පනතේ 5 (ක) වගන්තියේ පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී, කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විදුලි සංදේශ උපකරණ සම්බන්ධ කිරීම සඳහා පනතේ 17 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද පද්ධති බලපත්‍රවල 2 වන උපලේඛනයේ දක්වා ඇති සියලුම දූරකථන ක්‍රියාකාර සමාගම් වලට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් බලය පවරා ඇත.

ඒ අනුව, දූරකථන ක්‍රියාකාර සමාගම්, වෙළෙන්දන් හෝ පුද්ගලයන් විසින් බලපත්‍රලාභී ජාලයකට සම්බන්ධ කරනු ලබන දූරකථන උපකරණ, ෆැක්ස් යන්ත්‍ර, PABXs (Private Automated Branch Exchange), මොඩම්ස්, රැහැන් රහිත දූරකථන සහ වෙනත් පාරිභෝගික පරිශ්‍ර උපකරණ දේශීයව නිෂ්පාදනය කරන්නේද නොඑසේනම් ආනයනය කරන්නේද යන්න පිළිබඳව මාදිලි අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ.

පර්යන්ත ජාල උපකරණ සඳහා මාදිලි අනුමැතිය ලබාදීමේ ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කිරීම සහ සියලුම ජාල ආශ්‍රිත උපකරණ ආනයනය කිරීම සඳහා රේගුව/ ආයෝජන මණ්ඩලය/ ආනයන පාලක වෙත අවසරදීමේ ලිපි නිකුත් කරන ලද කාර්යයන් පහත සඳහන් පරිදි සාරාංශ කර ඇත.

- විදුලි සංදේශ පර්යන්ත සහ ජාල උපකරණ වල මාදිලි අනුමත කිරීමේ ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කිරීම.
- නිර්දේශ ලිපි වශයෙන් නිෂ්කාශනය කිරීමේ කාර්යයෙහිලා රේගුව/ආයෝජන මණ්ඩලය/ආනයන පාලක වෙත නිර්දේශ කිරීම.
- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ නිර්දේශ සහ මාර්ගෝපදේශන වලට අනුකූලව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ අංශයේ ජාල උපකරණවල තාක්ෂණික ප්‍රමිතියේ අනුකූලතාවය සහතික කිරීම.
- නීති විරෝධී ආකාරයෙන් ලැබෙන ජාත්‍යන්තර ඇමතුම් අවසන් කිරීම වැලැක්වීම පිණිස හඬ, අන්තර්ජාල සම්මුති සහ භාවිතාවන් සඳහා විදුලි සංදේශ දූරකථන ක්‍රියාකාර සමාගම් වලට අනුමැතිය ලබා දීම.
- විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාල කරුණු ආශ්‍රිතව මහජන ආරක්ෂාව, නීතිය හා සාමය සම්බන්ධව පොලිස්/ අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ විමර්ශන වලට සහාය වීම.
- රාජ්‍ය ආයතනවල සහ රාජ්‍ය සංස්ථාවල තාක්ෂණික ඇගයීම් කමිටුවල සහභාගීවීම සහ විදුලි සංදේශන ආශ්‍රිත තාක්ෂණික ආදාන ලබා දීම.

**වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම**

විදුලි සංදේශ පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අවසරය යටතේ හැර කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ යම් විදුලි සංදේශ උපකරණයක් හෝ ගුවන් විදුලි සන්නිවේදන උපකරණයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, කුලියට දීම, බදු දීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදු නොකළ යුතුය. වෙළෙඳ බලපත්‍රය යනු පූර්වෝක්ත ක්‍රියාකාරකම් ඉටුකිරීමෙහිලා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයකි. වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම ආශ්‍රිතව සිදු කරන ක්‍රියාකාරකම් පහත දැක්වේ.

- වෙළඳ බලපත්‍ර පිළිබඳ අයදුම්පත්‍ර ක්‍රියාවලිය සහ ඉල්ලුම්කරු විසින් අවශ්‍ය කොන්දේසි සපුරා ඇති බවට වගබලා ගැනීමෙන් පසු බලපත්‍ර නිකුත් කිරීම.
- වෙළඳ බලපත්‍ර පාලනය කළමනාකරණය කිරීම.
- වෙළඳ බලපත්‍ර ආශ්‍රිත කරුණු වලදී මහජන ආරක්ෂාව, නීතිය හා සාමය සම්බන්ධයෙන් පොලිසිය/ අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තු විමර්ශන වලට සහායවීම.

**නීති විරෝධී වෙළෙන්දන් විමර්ශනය කිරීම**

ජංගම දුරකථන ඇතුළු විදුලි සංදේශ උපකරණ නිත්‍යානුකූලව අලෙවි කිරීමේ ස්ථාන ස්ථාපනය කිරීම බලාත්මක කිරීම සහ දිරිගැන්වීම පිණිස ජාල අංශය ශ්‍රී ලංකා පොලීසියේ සහාය ඇතිව නීති විරෝධී වෙළෙන්දන් විමර්ශනය කිරීම සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව පවත්වයි. ජාල අංශය විසින් සිදු කරන ක්‍රියාකාරකම් වලට අදාල සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

*වගුව 24: ජාල අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වලට අදාල සංඛ්‍යා ලේඛන 2017*

| ජාල අංශය ආශ්‍රිත සංඛ්‍යාලේඛන විස්තරය 2016-2017 | 2016 | 2017 |
|---|---|---|
| නිකුත් කරන ලද මුළු බලපත්‍ර සංඛ්‍යාව | 833 | 834 |
| ඉදි කරන ලද සමුච්චිත කුලුනු සංඛ්‍යාව | 6727 | 6776 |
| කුලුනු සම්බන්ධන්යෙන් ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව | 101 | 98 |
| මෙහෙයවන ලද මුළු විමර්ශන සංඛ්‍යාව (කුලුනු ආශ්‍රිත) | 55 | 32 |
| කුලුනු සම්බන්ධ මුළු අධිකරණ නඩු සංඛ්‍යාව | 0 | 0 |
| පවත්වන ලද මහජනතාව දැනුවත් කිරීමේ මුළු වැඩසටහන් සංඛ්‍යාව | 10 | 04 |
| දෙන ලද මුළු මාදිලි අනුමැති සංඛ්‍යාව | 20 | 38 |
| මුළු ආනයන නිෂ්කාශන නිකුත් කිරීම් සංඛ්‍යාව | 4404 | 3475 |
| මුළු තනි නිෂ්කාශන කිරීම් සංඛ්‍යාව | 25 | 31 |
| නිකුත් කරන ලද මුළු සමුච්චිත නව කෙටි සංකේත අංක සංඛ්‍යාව | 62 | 75 |

**අංකනය: කෙටි සංකේත අංක වෙන් කිරීම**

2017 වර්ෂයේදී රාජ්‍ය ආයතන සඳහා 19XX පරාසයේ සංඛ්‍යාත දහය, සහ හතර කෙටි සංකේත අංක වෙන් කරන ලදී. එම කාලය තුළ පෞද්ගලික අංශයේ ආයතන සඳහා 13XX පරාසයේ කෙටි සංකේත අංක හතරක් වෙන් කර දී ඇත.

**2017 වසරේදී වෙන් කරන ලද කෙටි සංකේත අංක**

*වගුව 25: 2017 වසරේදී වෙන් කරන ලද කෙටි සංකේත අංක (පෞද්ගලික ආයතන සඳහා)*

| ආයතනය | කෙටි සංකේත අංක |
|---|---|
| සීමාසහිත ඩබ්.ඩී.ආර්. සමරකෝන් ලොජිස්ටික්ස් (පෞද්ගලික) සමාගම | 1353 |
| සීමාසහිත එයාර්පෝර්ට් ට්‍රැවල් හෝල්ඩිංග්ස් (පෞද්ගලික) සමාගම | 1375 |
| සීමාසහිත කැපිටල් වන් බිස්නස් ට්‍රේඩිං (පෞද්ගලික) සමාගම | 1378 |
| ඩීසල් ඇන්ඩ් මෝටර් ඉංජිනියරින් පී.එල්.සී. | 1388 |

*වගුව 26: 2017 වසරේදී වෙන් කරන ලද කෙටි සංකේත අංක (රාජ්‍ය ආයතන සඳහා)*

| ආයතනය | කෙටි සංකේත අංක |
|---|---|
| ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 1902 |
| පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | 1917 |
| භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය | 1921 |
| සීමාසහිත ස්වාධීන රූපවාහිනී ජාලය( ITN) | 1930 |
| ජාතික තරුණ සේවා සභාව | 1940 |
| නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 1951 |
| මහජන බැංකුව | 1961 |
| විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 1980 |
| ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) | 1982 |
| විදේශ කටයුතු අමාත්‍යාංශය | 1995 |

**යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම**

**විදුලි සංදේශ කුලුනු ඉදි කිරීම**

2017 වසරේදී ඉදි කරන ලද නව කුලුනු 49 ඇතුලත්ව ඉදි කරන ලද සමුච්චිත විදුලි සංදේශ කුලුනු සංඛ්‍යාව 6776 දක්වා වර්ධනය වී ඇත.

**යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම ආශ්‍රිත පැමිණිලි මෙහෙයවීම**

ජාල අංශය විසින් 2017 වසරේදී මහජනතාවගෙන් කුලුනු ඉදිකිරීමට එරෙහිව ලැබුණු පැමිණිලි 32 සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කර ඇත. කෙසේ වුවද 2017 වසරේ විදුලි සංදේශ කුලුනු ආශ්‍රිත නඩු විභාග නොමැත. කුලුනු ආශ්‍රිත මහජන පැමිණිලි 98ක් 2017 වසරේදී ලැබිණි.

**මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්**

2017 වසරේදී, ජාල අංශය මෙම ක්ෂේත්‍රයේ විශේෂඥ වෘත්තිකයන්ගේ සහාය ඇතුව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් හතරක් පවත්වා ඇත. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන්වල අරමුණ වූයේ විද්‍යුත් චුම්භක විකිරණ සහ අකුණු ගැසීම වැනි ඇන්ටනා කුළුණු ආශ්‍රිත කරුණු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමයි.

**වෙළෙඳ බලපත්‍ර ලබාදීම**

විවිධ විදුලි සංදේශ උපකරණ වර්ග සඳහා 2017 වසරේ බලපත්‍ර 834ක් නිකුත් කරන ලදී.

**මාදිලි අනුමැතිය සහ උපකරණ නිෂ්කාශනය කිරීම**

ජාල ආශ්‍රිත උපකරණ ආනයනය කිරීම සඳහා නිෂ්කාශන ලිපි සහ මාදිලි අනුමැතිය නිකුත් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් ක්‍රියාවලියේදී අංශයට පැවරී ඇති නියාමන කර්තව්‍යයන් ජාල අංශය විසින් අඛණ්ඩව සිදු කර ඇත.

*වගුව 27: මාදිලි අනුමැතිය සහ උපකරණ නිෂ්කාශනය*

| විස්තරය | 2017 දී නිකුත් කරන ලද ලිපි ලේඛන සංඛ්‍යාව |
|---|---|
| උපකරණ නිෂ්කාශනය කිරීම | 3475 |
| මාදිලි අනුමැතීන් | 38 |

## 4.10 පාලන අංශය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පාලන අංශය මගින් ආයතනික සැලසුම්කරණය,සංවිධානය, මෙහෙයවීම, අධීක්ෂණය කිරීම, පාලනය හා වෙනත් ආයතන සමග සම්බන්ධිකරණ කටයුතු සිදු කිරීම වැනි කටයුතු වල නිරත වෙමින් කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ සියලුම අංශ වල කාර්යන් කළමනාකරණය කරයි. වැඩි දුරටත් මෙම අංශය මගින් ආයතනමය සහ විනය කටයුතු, ඇගයීම,පුහුණු කිරීම,ගෙවීම් නිර්දේශ කිරීම සහ අනුමත කිරීම, භාණ්ඩ හා සේවා සම්පාදනය, ප්‍රවාහන පහසුකම් සැලැස්වීම, කාර්ය මණ්ඩලයේ සුභ සාධන කටයුතු වල නිරත වීම මෙන්ම, හිතකර කාර්යාලීය පරිසරයක් නිර්මාණය කිරීම,ප්‍රතිපාදන ලබා ගැනීම,ආයතනික සැලැස්ම,සහ වාර්ෂික වාර්තා පිළියෙළ කිරීම, කොමිෂන් සභාවට අදාළ නීති, රීති පිළියෙළ කිරීම මෙන්ම ආයතනයේ වැදගත් අවස්ථාවන් සලකා මාධ්‍ය ආවරණය ලබාදීම වැනි කටයුතු වල නිරත වේ.ඉහත කරුණු වලට අමතරව මෙම අංශය කොමිෂන් සභාවේ දෛනික කාර්යන් වන පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම,බඳවා ගැනීම්, සේවය ස්ථිර කිරීම්, සේවය උසස් කිරීම්, කාර්ය සාධනය ඇගයීම, විනය පරීක්ෂණ මෙන්ම මානව සම්පත්,
අයවැය පිළියෙළ කිරීම සිදු කරනු ලබයි.

**පාලන අංශයට කාර්ය මණ්ඩලය බඳවා ගැනීම:** ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයකින් තොරව කටයුතු පවත්වාගෙන යා නොහැකි බව සැලකිල්ලට ගෙන 2017 වර්ෂයේදී බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය ප්‍රකාරව පුරප්පාඩු තනතුරු කිහිපයක් සඳහා බඳවා ගැනීම් සිදු කරන ලද අතර මෙම අංශය නුදුරු අනාගතයේදී සෙසු පුරප්පාඩු තනතුරු ක්‍රියාමාර්ග ගන්නා ලදී.
මෙම කාලය තුළදීම කොමිෂන් සභාව මෙම අංශයේ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට සිය අවධානය යොමු කරන ලද අතර අදාල බලධාරීන්ගෙන් අනුමැතිය ලබා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ කොමිෂන් සභාවේ අවශ්‍යතාවයන්ට අනුකූලව කදිරාන පිරික්සුම් මධ්‍යස්ථානයේ පවත්වාගෙන යන ලේඛනාගාරය පිළියෙල කිරීම සිදු කරනු ලබන අතර 2017 වර්ෂය අවසාන වන විට

එහි ප්‍රගතිය 50%කි. ඉහත කාර්යයන්ට අමතරව 2017 වර්ෂයේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ ගබඩා ප්‍රතිසැකසුම්කරණය සම්පූර්ණයෙන්ම නිම කරන ලදී. අදාළ ක්‍රියාපටිපාටියට අනුකූලව 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ භාණ්ඩ සමීක්ෂණය අවසන් කර ඇති අතර වාර්තා බලධාරීන් වෙත ඉදිරිපත් කර ඇත.

ඉහත කරුණු වලට අමතරව, කොමිෂන් සභාව පහත වගුවේ දක්වා ඇති පරිදි අදාළ කාර්ය මණ්ඩලය සඳහා දේශීය සහ විදේශීය පුහුණු පහසුකම් සලසා ඇත.

***වගුව 28: විදේශීය පුහුණු වැඩසටහන් 2017***

| 2017 වර්ෂයේ සපයා ඇති විදේශීය පුහුණු වැඩසටහන් | | | | | |
|---|---|---|---|---|---|
| **අංකය** | **විෂයය/පුහුණුවේ ශිෂ්‍යත්වයේ සම්මන්ත්‍රණයේ විෂය පථය** | **රට** | **සිට** | **දක්වා** | **අරමුදල් සපයා ඇති ආයතනය** |
| 1 | ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුමෙහි ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ සාමාජික | සිංගප්පූරුව | 2016.12.12 | 2016.12.16 | SSLFTA |
| 2 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ - D අධ්‍යයන කණ්ඩායම | ජිනීවා | 2017.01.08 | 2017.01.15 | TRCSL |
| 3 | පළමු රැස්වීම - සංසද කණ්ඩායම | තායිලන්තය | 2017.02.06 | 2017.02.09 | APT |
| 4 | ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ නෛතිකමය මෙවලම් පිළිබඳ WG 4 වන රැස්වීම | තායිලන්තය | 2017.02.06 | 2017.02.11 | TRCSL |
| 5 | කාර්ය කණ්ඩායම 5D | ජිනීවා | 2017.02.13 | 2017.02.17 | TRCSL |
| 6 | ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ආරම්භක ණ්ඩායමේ දෙවන රැස්වීම | පැපුවානිව්ගිනියාව | 2017.02.18 | 2017.02.24 | APT |
| 7 | පොදු රාජ්‍ය මණ්ඩල සමුළුව | එක්සත් රාජධානිය | 2017.03.18 | 2017.03.26 | TRCSL |
| 8 | ග්‍රාමීය සංවර්ධන සමුළුව | ඉන්දුනීසියාව | 2017.03.19 | 2017.03.24 | ITU / TRCSL |
| 9 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ - R අධ්‍යයන කණ්ඩායම 6 | ජිනීවා | 2017.03.20 | 2017.03.26 | APT |
| 10 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ T අධ්‍යයන කණ්ඩායම | ජිනීවා | 2017.03.26 | 2017.03.31 | TRCSL |
| 11 | ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමේ රැහැන් රහිත කණ්ඩායම 21 රැස්වීම | තායිලන්තය | 2017.04.20 | 2017.04.08 | APT |
| 12 | ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමේ රැහැන් රහිත කණ්ඩායම 21 රැස්වීම | තායිලන්තය | 2017.04.02 | 2017.04.08 | APT |
| 13 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ T අධ්‍යයන කණ්ඩායම 2 | ජිනීවා | 2017.04.02 | 2017.04.07 | ITU |
| 14 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ D අධ්‍යයන කණ්ඩායම 24 වන රැස්වීම | ජිනීවා | 2017.04.02 | 2017.04.07 | ITU |
| 15 | අධ්‍යයන කණ්ඩායම - 3 රැස්වීම | ජිනීවා | 2017.04.03 | 2017.04.08 | ITU |

| | | | | | |
|---|---|---|---|---|---|
| 16 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ග්‍රාමීය ගුවන් විදුලි සන්නිවේදන සම්මන්ත්‍රණය - 2017 | කාම්බෝජය | 2017.04.12 | 2017.07.12 | ITU / TRCSL |
| 17 | ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ප්‍රායෝගික ප්‍රශ්න විසඳුම් නිපුනතා සංවර්ධන පුහුණු පාඨමාලාව | ජපානය | 2017.04.12 | 2017.12.15 | APT |
| 18 | දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ සංගමයේ කාර්ය කණ්ඩායම - ප්‍රතිපත්ති, නියාමන සහ සේවා | බංගලාදේශය | 2017.04.18 | 2017.04.19 | APT |
| 19 | ආසියා ශාන්තිකර සංඛ්‍යාත වර්ණාවලි කළමානාකරණය පිළිබද 3 වන වාර්ෂික සම්මන්ත්‍රණය | තායිලන්තය | 2017.05.01 | 2017.05.05 | HUWAVI |
| 20 | දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ සංගමයේ සංඛයාත වර්ණාවලිය පිලිබද කාර්ය කණ්ඩායම | ඉන්දියාව | 2017.05.15 | 2017.05.18 | APT |
| 21 | ජාත්‍යන්තර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සුවේච්ජාදායකයන්ගේ කඳවුර 2017 | කොරියාව | 2017.05.23 | 2017.05.28 | ITU |
| 22 | තොරතුරු තාක්ෂන් ව්‍යවසාය 2017 | සිංගප්පූරුව | 2017.05.23 | 2017.05.26 | TRCSL |
| 23 | සංඛයාත වර්ණාවලි කලමනාකරන පිළිබද කලාපිය සම්මන්ත්‍රණය | ඉතාලිය | 2017.05.28 | 2017.06.01 | TRCSL |
| 24 | කොළඹ නෙලුම් කුලුන ව්‍යාපෘතිය | චීනය | 2017.06.10 | 2017.06.15 | ITU |
| 25 | ඞී.වී.නිරන්ජන් - ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ආසියා ශාන්තිකර මධ්‍යස්ථානයේ විශිෂ්යත්ව වැඩසටහන | ඉන්දියාව | 2017.06.11 | 2017.10.11 | TRCSL |
| 26 | කොළඹ නෙලුම් කුළුන ව්‍යාපෘතිය | චීනය | 2017.06.11 | 2017.06.14 | CEIEC |
| 27 | ලෝක තොරතුරු සමුළුව 2017 | ජිනීවා | 2017.06.11 | 2017.06.18 | ITU |
| 28 | ලෝක තොරතුරු සමුළුව 2017 | ජිනීවා | 2017.06.11 | 2017.06.18 | ITU |
| 29 | කාර්ය කණ්ඩායම 1C රැස්වීම | ජිනීවා | 2017.06.12 | 2017.06.17 | TRCSL |
| 30 | ITU - R 27 වෙනි රැස්වීම | කැනඩාව | 2017.06.12 | 2017.06.18 | TRCSL |
| 31 | අධ්‍යයන කණ්ඩායම - 15 | ජිනීවා | 2017.06.19 | 2017.06.22 | TRCSL |
| 32 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති පාඨමාලාව | කොරියාව | 2017.06.08 | 2017.06.17 | APT |
| 33 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂන ප්‍රතිපත්ති පිළිබද පුහුණු පාඨමාලාව | කොරියාව | 2017.06.09 | 2017.06.15 | APT |
| 34 | කොළඹ නෙළුම් කුළුන ඉදි කිරීම සහ අවසන් කිරීම | තායිලන්තය | 2017.06.30 | 2017.08.03 | CEIEC |
| 35 | ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ 14 වෙනි විදුලි සංදේශනය තොරතුරු හා සන්නිවේදන තාක්ෂන සංවර්ධන සමුළුව | පිලිපීනය | 2017.08.04 | 2017.08.09 | APT |

| | | | | | |
|---|---|---|---|---|---|
| 36 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ආසියා ශාන්තිකර මධ්‍යස්ථානයේ විශිෂ්ටත්ව වැඩසටහන 2017 වර්ෂයේ සපයා ඇති විදේශීය පුහුණු වැඩසටහන් | තායිලන්තය | 2017.08.06 | 2017.08.12 | ITU |
| 37 | ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ආරම්භක කණ්ඩායමේ 4 වෙනි රැස්වීම | මැලේසියාව | 2017.08.06 | 2017.08.11 | APT |
| 38 | දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ සංගමයේ වැඩමුළුව | පකිස්ථානය | 2017.08.15 | 2017.08.19 | APTAPT |
| 39 | දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ සංගමයේ වැඩමුළුව | පකිස්ථානය | 2017.08.15 | 2017.08.19 | APT |
| 40 | දකුණු ආසියානු විදුලි සංදේශ සංගමයේ 29 වන ප්‍රමිතිකරණය | තායිලන්තය | 2017.08.21 | 2017.08.26 | APT |
| 41 | ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංදේශ සංගමයේ 29 වන ප්‍රමිතිකරණය | තායිලන්තය | 2017.08.21 | 2017.08.26 | APT |
| 42 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂන සංඛ්‍යාලේඛන පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ආසියා ශාන්තිකර කලාපිය වැඩමුළුව | චීනය | 2017.08.21 | 2017.08.27 | ITU |
| 43 | ජාත්‍යන්තර චන්ද්‍රිකා සම්මන්ත්‍රණය 2017 | තායිලන්තය | 2017.08.29 | 2017.09.02 | APT |
| 44 | අධ්‍යයන කණ්ඩායම - 20 රැස්වීම | ජිනීවා | 2017.09.03 | 2017.09.09 | ITU |
| 45 | කළමනාකරණ නවෝත්පාදන පිළිබඳ ජාත්‍යන්තර පුහුණු පාඨමාලාව | තායිලන්තය | 2017.09.03 | 2017.09.10 | TRCSL |
| 46 | සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව | ඉන්දියාව | 2017.09.05 | 2017.09.13 | APT |
| 47 | විශේෂඥ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක පිළිබඳ 8 වැනි රැස්වීම | ජිනීවා | 2017.09.11 | 2017.09.16 | ITU |
| 48 | විශ්වීය ප්‍රවේශ පිළිබඳ අධිවේගී අන්තර්ජාල සේවා ප්‍රතිපත්තිය | ඉන්දියාව | 2017.09.13 | 2017.09.19 | APT |
| 49 | ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ රැහැන් රහිත කණ්ඩායමේ 22 වන රැස්වීම | කොරියාව | 2017.09.24 | 2017.09.30 | APT |
| 50 | සංඛ්‍යාත වර්ණාවලි ඉංජිනේරුකරණය සහ ගුවන් විදුලි සංඛ්‍යාත සීමාවන් පිළිබඳ පාඨමාලාව | චීනය | 2017.10.10 | 2010.10.16 | ITU |
| 51 | 5G සන්නිවේදන පද්ධතිය සහ අන්තර්ජාලය පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව | චීනය | 2017.10.05 | 2017.10.27 | APT |
| 52 | ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ 8 වෙනි සයිබර් ආරක්ෂණ සමුළුව (CSF -8) | බංගලාදේශය | 2017.10.23 | 2017.10.27 | APT |

| | | | | | |
|---|---|---|---|---|---|
| 53 | ආසියාව සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ T අධ්‍යයන කණ්ඩායම 3 කලාපීය කණ්ඩායම් රැස්වීම | කොරියාව | 2017.10.24 | 2017.10.24 | TRCSL / ITU |
| 54 | ආසියාව සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ T අධ්‍යයන කණ්ඩායම 3 කලාපීය කණ්ඩායම් රැස්වීම | කොරියාව | 2017.10.24 | 2017.10.27 | TRCSL |
| 55 | නවීන රැහැන් රහිත සන්නිවේදන තාක්ෂණ ප්‍රවණතා සහ සංඛ්‍යාත වර්ණාවලිය ඵලදායිව භාවිතා කිරීම සැලසුම් කිරීම | ජපානය | 2017.11.13 | 2017.11.21 | APT |
| 56 | ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ මහා සභා රැස්වීමේ 14 වන සැසිවාරයේ ප්‍රාරම්භක රැස්වීම | තායිලන්තය | 2017.11.14 | 2017.11.22 | TRCSL |
| 57 | ආසියා ශාන්තිකර ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ 14 වන මහා සභා සැසියේ ප්‍රාරම්භක රැස්වීම | තායිලන්තය | 2017.11.14 | 2017.11.22 | TRCSL |
| 58 | ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ චන්ද්‍රිකා සන්නිවේදන උසස් මට්ටමේ විදුලි සංදේශ පුහුණු මධ්‍යස්ථානයේ (ALTTC) පුහුණු පාඨමාලාව | ඉන්දියාව | 2017.11.15 | 2017.11.21 | APT |
| 59 | පුළුල් දත්ත සහ විදුලි සන්දේෂණයේ බලපෑම පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව | චීනය | 2017.11.20 | 2017.11.29 | APT |
| 60 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ITU-R කාර්ය IB රැස්වීම | ජිනීවා | 2017.11.23 | 2017.11.30 | TRCSL / ITU |
| 61 | ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය සහ රැහැන් රහිත අධිවේගී අන්තර්ජාල යටිතල පහසුකම් පිරික්සීම පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව | ජපානය | 2017.11.28 | 2017.12.12 | APT |
| 62 | ප්‍රථම මූල්‍ය අන්තර්ගත ගෝලීය සමාරම්භක සම්මන්ත්‍රණය | ඉන්දියාව | 2017.11.28 | 2017.12.12 | TRCSL |
| 63 | දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ 18 වන මහා සභාව | නේපාලය | 2017.12.19 | 2017.12.21 | TRCSL |
| 64 | දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ 18 වන මහා සභාව | නේපාලය | 2017.12.19 | 2017.12.21 | TRCSL |

***වගුව 29: දේශීය පුහුණු වැඩසටහන් 2017***

| 2017 වර්ෂයේ සපයා ඇති දේශීය පුහුණු වැඩසටහන් | | | |
|---|---|---|---|
| **අංකය** | **පුහුණු වැඩසටහන** | **ආයතනය** | **දිනය** |
| 1 | ශ්‍රී ලංකා වෙබ් අඩවි ඉලක්ක කරගත් සයිබර් ප්‍රහාර | පශ්චාත් කළමනාකරණ ආයතනය | 2017 පෙබරවාරි 16 – 17 දින |
| 2 | සේවකයින් සහ කාර්මිකයින් සඳහා නඩත්තු කිරීම පිළිබඳ කාර්මික වැඩසටහන | හෙක්ටර් කොබ්බෑකඩුව ආයතනය | 2017 ජනවාරි 15 |

| | | | |
|---|---|---|---|
| 3 | තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2017 |
| 4 | තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | SLIIT | 2017 |
| 5 | එකතු කල අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීමේ මාර්ගගත ප්‍රතිලාභ සැලකිරීම පිළිබඳ වැඩමුළුව | වරලත් ආයතනය | 2017 අප්‍රේල් 30 |
| 6 | රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව<br>2017 වර්ෂයේ සපයා ඇති දේශීය පුහුණු වැඩසටහන් | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2017 |
| 7 | ඉංග්‍රීසි ඩිප්ලෝමාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2017 |
| 8 | පරිගණක ජාල පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය | 2017 |
| 9 | ජාතික මානව සම්පත් සමුළුව | BMICH | 2017 ජුනි 20 – 21 |
| 10 | ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා සම්මන්ත්‍රණය | ශ්‍රී ලංකා පුස්තකාල සංගමය | 2017 මැයි 29 |
| 11 | මානව සම්පත් සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | මානව සම්පත් කළමනාකරණ ආයතනය | 2017 |
| 12 | රාජ්‍ය ප්‍රසම්පාදන වැඩමුළුව | නිපුනතා සංවර්ධන අරමුදල | 2017 පෙබරවාරි 27-28 |
| 13 | හදිසි කුණාටු අවස්ථා දැනුවත්කිරීමේ ශ්‍රී ලාංකීය ව්‍යාපෘතිය පිළිබඳ සම්මන්ත්‍රණය | කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 2017 |
| 14 | රියදුරු නිපුණතා සංවර්ධනය | නිපුනතා සංවර්ධන අරමුදල | 2017 පෙබරවාරි 28-29 |
| 15 | ජාතික කළමනාකාරිත්ව ගණකාධිකරණ සම්මන්ත්‍රණය | | 2017 ජුලි 17-19 |
| 16 | වාහන කළමනාකරණය | | 2017 ජුලි 28 |
| 17 | ජාල සහ පරිගණක මෘදුකාංග ඩිප්ලෝමාව | | 2017 |
| 18 | මානව සම්පත් කලමනාකරණය සහ වෘත්තීය සංවර්ධනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 2017 |
| 20 | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ජාතික සම්මන්ත්‍රණය | වරලත් ආයතනය | 2017 ඔක්තෝබර් 19-21 |
| 21 | නිරායුධකරණය පිළිබඳ විධායක සම්මන්ත්‍රණය | ඇමරිකන් තානාපති කාර්යාලය | 2017 නොවැම්බර් 15-16 |
| 22 | මූලික සහ අන්තර් දත්ත විශ්ලේෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | | 2017 |
| 23 | වාර්ෂික තොග භාණ්ඩ සමීක්ෂණය | සීමාසහිත PRAG සේවා (පෞද්ගලික) සමාගම | 2017 නොවැම්බර් 09 |
| 24 | 12 වෙනි ආයතනික නීති සම්මන්ත්‍රණය | ශ්‍රී ලංකා ආයතනික නිතික්නවරුන්ගේ සංගමය | 2017 ඔක්තෝබර් 27 |

| | | | |
|---|---|---|---|
| 25 | විදුලි සංදේශ ඉංජිනේරුකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව | සීමාසහිත APSS ජාත්‍යන්තර ජාල (පෞද්ගලික) සමාගම | 2017 |
| 26 | අයවැය සම්මන්ත්‍රණය | වරලත් ආයතනය | 2017 නොවැම්බර් 11 |
| 27 | මයික්‍රෝ සොෆ්ට් එක්සෙල් උසස් විශ්ලේෂණ මෙවලම් | ආදම් නිපුනතා සංවර්ධන මධ්‍යස්ථානය | 2017 නොවැම්බර් 11 |

## 4.11 මූල්‍ය අංශය

ව්‍යවස්ථානුකූලව අවශ්‍යතාවයක්, මූල්‍ය රෙගුලාසි සහ රජයට මෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට අදාල චක්‍රලේඛවලට අනුගතව කාර්යක්ෂම සහ ඵලදායි ආකාරයෙන් මූල්‍ය කළමනාකරණය කිරීම කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයක් වේ. මූල්‍ය පාලනය මෙන්ම වියදම් කිරීම සඳහා කොමිෂන් සභාව එකම ආකල්පයක් යුතුව ක්‍රියා කළ යුතු අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් ප්‍රසිද්ධ කළ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට සහ ගිණුම්කරණ ප්‍රමිතීන්ට ප්‍රකාරව මෙන්ම අවශ්‍ය පරිදි රජයේ මූල්‍ය රෙගුලාසිවල අනුකූලව මූල්‍ය වාර්තා පවත්වාගෙන යාමේ වගකීමද අවශ්‍ය වේ. මීට අමතරව ඓතිහාසික දත්ත, මූල්‍ය පරිපාලනය, පිරිවැය පාලනය, ව්‍යාපෘති ඇගයීම, සැලසුම්කරණය, සංවර්ධනය කිරීම වෙන් උපාය මාර්ගික තීරණ ගැනීම අංශයේ ප්‍රධාන කාර්යයන් අතර කිහිපයකි.

**කාර්යයන්**

- අයවැය/පුරෝකථනය සහ ඒ හා සමාන කාරණාවල විචල්‍යයන්ට අනුව මූල්‍ය බලපෑම් වාර්තාකරණය කිරීම.
- වාර්ෂික අයවැය/පුරෝකථන පිළියෙල කිරීම.
- අභ්‍යන්තර පාලන පද්ධතිය ස්ථාපනය කිරීම සහ පවත්වාගෙනයාම.
- සියළුම ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තා පවත්වාගෙනයාම සහ සේවා ප්‍රශස්ත ආකාරයෙන් පරිහරණය කිරීමට සහ ආරක්ෂා කිරීමට වගබලා ගැනීම.
- ප්‍රාග්ධන සහ ආදායම් වියදම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙහිලා ඉහල කළමණාකාරිත්වයට උපදෙස් ලබාදීම සහ සහායවීම.
- බදු සැලසුම්කරණය කිරීම මෙන්ම අදාල ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීම.
- විගණකාධිපති වාර්තා සහ විගණන කමිටු වාර්තා වැනි මූල්‍ය වාර්තා සහ කාලානුරූප මෙහෙයුම් සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම මෙන්ම අවශ්‍ය නම් අපගමනයන් නිවැරදි කිරීම සඳහා නිවැරදි/සුදුසු ක්‍රියාමාර්ග ගැනිම.
- රජය සහ පාර්ලිමේන්තු පනත මගින් පනවන විවිධ බදු කඩිනමින් එකතු කිරීමට වගබලා ගැනීම සහ ක්‍රියාමාර්ග ගැනීම.
- එකතු කරන ලද අරමුදල් කාර්යක්ෂමව සහ නිසි පරිදි මහා භාණ්ඩාගාරය සඳහා ප්‍රේෂණය කිරීමට වග බලා ගැනීම.
- අතිරික්ත අරමුදල් ඇත්නම් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අඩු අවදානමක් සහිත වැඩි ප්‍රතිලාභ ලබන ආයෝජනවල ප්‍රශස්ත ලෙස පරිහරණය කිරීමට වග බලා ගැනිම.
- කොමිෂන් සභාවේ කාර්තු හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.
- ආදායම, වියදම, වත්කම් සහ වගකීම් පිළිබඳව මූල්‍යකරණය සහ සංඛ්‍යාලේඛන වාර්තා පවත්වාගෙනයාම මෙන්ම ඉහළ කළමණාකාරිත්වයට අවශ්‍ය වූ විට තොරතුරු සැපයීම.

**කාර්යසාධනය**

ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු, සෙස් ගාස්තු, පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු, වෙළෙඳ බලපත්‍ර ගාස්තු, පොදු ස්විචීකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකරුවන්ගෙන් සහ ගුවන් විදුලි සංඛ්‍යාත පරිහරණය කරන්නන්ගෙන් ලැබෙන සෙසු අදාල ගාස්තු උපයා ගැනීම සහ එක්රැස් කිරීමේ බලය කොමිෂන් සභාවට පැවරී ඇත.

*වගුව 30: ශ්‍රී ලංකා විදුලි සංදේශ කොමිෂන් සභාවේ ආදායම 2015-2017*

| ආදායම් ප්‍රභවය | 2015 (රු. '000) | 2016 (රු. '000) | 2017 (රු. '000) |
|---|---|---|---|
| පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු | 107,708 | 1,751,344 | 690,143 |
| සෙස් ගාස්තු | 3,840,742 | 4,067,179 | 4,211,920 |
| ගුවන්විදුලි සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු | 6,756,145 | 7,496,093 | 6,861,209 |
| ගුවන් විදුලි සංඛ්‍යාත පූර්ව ගාස්තු | 0 | 367,347 | 4,509,184 |
| වෙළෙඳ බලපත්‍ර ගාස්තු | 13,087 | 14,771 | 13,664 |
| ආධුනික ගුවන්විදුලි බලපත්‍ර ගාස්තු | 56 | 73 | 29 |
| නැව් මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු | 764 | 892 | 440 |
| ගුවන්යානා බලපත්‍ර ගාස්තු | 941 | 1,170 | 396 |
| රැහැන් රහිත දුරකථන වෙළෙඳ ගාස්තු | 66,757 | 90,760 | 109,217 |
| විභාග ගාස්තු | 394 | 417 | 458 |
| අයදුම්පත් සැකසුම් ගාස්තු | 6,531 | 1,632 | 1,428 |
| කෙටි සංකේත ගාස්තු | 14,796 | 19,388 | 27,704 |
| විවිධ ආදායම් (ස්ථාවර තැන්පතු සහ කාර්ය මණ්ඩල ණය යනාදිය සඳහා පොළියෙන් ලැබෙන ආදායම) | 1,117,143 | 2,295,412 | 2,272,462 |
| **එකතුව** | **11,925,066** | **16,106,478** | **18,698,254** |

**විදුලි සංදේශ බදු**

විදුලි සංදේශ පනත ප්‍රකාරව විදුලි සංදේශ සේවා සැපයීමේ වටිනාකම මත විදුලි සංදේශ බදු වල වර්තමාන අනුපාතය 25% ක් වන අතර පසුගිය වසර තුන තුළ රැස්කරන ලද ආදායම පහත ප්‍රස්ථාරයේ දැක්වේ.

*ප්‍රස්ථාරය 04: 2015-2017 දක්වා විදුලි සංදේශ බදු*



**සෙස් ගාස්තු**

විදුලි සංදේශ ක්‍රියාකර සමාගම් වලින් කොමිෂන් සභාව විසින් රැස්කරන වාර්ෂික දළ පිරිවැටුප මත සෙස් බදු ප්‍රමාණය 2% කි.

**ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු**

2009 අංක 13 දරන මුදල් පනතින් සංශෝධිත 2004 අංක 11 දරන මුදල් පනත ප්‍රකාරව කොමිෂන් සභාව ජාත්‍යන්තර ක්‍රියාකරුවන්ගෙන් මිනිත්තුවකට ඇමරිකානු ඩොලර් 0.06 බද්දක් අය කරන අතර එම බද්දෙන් 50% ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර ඉතිරිය විදුලි සංදේශ සංවර්ධන ගාස්තු - Telecommunication Development Charges (TDC) ලෙස රඳවා ගනී. පිටතට යැවෙන ඇමතුම් ගාස්තු සඳහා බදු මිනිත්තුවකට රු. 3.00ක් වන අතර පසුගිය වර්ෂ තුන තුළ රැස් කරන ලද ආදායම පහත ප්‍රස්ථාරයේ දැක්වේ.

*ප්‍රස්ථාරය 05: ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගේ බදු (2015-2017)*




සියලුම බදු සහ සෙස ගාස්තු වලින් පසුගිය වසර තුන තුළ රැස්කරන ලද මුළු ආදායම පහත ප්‍රස්ථාරයෙන් දැක්වේ.

*ප්‍රස්ථාරය 06: මුළු ආදායම (2015-2017)*



**ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ**

රජයේ ආදායම ශක්තිමත් කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රජයේ ඒකාබද්ධ අරමුදලට විශාල මුදල් ප්‍රමාණයක් ප්‍රේෂණය කර ඇත.

*වගුව 31: ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ*

| විස්තරය | 2015<br>රු. බිලියන | 2016<br>රු. බිලියන | 2017<br>රු. බිලියන |
|---|---|---|---|
| විදුලි සංදේශ පනත/ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුදල | 10.00 | 28.00 | 22.80 |
| විදුලි සංදේශ බදු | 27.86 | 30.34 | 29.13 |
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව 50% | 2.93 | 4.34 | 3.11 |
| පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු මත බදු | 1.61 | 1.13 | 0.73 |
| ජංගම විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගේ බදු | 1.25 | 0 | 0 |
| **එකතුව** | **43.65** | **63.81** | **55.77** |

**දේපළ, පිරියත සහ උපකරණ**

2017 වර්ෂය තුළ, රුපියල් මිලියන 11.2 වටිනාකමකින් යුත් පහත සඳහන් කාර්යාලයේ උපකරණ සහ ගෘහ උපකරණ මිලදී ගෙන ඇත.

| | |
|---|---|
| පරිගණක | රුපියල් මිලියන 6.6 |
| කාර්යාල උපකරණ | රුපියල් මිලියන 2.3 |
| තාක්ෂණික උපකරණ | රුපියල් මිලියන 1.2 |
| කාර්යාල ගෘහ උපකරණ | රුපියල් මිලියන 1.1 |
| **එකතුව** | **රුපියල් මිලියන 11.2** |

**ආයෝජන**

කොටස් වෙළඳපල ගනුදෙනු වලින් මහජන බැංකුවේ දෛනික කොටස් වෙළෙඳපල ගිණුමේ 2017 වර්ෂය සඳහා උපයන ලද පොලිය රුපියල් මිලියන 210කි.

# 05 පරිච්ඡේදය

## අභ්‍යන්තර විගණන කාර්යසාධනය සහ විගණන කමිටු වාර්තා

අභ්‍යන්තර විගණන අංශය ස්වාධීනව ක්‍රියාකරන අංශයක් වන අතර එම අංශයේ අරමුණ වන්නේ නිර්දේශ පාදක කරගත් හෝ විදිමත් විශ්ලේෂණය සැපයීම සහ දත්ත සහ ව්‍යාපාරික ක්‍රියාවලිය තක්සේරු කිරීම මගින් ආයතනික පාලන ඵලදායීත්වය, ආපදා කළමනාකරණය සහ කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කිරීම වැනි කරුණු වලට අනුගතව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ එහි පාර්ශවකරුවන්ගේ වටිනාකම එකතු කිරීමයි. එමෙන්ම මෙම අංශය මෙහෙයුම් කාර්යක්ෂමතාවය, මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය, වංචා වලට දඬුවම් ලබාදීම සහ විහර්හනය කිරීම, වත්කම් ආරක්ෂා කිරීම, අදාළ නීති සහ රීති වලට අනුකූලතාවය දැක්වීම වැනි එහි කාර්යභාරයන්හි නිරතව ක්‍රියා කරයි. අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා සෘජුවම කොමිෂන් සභාවට වාර්තා කරන අතර විගණන වාර්තා විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. පරිපාලනමය වශයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක අධ්‍යක්ෂ ජනරාල් වරයාට වාර්තා කළ යුතු වේ.

කාර්යයන්

- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පවත්නා ගිනුම් තැබීම සහ වාර්තාකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා ඒවා සමාලෝචනය කිරීම සහ ඇගයීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කිසියම් ගැටළු පැන නැගී තිබේ නම් ඒවාට අදාළ බලපෑම් විමර්ශනය කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වත්කම් අලාභහානීන් සහ වංචා වලින් ආරක්ෂ වී තිබේ දැයි නිශ්චිතව දැන ගැනීම
- ගණු දෙනු වල අවශ්‍යතාවය, ගණු දෙනු වල ප්‍රතිලාභ විමර්ශනය කිරීම සහ නාස්තිය සහ පමණ ඉක්මවා වියදම් කිරීම, ඉවත් කිරීම තුලින් වියදම් අඩු කිරීමේ වාර්තා පිළිබඳව ගවේශණය කිරීම.
- ඉහත දැක්වෙන ක්‍රියා මාර්ග තුලින් සොයා දැන ගන්නට ලැබෙන කරුණු පාදක කර ගනිමින් විගණන කමිටු වෙත වාර්තා ඉදිරිපත් කිරීම සහ විගණන කමිටු රැස්වීම් කැදවීමට පියවර ගැනීම.
- විගණන කමිටු තීරණ සකස් කිරීම සහ අදාළ නිසි ක්‍රියාමාර්ග ගැනීම පිණිස ඒවා අංශ ප්‍රධානීන් අතර බෙදා හැරීම.
- විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත අර්ධ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම.
- අධ්‍යක්ෂ ජනරාල් / කොමිෂන් සභා සාමාජිකයින් ඉල්ලා සිටින විට විශේෂ විමර්ශන පැවැත්වීම.
- අධ්‍යක්ෂ ජනරාල් / කොමිෂන් සභාව විසින් කලින් කල පත් කරනු ලබන විවිධ කමිටු වලට සහාය වීම හා නිර්දේශ ලබාදීම.

**2017 කාර්යසාධනය**

2017 වර්ෂයේදී, විගණන කමිටු රැස්වීම් හතරක් පවත්වා ඇති අතර, එම රැස්වීම් වලදී පහත සඳහන් කරුණු සාකච්ඡා කර ඇත.

2017 මැයි 30 දින පැවති විගණන කමිටු රැස්වීම පහත දැන්වෙන වාර්තා / කරුණු සාකච්ඡා කර ඇති අතර ඒ සඳහා ගන්නා ලද තීරණ / ක්‍රියාමාර්ග මතු දැක්වේ.

| විෂය ක්ෂේත්‍රය | ගන්නා ලද ක්‍රියාමාර්ග / තීරණ |
|---|---|
| නෙළුම් කුළුණ සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උද්‍යානයේ අභ්‍යන්තර විගණනය. | එකී ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණනය සිදු කිරීම පිණිස සුදුසු ආයතනයක් තෝරා ගැනීම සඳහා උපදෙස් දීම. |
| විදුලි සංදේශ බදු සහ සෙස් ගාස්තු රැස් කිරීම | විදුලි සංදේශ බදු සහ සෙස් ගාස්තු සඳහා වාර්තා කරණ ආකෘති පත්‍රයක් හඳුන්වා දීම. |
| ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ හිඟ මුදල් ගෙවීම. | කොමිෂන් සභා පත්‍රිකාවක් ඉදිරිපත් කළ යුතු බව. |
| ජංගම දුරකථන ක්‍රියාකරු බදු. | නියමිත දිනයට අය බදු රැස් කළ යුතු බව. |
| ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම - 2016 ජනවාරි සිට මාර්තු දක්වා | පිළිතුරක් යැවීමට උපදෙස් දීම |
| විදේශ ගමන් | වැරදි නිවැරදි කිරීම |
| ව්‍යවස්ථාපිත ගෙවීම් - 2016 අගෝස්තු සිට 2017 අප්‍රියෙල් දක්වා කාලය | මීළඟ රැස්වීමේදී තොරතුරු ඉදිරිපත් කිරීම |
| විගණකාධිපතිගෙන් ලැබුණු වාර්තා | ගිවිසුම අත්සන් කිරීම සඳහා නීති උපදෙස් ලබා ගැනීම. |
| 2017 වර්ෂය සඳහා ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම සහ අයවැය. | කලින් පිළියෙල කිරීම සහ අවශ්‍ය පියවර ගැනීම |
| වාර්තා අංක CIA/16/08 - දිනය 2016.11.24 කාර්යාල ක්‍රම විශ්ලේෂණය සහ ලිපිගොනු පවත්වාගෙන යාම. | අඩුලුහුඩුකම් නිවැරදි කිරීම සඳහා පියවර ගැනීම |
| වාර්තා අංක CIA/16/09 - දිනය 2016.12.16 ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම 2016 අප්‍රියෙල් සිට ජූනි දක්වා | පිළිතුරක් යැවීමට උපදෙස් දීම |
| වාර්තා අංක අංක CIA/16/10 - දිනය 2016.12.29 අත්තිකාරම් වවුචර් පියවීම පරීක්ෂා කිරීම. | අඩුලුහුඩුකම් නිවැරදි කිරීමට පියවර ගැනීම |
| වාර්තා අංක CIA/17/02 - දිනය 2017.05.16 විගණකාධිපතිගෙන් ලැබුණ වාර්තා | වැරදි නිවැරදි කිරීමට පියවර ගැනීම |

## කමිටුව විසින් සාකච්ඡා කරන ලද වෙනත් කරුණු

- 2016/12/31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීම ප්‍රමාදවීම
- අභ්‍යන්තර විගණක පුරප්පාඩුව පිරවීම ප්‍රමාද වීම

2017 අගෝස්තු 15 දින පැවති විගණන කමිටු රැස්වීම පහත දැක්වෙන වාර්තා / කරුණු සාකච්ඡා කර ඇති අතර ඒ සඳහා ගන්නා ලද තීරණ / ක්‍රියාමාර්ග මතු දැක්වේ.

| විෂය ක්ෂේත්‍රය | ගන්නා ලද ක්‍රියා මාර්ග / තීරණ |
|---|---|
| වාර්තා අංකය CIA/17/01 - දිනය 2017.05.09<br><br>ආපදා ණය ලිපිගොනු සහ අදාළ රෙජිස්ටර | සියළුම ආපදා ණය ලිපිගොනු පරීක්ෂා කිරීම |
| වාර්තා අංකය CIA/17/03 - දිනය 2017.08.10 විගණකාධිපති ගෙන් ලැබුණු විගණන විමසුම් | විගණකාධිපති වෙත පිළිතුරු යැවීම කඩිනම් කිරීම |
| කොළඹ නෙළුම් කුළුණ තොරතුරු තාක්ෂණ උද්‍යානයේ අභ්‍යන්තර විගණනය | විමර්ශන කොන්දේසි සඳහා විගණකාධිපතිගෙන් එකගතාවය ලබාගැනීම |
| විදුලි සංදේශ බදු සහ සෙස් ගාස්තු රැස් කිරීම | තීරණය පරිදි වාර්තාකරන ආකෘතිපතු වැඩිදියුණු කිරීම |
| ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් අය විය යුතු හිග මුදල් | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සමග හිග මුදල් ශේෂය පිළිබදව එකගතාවයකට පැමිණීමට අවශ්‍ය පියවර ගැනීම |
| ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම<br><br>2016 ජනවාරි සිට මාර්තු සහ 2016 අප්‍රේල් සිට ජූනි දක්වා | අදාළ ප්‍රේෂණ සඳහා සේවකයන්ගේ අත්සන් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම |
| විදේශ ගමන් | සිය විදේශ ගමනින් පසුව වාර්තා ඉදිරිපත් නොකරන ලද නිලධාරීන්ගේ නම් ඇතුලත් කොමිෂන් සභා පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම |
| ව්‍යවස්ථාපිත ගෙවීම්<br><br>2016 අගෝස්තු සිට 2017 අප්‍රේල් දක්වා | සාරාංශය අනුව ප්‍රේෂණ දින නිවැරදිදැයි පරීක්ෂා කිරීම |
| 2017 වසර සඳහා ආයතනික සැලැස්ම / ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම සහ අයවැය | මෙම වාර්තා කල් ඇතිව ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම |
| 2014 හා 2015 වාර්ෂික වාර්තා | මෙම වාර්තා කල් ඇතිව ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම |
| අත්තිකාරම් වවුචර් පියවීම පරීක්ෂා කිරීම | හඳුන්වාදෙන ලද පටිපාටිය ක්‍රියාත්මක වන්නේ දැයි පරීක්ෂා කිරීම |
| විගණකාධිපතිගෙන් ලැබුණු විගණන විමසුම් | වැඩිදුර ක්‍රියාමාර්ග ගෙන නොමැත |

2017 ඔක්තෝම්බර් 24 දින පැවති විගණන කමිටු රැස්වීම

පහත දැක්වෙන වාර්තා / කරුණු සාකච්ඡා කර ඇති අතර, ඒ සඳහා ගන්නා ලද තීරණ / ක්‍රියාමාර්ග මතු දැක්වේ.

| විෂය ක්ෂේත්‍රය | ගන්නා ලද ක්‍රියා මාර්ග / තීරණ |
|---|---|
| නෙළුම් කුළුණ තොරතුරු තාක්ෂණ උද්‍යානයේ අභ්‍යන්තර විගණනය | කොමිෂන් සභාව වෙත විමර්ශන කොන්දේසි ඉදිරිපත් කිරීම |
| විදුලි සංදේශ බදු සහ සෙස් බදු රැස් කිරීම | ක්‍රියාකාර සමාගම් විසින් මාසිකව එවන ලද තොරතුරු නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම |
| ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු<br><br>ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ හිග මුදල් ගාස්තු | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සමග අවසන් ශේෂය පිළිබඳව එකගතාවයකට පැමිණීම |
| 2018 වර්ෂය සඳහා අයවැය | මී ළග කොමිෂන් සභා රැස්වීමට ඉදිරිපත් කිරීම |
| 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සහ ක්‍රියාකාරි සැලැස්ම | මී ළග කොමිෂන් සභා රැස්වීමට ඉදිරිපත් කිරීම |
| 2017 සිට 2020 කාලපරිච්ඡේදය සඳහා ආයතනික සැලැස්ම | කලින් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම |
| ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම 2016 අප්‍රියෙල් සිට ජුනි දක්වා | අධ්‍යක්ෂ ජනරාල් සමග කරුණු සාකච්ඡා කිරීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම |
| ව්‍යවස්ථාපිත ගෙවීම් - 2016 අගෝස්තු සිට 2017 අප්‍රේල් දක්වා<br><br>විගණකාධිපතිගෙන් ලැබුණු විගණන විමසුම්<br><br>2018 වර්ෂය සඳහා සාරාංශ ගත කරන ලද අභ්‍යන්තර විගණන වැඩසටහන | අදාළ ආයතන වෙත නියමිත දිනයට සියළුම ප්‍රේෂණ යැවීම<br><br>අවශ්‍ය පියවර ගැනීම<br><br>අනුමත කරන ලදී |

2017 දෙසැම්බර් 12 දින පැවති විගණන කමිටු රැස්වීම

පහත දැක්වෙන වාර්තා / කරුණු සාකච්ඡා කර ඇති අතර ඒ සඳහා ගන්නා ලද තීරණ ක්‍රියාමාර්ග මතු දැක්වේ.

| විෂය ක්ෂේත්‍රය | ගන්නා ලද ක්‍රියා මාර්ග / තීරණ |
|---|---|
| නෙළුම් කුළුණ තොරතුරු තාක්ෂණ උද්‍යානයේ අභ්‍යන්තර විගණනය | නෙළුම් කුළුණේ අභ්‍යන්තර විගණනය සිදු කිරීම පිණිස අභ්‍යන්තර විගණකවරයකු තෝරා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත |
| විදුලි සංදේශ බදු සහ සෙස් බදු රැස් කිරීම | 2017 සහ ඉදිරි වර්ෂ සඳහා ආකෘති පත්‍ර ක්‍රියාවට නැංවීම |
| ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු<br><br>ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ හිඟ මුදල් ගාස්තු | 2018 වර්ෂය සඳහා ගාස්තු රැස්කිරීමට උපදෙස් ලබාදීම සහ පෙර හිඟ මුදල් රැස් කිරීමට පියවර ගැනීම |
| 2018 වර්ෂය සඳහා අයවැය | අනුමැතිය සඳහා මී ළඟ කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම |
| 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සහ ක්‍රියාකාරි සැලැස්ම | මී ළඟ කොමිෂන් සභා රැස්වීමට ඉදිරිපත් කිරීම |
| 2017 සිට 2020 කාලපරිච්ඡේදය සඳහා ආයතනික සැලැස්ම | සියළුම අනිවාර්ය වාර්තා නියමිත දිනයට පිළියෙල කිරීම |
| 2016/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව 1971 අංක 38 මුදල් පනත යටතේ විගණකාධිපති විසින් නිකුත් කරන ලද 14(2) (C) වර්තාව පිළියෙළ කිරීම | රජයේ විගණකවරුන්ගේ සහාය ලබා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම<br><br>භාණ්ඩ සමීක්ෂණය 2016 පිටපතක් ඉදිරිපත් කිරීම |

# මූල්‍ය ප්‍රකාශනය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

**(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)**

| | සටහන් | 2017.12.31 | 2016.12.31 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 4 | 12,259,643,187 | 12,346,876,758 |
| අස්පෘශ්‍ය වත්කම් | 4.1 | 8,554,187 | 2,392,836 |
| කෙරීගෙන යන වැඩ | 5 | 14,845,511,880 | 11,301,918,644 |
| ආයෝජන | 6 | 6,221,020,046 | 357,097,404 |
| අත්තිකාරම් ගෙවීම් ලියාපදිංචි කිරීම | 7 | 989,769,257 | 1,321,739,434 |
| ජංගම නොවන වත්කම්වල මුළු එකතුව | | **34,324,498,557** | **25,330,025,076** |
| **ජංගම වත්කම්** | | | |
| ලැබිය යුතු ගිණුම් | 8 | 6,339,021,114 | 6,550,438,085 |
| පූර්ව ගෙවීම් සහ අත්තිකාරම් | 9 | 349,715 | 396,715 |
| ණය සහ අනෙකුත් ලැබීම් | 10 | 156,426,841 | 131,931,361 |
| මුදල් සහ සමානුපාත | 11 | 5,624,491,369 | 12,063,193,512 |
| මුළු ජංගම වත්කම් | | **12,120,289,039** | **18,745,959,673** |
| මුළු වත්කම් | | **46,444,787,596** | **44,075,984,749** |
| **සම කොටස් සහ වගකීම්** | | | |
| **සම කොටස්** | | | |
| රජයේ දායක මුදල් | 12 | 526,214,744 | 526,214,744 |
| සමුච්චිත අතිරික්තය | | 16,745,580,058 | 19,477,817,131 |
| නැවත ඇගයූ අතිරික්තය | | 37,380,000 | 37,380,000 |
| සම කොටස්වල මුළු එකතුව | | **17,309,174,802** | **20,041,411,875** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ව්‍යාපෘති ණය - එක්සිම් බැංකුව (නෙළුම් කුලුන) | | 8,949,205,923 | 6,634,801,047 |
| රඳවා ගැනීම් | 13 | 46,152,801 | 879,198,298 |
| පාරිතෝෂික දීමනා | 14 | 6,363,007 | 2,596,474 |
| නාගරික සංවර්ධන අධිකාරිය | | 9,450,000,000 | 9,450,000,000 |
| ජංගම නොවන වගකීම්වල මුළු එකතුව | | **18,451,721,732** | **16,966,595,819** |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

| | සටහන් | 2017.12.31 | 2016.12.31 |
|---|---|---|---|
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු ගිණුම් | 15 | 180,850,917 | 463,347,017 |
| අත්තිකාරම්, තැන්පතු සහ වෙනත් ගෙවීම් | 16 | 8,358,673,863 | 4,034,626,238 |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු | 17 | 2,144,366,283 | 2,570,003,799 |
| **මුළු ජංගම වගකීම්** | | **10,683,891,063** | **7,067,977,054** |
| **මුළු වගකීම්** | | **29,135,612,794** | **24,034,572,873** |
| **මුළු සම කොටස් සහ වගකීම්** | | **46,444,787,596** | **44,075,984,749** |

මෙම ගිණුම්කරන ප්‍රතිපත්ති සහ සටහන් සමස්ථ මූල්‍ය ප්‍රකාශනයේ කොටසකි. කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනය මගින් 2017 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ සිදුකරන ලද කාර්යයන් පිළිබඳව සත්‍ය හා සාධාරණ සමාලෝචනයක් කර ඇති බවත් කාලපරිච්ඡේදය සඳහා අතිරික්ත එතැන් සිට අවසන් වන බවත් සහතික කරමි.

**එම්. කේ. ජයන්ත**
**අධ්‍යක්ෂ - මූල්‍ය**

මෙම මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම කොමිෂන් සභාව සතු වේ. කොමිෂන් සභාව වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදි.

**ඔස්ටින් ප්‍රනාන්දු**
**සභාපති**

**පී. ආර්. එස්. පී. ජයතිලක**
**අධ්‍යක්ෂ ජනරාල්**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

| | සටහන් | 2017.12.31 | 2016.12.31 |
|---|---|---|---|
| **ආදායම** | | | |
| ආදායම | 18 | 54,368,045,117 | 56,023,955,218 |
| **මුළු මෙහෙයුම් ආදායම** | | **54,368,045,117** | **56,023,955,218** |
| අඩුකලා | | | |
| නියාමන වියදම් | 19 | (66,857,614) | (164,191,324) |
| **මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම** | | **54,301,187,503** | **55,859,763,893** |
| **අඩුකලා වෙනත් වියදම්** | | | |
| ආයතන සහ පරිපාලන වියදම් | 20 | 608,717,107 | 548,374,998 |
| මුල්‍ය සහ වෙනත් වියදම් | 21 | 4,174,491 | 3,082,690 |
| බොල්ණයගැතියන් සඳහා වෙන් කිරීම් | | 30,355,765 | (30,742,498) |
| විදේශ ගනුදෙනු මත (ලාභය)/අලාභය | | 81,468,932 | (2,672,418) |
| මුළු වියදම | | **724,716,294** | **518,042,772** |
| **අඛණ්ඩ මෙහෙයුම් තුලින් වර්ෂය සඳහා** ලාභය ආදායම් බදු ගෙවීමට පෙර | | **53,576,471,208** | **55,341,721,121** |
| **අඩුකලා :** | | | |
| ආදායම් බදු | | (536,435,813) | (727,760,032) |
| **අඛණ්ඩ මෙහෙයුම් තුලින් වර්ෂය සඳහා ලාභය ආදායම් බදු ගෙවීමට පසු** | | **53,040,035,396** | **54,613,961,089** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | |
| පාරිතෝෂික වෙන් කිරීම් මත (ලාභය/අලාභය) | | 822,371 | 1,494,318 |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම** | | **822,371** | **1,494,318** |
| **බදු ගෙවීමෙන් පසු වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | **53,040,857,767** | **54,615,455,407** |
| අඩුකලා : ඒකාබද්ධ අරමුදල් දායකත්වය | 22-1 | (40,773,094,840) | (48,816,904,084) |
| **ඒකාබද්ධ අරමුදලට දායක කිරීමෙන් පසුව** වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | | **12,267,762,927** | **5,798,551,322** |
| එකතු කළා | | | |
| ඉදිරියට ගෙනා මුළු විස්තීර්ණ ආදායම | | **19,477,817,131** | **28,679,265,809** |
| අඩුකලා | | | |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 22-2 | (15,000,000,000) | (15,000,000,000) |
| | | **4,477,817,131** | **13,679,265,809** |
| **ඉදිරියට ගෙනා මුළු විස්තීර්ණ ආදායම** | | **16,745,580,058** | **19,477,817,131** |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

| | සටහන් | 2017.12.31 | 2016.12.31 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහ** | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් උත්පාදනය වූ මුදල් | 23 | 55,673,136,915 | 51,574,969,413 |
| බදු ගෙවීම් | | (877,002,035) | (471,306,899) |
| සුපිරි වාසි බදු ගෙවීම් | | 0 | 0 |
| පාරිතෝෂික ගෙවීම් | | (5,433,812) | (1,922,265) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් උත්පාදනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | **54,790,701,067** | **51,101,740,249** |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුලින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහ** | | | |
| දේපල, පිරියත සහ උපකරණ | | (11,225,556) | (40,964,023) |
| අස්පෘශය වත්කම් මිලට ගැනීම | | (9,495,150) | (4,989,606) |
| කෙරීගෙන යන වැඩසටහන් ව්‍යාපෘති | | (3,543,593,237) | (1,691,712,259) |
| ස්ථාවර තැන්පතු ශුද්ධ ආයෝජන සහ ප්‍රතිගැනුම් ගිවිසුම් යටතේ රජයේ සුරකුම්පත් | | (5,863,922.642) | 22,103,455,931 |
| ස්ථාවර තැන්පතු ආයෝජන - පාරිතෝෂික ගෙවීම් | | (2,600,000) | (4,300,000) |
| ස්ථාවර තැන්පතු පොලි ආදායම - පාරිතෝෂික ගෙවීම් | | 5,589,452 | 0 |
| ප්‍රති ගැනුම් ගිවිසුම යටතේ රජයේ සුරැකුම්පත් වලින් පොලී ආදායම | | 2,027,097,093 | 2,101,015,117 |
| දේපල පිරියත සහ උපකරණ අලෙවි කිරීම් | | 0 | 376,850 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල** | | **(7,398,150,041)** | **22,462,882,010** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහ** | | | |
| අත්තිකාරම් ගෙවීම ලියාපදිංචි කිරීම | | 931,970,176.73 | 117,935,562 |
| කොටස් වෙළඳපල ගනුදෙනු වලින් පොලී ආදායම | | 209,981,046 | 166,266,227 |
| ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ | | (55,773,094,840) | (63,816,904,084) |
| ව්‍යාපෘති ණය එක්සිම් බැංකුව (නෙළුම් කුළුණ) | | 2,314,404,876 | ( 1,039,552,799) |
| රඳවා ගැනීම් | | (833,045,497) | 72,379,369 |
| නාගරික සංවර්ධන අධිකාරිය | | 0 | 0 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල්** | | **(53,749,784,237)** | **(62,420,770,127)** |
| **මුදල් හා මුදල් සමානුපාතවල ශුද්ධ (අඩුවීම/වැඩිවීම)** | | **(6,357,233,211)** | **11,143,852,133** |
| ***මුදල් හා මුදල් සමානුපාතවල වෙනස්වීම*** | | | |
| 2017 ජනවාරි 01 දිනට | | 12,063,193,512 | 916,668,961 |
| (අඩුවීම/වැඩිවීම) | | (6,357,233,211) | 11,143,852,133 |
| මුදල් හා මුදල් සමානුපාතවල විනිමය අනුපාතය (අලාභය/ලාභය) | | (81,468,932) | 2,672,418 |
| **2017 දෙසැම්බර් 31 දිනට** | | **5,624,491,369** | **12,063,193,512** |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂා සදහා  සමානුපාතවල වෙනස්කම් ප්‍රකාශනය
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

| | **රාජ්‍යදායකවීම්** | **ප්‍රතිදාන අතිරික්ත** | **සමුච්චිත අතිරික්ත** | **මුළු සමානුපාත** |
|---|---|---|---|---|
| 2016 ජනවාරි 01 දිනයට ශේෂය | 526,214,744 | 37,380,000 | 28,679,265,809 | 29,242,860,553 |
| අඩුකලා ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම් | 0 | 0 | (15,000,000,000) | (15,000,000,000) |
| | 526,214,744 | 37,380,000 | 13,679,265,809 | 14,242,860,553 |
| 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තිර්ණ ආදායම | 0 | 0 | 5,798,551,322 | 5,798,551,322 |
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | 526,214,744 | 37,380,000 | 19,477,817,132 | 20,041,411,875 |
| 2017 ජනවාරි 01 දිනට ශේෂය | 526,214,744 | 37,380,000 | 19,477,817,131 | 20,041,411,876 |
| අඩුකලා ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම් | - | - | (15,000,000,000) | (15,000,000,000) |
| | 526,214,744 | 37,380,000 | 4,477,817,132 | 5,041,411,876 |
| 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | 0 | 0 | 12,267,762,927 | 12,267,762,927 |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | 526,214,744 | 37,380,000 | 16,745,580,059 | 17,309,174,803 |

**<u>ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව</u>**
**<u>මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2017.12.31</u>**
**(මෙම සටහන්වල සියළුම වටිනාකම් වෙනත් ආකාරයකින් සඳහන් නොවන්නේනම් මිස ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ).**

**1.** **පොදු තොරතුරු**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව විදුලි සංදේශ ක්ෂේත්‍රය නියාමනය කිරීම සඳහා ස්ථාපනය කරන ලද ස්වාධීන ආයතනයකි.

කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්යාලය අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 පිහිටා තිබේ.
**පනතේ සඳහන් පරිදි කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් පහත සඳහන් වේ.**
කොමිෂන් සභාව විසින් පනත යටතේ තමා සතු බලතල ජාතික යහපත ප්‍රවර්ධනය කිරීම සඳහා තමා වඩාත්ම යෝග්‍ය යයි තමා සලකන ආකාරයට සහ විශේෂයෙන්,

**(අ)** ශ්‍රී ලංකාවේ ජාතික හා අන්තර්ජාතික විදුලි සංදේශ සේවාවක් සැපයීම සඳහා සියලුම සාධාරණ ඉල්ලීම් ඉටු කළ හැකි වන පරිදි විශ්වාසය තැබිය හැකි සහ කාර්යක්ෂම සේවාවක්, (එවැනි සේවාවක් සැපයීම ප්‍රායෝගික නොවන අවස්ථාවල හැර) හදිසි සේවා, පොදු දුරකථන කුටි සේවා, නාමාවලි තොරතුරු සේවා, සමුද්‍රීය සේවා, ග්‍රාමීය සේවා සහ වෙනත් ප්‍රදේශවල ජාතික යහපත පිණිස අවශ්‍ය යයි සළකනු ලබන සේවා ඇතුළුව, සපයනු ලබන බවට වගබලා ගැනීම.

**(ආ)** **(අ)** ඡේදයේ ව්‍යාප්තියට හානියක් නොමැතිව, සෑම ක්‍රියාකරුවකුගේම බලපත්‍රයේ සඳහන් කර ඇති සේවාවන් සපයනු ලැබීම නිසැක කිරීම සඳහා, එකී සෑම ක්‍රියාකරුවෙකුටම අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය සහ කළමනාකරණ සම්පත් ඇති බවට සහ ඔහු විසින් ඒවා යොදා ගනු ලබන බවට වග බලා ගැනීම.

**(ඇ)** අය කරනු ලබන ගාස්තු සහ සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සහ විදුලි සංදේශ උපකරණ වල තත්වය හා විවිධත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ, ගැනුම්කරුවන්ගේ සහ වෙනත් පාවිච්චි කරන්නන්ගේ සම්බන්ධතාවයන් හා පොදුවේ මහජන යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

**(ඈ)** විදුලි සංදේශ සේවා හා සම්බන්ධ වාණිජ කටයුතු වල නිරත තැනැත්තන් අතර ඵලදායී තරඟකාරිත්වයක් පවත්වා ගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම සහ ඒ තැනැත්තන්ගේ කාර්යක්ෂමතාවය සහ පිරිමැසුම්දායක බව ප්‍රවර්ධනය කිරීම.

**(ඉ)** අභ්‍යන්තර සහ ජාත්‍යන්තර විදුලි සංදේශ පහසුකම් පිළිබඳ සීඝ්‍ර සහ අඛණ්ඩ සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.

**(ඊ)** අත්‍යාවශ්‍ය ප්‍රමාදයන් හෝ බාධාවන් හෝ අවහිරවලින් තොර විශ්වාසදායක සහ කාර්යක්ෂම සේවාවක් සැපයීම තම වගකීම් ඉටු කිරිමට ක්‍රියාකරුවන්ට හැකිකම ඇති බවට නිසැක කිරීම.

**(උ)** විදුලි සංදේශ සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර ගැන නව තාක්ෂණික ක්‍රම පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ඒ නව තාක්ෂණික ක්‍රම වැඩිදියුණු කිරීම සහ ඒ ක්‍රම භාවිතා කිරීම.

**(ඌ)** ශ්‍රී ලංකාවෙන් පිටත සිය ව්‍යාපාරික ස්ථාන ඇති, විදුලි සංදේශ සේවා බහුල වශයෙන් පාවිච්චි කරන්නන් ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාරික ස්ථාන පිහිටු වීම පිණිස දිරිගැන්වීම; සහ

**(එ)** ජාත්‍යන්තර සංක්‍රාන්ති සේවා සඳහා ශ්‍රී ලංකාව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම.

## 2. පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සිය මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ("SLFRS") සහ 1995 අංක 19 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනතේ නියමයන් අනුකූලව පිළියෙල කර ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ("SLFRS") පිළිබඳ නව කාණ්ඩයක් නිකුත් කර ඇති අතර 2012 ජනවාරි 01 දින හෝ එදිනට පසුව ආරම්භ වන වර්ෂය සඳහා ව්‍යවසායකයන් විසින් මෙම ප්‍රමිති ඵලදායි ලෙස අදාල කර ගැනීම අවශ්‍ය වේ.

## 3. විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගන්නා ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ.

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් සඳහන් නොවන්නේනම් මිස ඉදිරිපත් කළ වර්ෂය සඳහා නිත්‍ය වශයෙන් අදාල වී ඇත.

### 3.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (''SLFRS") අනුකූලව පිළියෙල කර ඇති මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ පිළියෙල කර ඇත. මෙම ගිණුම්වලට බලපාන උද්ධමනකාරී සාධකයන් සඳහා ගැලපීම් කර නැත.

#### 3.1.1 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍රයේ දිනට පසුව සිදු වූ සියලු ප්‍රමාණාත්මක සිද්ධීන් සැලකිල්ලට ගන්නා ලද අතර අවශ්‍ය අවස්ථාවල ගිණුම් සඳහා සුදුසු ගැලපීම් සිදු කර ඇත.

#### 3.1.2 විදේශ විනිමය පරිවර්තනය කිරීම

ගණුදෙනු සිදුවූ අවස්ථාවේ පැවති විදේශ විනිමය අනුපාතය සියළු විදේශ මුදලින් වූ ගණුදෙනු සඳහා යොදාගෙන ඇත. ශේෂ පත්‍ර දිනට පවතින විනිමය අනුපාතිකය අනුව විදේශ මුදලින් ඇති වත්කම් සහ වගකීම් පරිවර්තනය කරයි. ප්‍රතිඵල ලෙස ඇතිවන ලාභය හෝ අලාභය ආදායම් වියදම් ගිණුමේ දක්වා ඇත.

### 3.2 වත්කම් සහ වත්කම් තක්සේරු කිරීමේ පදනම.

#### 3.2.1 දේපළ, පිරියත සහ උපකරණ

**(අ) පිරිවැය**

සියළුම දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය පිරිවැය හෝ හානිකරන අලාභය මත සටහන් කරනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ පිරිවැය එහි ගැනුම් මිල සහ පරිහරණය කිරීමට අපේක්ෂිත වත්කම්වල සේවා තත්ත්වය මත ඍජු ආරෝපිත පිරිවැයෙන් සමන්විත වේ.

කොමිෂන් සභාවේ අයිතම ආශ්‍රිතව අනාගත ආර්ථිකමය ප්‍රතිලාභ රැගෙන ඒම හෝ ප්‍රවාහය කිරීම පිණිස ස්ථාවර ආකාරයෙන් වත්කම් අත්පත් කර ගැනීම, ව්‍යාප්ත කිරීම සහ වැඩි දියුණු කිරීමේ අරමුණින් සිදුකරන පසුව එන කාලපරිච්ඡේදය සඳහා පිරිවැය ප්‍රාග්ධන වියදම් වශයෙන් සලකනු ලැබේ. ආදේශන කොටස්වල ප්‍රකාශ කරන වටිනාකම් හඳුනාගනු නොලැබේ. අනෙකුත් සියළුම අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු කිරීම් ඒවා සිදු කරන මූල්‍ය වර්ෂය තුළ පරිපූර්ණ වියදම් වලින් අය කරනු ලැබේ.

**(ආ) ක්ෂය වීම්**

ඉඩම් ක්ෂය කිරීමට නොහැකිය. සෙසු වත්කම් ක්ෂයකිරීමේදී ලාභය හෝ අලාභය දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල එක් එක් කොටස්වල ඵලදායී ජීවිත කාලය පුරා ක්ෂය කිරීමේ සරල රේඛීය ක්‍රමය මත හඳුනාගනු ලැබේ. අත්පත් කර ගන්නා වර්ෂයේදී ක්ෂය කිරීම වත්කම පරිහරණයට ගන්නා ලද මාසයේ සිට සමානුපාතික පදනම මත ගණනය කරනු ලබන අතර අදාල වත්කම ඉවත් කරන මාසයේදී ක්ෂය කිරීම සිදු නොකරයි.

**(ඇ) ක්ෂය වීම් (ඉතිරි........)**

**දේපළ ,පිරියත සහ උපකරණවල ඇස්තමේන්තු කළ ඵලදායී ජීවිත කාලය**

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 20වැඩි |
| විදුලි සංදේශ කුළුණ | වසර 10වැඩි |
| ලී බඩු සහ සවි කිරීම් | වසර 10වැඩි |
| කාර්යාල උපකරණ | වසර 10වැඩි |
| පරිගණක | වසර 04වැඩි |
| වායුසමීකරණ යන්ත්‍ර | වසර 10වැඩි |
| මෝටර් රථ | වසර 08වැඩි |
| විදුලි උත්පාදන යන්ත්‍ර | වසර 10වැඩි |
| විදුලි සෝපාන යන්ත්‍ර | වසර 10වැඩි |
| කාර්යාල උපකරණ | වසර 10වැඩි |
| කාර්යාල ලී බඩු | වසර 10වැඩි |
| කාර්මික උපකරණ | වසර 10වැඩි |
| වෙබ් සර්වර් | වසර 04වැඩි |
| කාය වර්ධන උපකරණ | වසර 04වැඩි |
| මාධ්‍ය ඒකකයේ උපකරණ | වසර 04වැඩි |

**(ඇ) අස්පෘශ්‍ය වත්කම්**

ලබා ගන්නා ලද පරිගණක මෘදුකාංග බලපත්‍ර අදාල මෘදුකාංගය අත්පත්කර ගැනීම සහ භාවියතයට ගැනීම සඳහා දරන පිරිවැය පදනම් කරගෙන ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ.

**(ඇ.) කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ**

කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවල පිරිවැය සඳහන් වේ. මෙය ප්‍රාග්ධනය අපේක්ෂාවෙන් ගොඩනැගිලි ඉදිකිරීම සහ පද්ධති සංවර්ධනයෙහිලා සෘජුවම වැය කරන ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

**(ඉ) ශේෂපත්‍රයෙහි වත්කම් හෝ වගකීම් ඉවත් කිරීම**

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක ප්‍රකාශ කරන වටිනාකම එහි පරිහරණය මත තවදුරටත් හඳුනාගනු නොලැබේ. දේපල, පිරියත සහ උපකරණවල ප්‍රකාශ කරන වටිනාකම සමඟ පරිහරණය කිරීමේ ලාභ ප්‍රයෝජන සැසඳීමෙන් දේපල, පිරියත සහ පාඩුව තීරණය වන අතර ''වෙනත් ආදායම්'' ලාභය හෝ පාඩුව තුලින් ශුද්ධ ලාභය හඳුනා ගනු ලැබේ.

### 3.2.1. ආයෝජන

අයෝජනවල ප්‍රතිගැනුම් ගිවිසුම යටතේ මාස තුනකට නොඅඩු කාලයක් තුළ සිදු කරන ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් සහ කොටස් වෙළඳපල ආයෝජන ඇතුළත් වේ. වර්ෂය අවසානය දක්වා මෙම ආයෝජන පිරිවැය ධන උපචිත පොළිය මත සඳහන් වේ.

### 3.2.2.ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් එක්රැස් කර ගත නොහැකි සියළුම වටිනාකම් සඳහා වන සියළුම දීමනා සහ මුල් බිල්පත් වටිනාකම් මත හඳුනාගනී. සම්පූර්ණ වටිනාකම රැස්කිරීම තවදුරටත් අපේක්ෂා කල නොහැකි විට අඩමාන ලැබීම් පිළිබඳ ඇස්තමේන්තු පිළියෙල කරණු ලැබේ.

### 3.2.3. මුදල් සහ මුදල් සමානුපාත

මුදල් සහ මුදල් සමානුපාත අතැති මුදල් සහ බැංකු තැන්පතු වලින් සමන්විත වේ.

### 3.3.වගකීම් සහ වෙන් කිරීම්

ශේෂපත්‍ර දිනට පවතින සියලුම ප්‍රමාණාත්මක වගකීම් මූල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් කර ඇති අතර ශේෂපත්‍ර දිනට පවතින නමුත් වටිනාකම නිවැරදිවම අගය කළ නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් වෙන් කිරීමක් සිදු කොට ඇත.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් දින සිට වසරක් ඇතුලත ඉල්ලුම මත ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් වශයෙන් සැලකේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දින සිට වසරකට පසු ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල ජංගම නොවන වගකීම් වශයෙන් සැලකේ.

3.3.1 **ප්‍රාග්ධන බැඳියාවන් සහ අසම්භාව්‍ය බැරකම්**

ශේෂපත්‍ර දිනට ඇති ප්‍රාග්ධන වියදම් බැඳියාවන් සහ අසම්භාව්‍ය බැරකම් ගිණුම් සඳහා සටහන් ලෙස හෙළිදරව් කර ඇත.

### 3.3.2.කාර්ය මණ්ඩල ප්‍රතිලාභ

**(අ) විශ්‍රාම ගැනීමේ පාරිතෝෂික වෙන් කිරීම**

**වර්ෂය තුල විශ්‍රාම ගැනීමේ පාරිතෝෂික වෙන් කිරීම පහත දැක්වේ**

| | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|
| මූල්‍ය වර්ෂය ආරම්භයේදී | 43,596,474 | 40,942,627 |
| ජංගම සේවා පිරිවැය | 3,115,425 | 3,260,668 |
| පොලී පිරිවැය | 3,917,840 | 2,809,761 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ලාභ සහ අලාභ ගාස්තු | 7,033,265 | 6,070,429 |
| තත්‍ය අලාභ/ලාභ | (822,371) | (1,494,318) |
| ගෙවන ලද ප්‍රතිලාභ | 5,433,812 | 1,922,265 |
| මූල්‍ය වර්ෂය අවසානයේදී | 44,373,555 | 43,596,474 |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම යටතේ අවශ්‍ය කරන පරිදි සියළුම සුදුසු සේවකයන් සඳහා වන ප්‍රතිලාභ සැලසුම් පිළිගෙන ඇත. ප්‍රතිලාභ සැලසුම්වල අරමුදල් නොමැත.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මගින් සේවකයෙකු විශ්‍රාම ගැනීම මත ලබාගන්නා ප්‍රතිලාභවල වටිනාකම විස්තර කෙරේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිළිබඳ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල හඳුනාගත් වගකීම් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති - LKAS 19 : සේවක ප්‍රතිලාභවල නියම කර ඇති පරිදි පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් කොමිෂන් සභාව විසින් වාර්ෂිකව ගණනය කරනු ලැබේ.

පසුගිය වර්ෂයේ අධි හෝ ඌන වෙන් කිරීම් නිසා සිදුවන වෙනස්කම් මගින් පැන නගින ලාභය හෝ අලාභය එය සිදුවන කාලපරිච්ඡේදයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා අය කිරීම හෝ බැර කිරීම කරනු ලැබේ. විස්තීර්ණ ආදායම් ප්‍රකාශනවල වර්ෂය සඳහා පාරිතෝෂික අය කිරීම ක්ෂණිකව හඳුනාගනු ලැබේ. කොමිෂන් සභාව විසින් පාරිතෝෂික බැඳීම් සඳහා සමාන වටිනාකම ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරනු ලැබේ.

පහත සඳහන් ප්‍රධාන තථ්‍ය උපකල්පනයන් සැලකිල්ලට ගෙන කොමිෂන් සභාව විසින් පාරිතෝෂික වෙන් කිරීම සිදු කරනු ලැබේ.

| | |
|---|---|
| වට්ටම් අනුපාතිකය | - වාර්ෂිකව සියයට 9 |
| වැටුප් වර්ධක අනුපාතය | - සියයට 1 සිට සියයට 6.7 දක්වා |
| විශ්‍රාම ගැනීමේ වයස | - අවුරුදු 60 |

**(ආ) නිශ්චිත සහභාගී සැලසුම්**

නිශ්චිත සහභාගී සැලසුමක් සඳහා සහභාගිත්වය පිළිබඳ බැඳීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සිදු කරන ලද වියදමක් වශයෙන් හඳුනාගනු ලැබේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF) සඳහා පිළිවෙලින් සියයට 15 සහ සියයට 3 ට නොඅඩු දළ පාරිශ්‍රමික ප්‍රමාණයකින් දායක වේ.

**(ඇ) සේවක අර්ථසාධක අරමුදල**

කොමිෂන් සභාවේ සියළුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් වන අතර මේ සඳහා සිය මූලික වැටුපෙන් සියයට 10ක් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව එම සේවකයාගේ මූලික වැටුපෙන් සියයට 15 දායකත්වය දරයි.

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල**

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා කොමිෂන් සභාව එක් එක් සේවකයන්ගේ මූලික වැටුපෙන් සියයට 3 ක ප්‍රමාණයක් දායක වේ.

3.4 **ආදායම හඳුනා ගැනීම**

3.4.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 අනුව උපචිත පදනම මත මූලික වශයෙන් ආදායම හඳුනාගෙන ඇත.

#### 3.4.1.1 ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් වලට නව බලපත්‍ර නිකුත් කිරීමේදී හෝ අළුත් කිරීමේදී ක්‍රියාකරුවන්ගේ බලපත්‍ර ගාස්තු මුදල් පදනම මත හඳුනාගනු ලැබේ.

#### 3.4.1.2 වෙළඳ බලපත්‍ර ගාස්තු/රැහැන් රහිත දුරකථන බෙදාහරින්නන්ගේ ගාස්තු/කෙටි සංකේත අංක ගාස්තු/බලපත්‍ර සැකසුම් ගාස්තු

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව කිසියම් තැනැත්තෙකුට බලපත්‍ර නිකුත් කිරීමේදී වෙළෙඳ බලපත්‍ර ගාස්තු මුදල් පදනම මත හඳුනාගනු ලැබේ.

**3.4.1.3** සෙස් ගාස්තු උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. සිටි කේබල් ලින්ක්ස් (පෞද්ගලික) සමාගම සහ ලංකා බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (පෞද්ගලික) සමාගම සෙස් ගෙවා නොමැති අතර ගෙවීම පැහැර හරින සෙස් ගාස්තු අයකර ගැනීමට ක්‍රියාවලියක් ආරම්භ කර ඇත.

### 3.4.2 විදුලි සංදේශ බදු

2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත යටතේ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වලින් ලැබෙන විදුලි සංදේශ බදු ආදායමක් වශයෙන් හඳුනාගෙන ඇති අතර පසුව රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර ඇත.

### 3.4.3 විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව

2004 අංක 11 දරන මුදල් පනතේ 111 කොටස යටතේ බාහිර ප්‍රවේශ ක්‍රියාකරුවන්ගෙන් ලැබෙන විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායමක් වශයෙන් හඳුනා ගන්නා ලදී. පසුව මෙම ආදායමෙන් සියයට 50 ප්‍රතිශතයක් රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලදී.

### 3.4.4 ජාත්‍යන්තර පිටතට යැවෙන ඇමතුම් බදු

2004 අංක 11 දරන මුදල් පනතේ 111 කොටස සහ 2011 දෙසැම්බර් 29 වන දිනැති අංක 1738/15 අතිවිශේෂ ගැසට් නිවේදනයේ ප්‍රසිද්ධ කර ඇති රීති යටතේ බාහිර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වලින් ලැබෙන ජාත්‍යන්තර පිටතට යැවෙන ඇමතුම් බදු ආදායමක් වශයෙන් හඳුනාගෙන ඇති අතර දෙවනුව රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලදී.

### 3.4.5 පොළී ආදායම

පොළී ආදායම ප්‍රතිගැනුම් ගිවිසුම යටතේ කෙටි කාලීන ස්ථාවර තැන්පතු සහ කෙටි කාලීන රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන ලද අරමුදල් මත පොළී ආදායමෙන් සහ කොටස් වෙළඳපල ආයෝජනවලින් සමන්විත වේ. පොළී ආදායම කල්පිරෙන දිනය මත වන උපචිත ලාභය හෝ අලාභය වශයෙන් හඳුනා ගනී.

### 3.4.6 ආදායම් බදු

කොමිෂන් සභාව එහි ප්‍රධාන ආදායම් ප්‍රභවය මත ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබේ. ආදායම් බදු ගාස්තුව පොළී ආදායමේදී පමණක් හඳුනාගනු ලැබේ.

**ආදායම් බදු වර්ගීකරණය**

| වර්ෂය | වටිනාකම(රු.) |
|---|---|
| 2015 | 21.982,852 |
| 2016 | 635,777,180 |
| 2017 | 629,146,183 |
| **එකතුව** | 1,286,906,215 |

### 3.4.7 ආර්ථික සේවා ගාස්තුව (ESC)

ආර්ථික සේවා ගාස්තුව විශේෂ අනුපාතිකයන් අනුව වගකිවයුතු පිරිවැටුම මත ගෙවිය යුතුවේ. 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ නියමයන් සහ දෙවනුව එහි සිදු කරන ලද සංශෝධනයන් ප්‍රකාරව ආර්ථික සේවා ගාස්තුව ආදායම් බදු වගකීම් වලින් අඩු කරනු ලැබේ. පනතේ අදාල විධිවිධාන ප්‍රකාරව සියළු හිමිකම් නොලබන ලද ගෙවීම් ඉදිරියට ගෙන යා හැකි අතර ගෙවිය යුතු ආදායම් බදු හිලව් කරණු ලැබේ.

## 3.5 වියදම

වියදම ආදායමේ විශේෂ අයිතමවල ඉපැයීම් සහ දරණ පිරිවැය අතර සෘජු සම්බන්ධතාවය පදනම් කරගෙන විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. කොමිෂන් සභාවේ කටයුතු පවත්වාගෙන යාම සහ කාර්යක්ෂම ආකාරයෙන් ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමෙහිලා සිදු කරන සියළුම වියදම් වර්ෂය සඳහා අතිරික්ත ආදායමෙන් අයකරගනු ලැබේ.

## 3.6 ව්‍යාපෘති

### 3.6.1.කොළඹ නෙළුම් කුළුණ

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව) විසින් 2010 ඔක්තෝම්බර් 27 සහ 2011 දෙසැම්බර් 14 දිනැති පිළිවෙලින් යොමු අංක 10/2473/401/301 සහ 11/2262/501/026 දරන අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව "කොළඹ නෙළුම් කුළුණ" නමින් මීටර් 350 ක් උසැති බහු කාර්යය රූපවාහිනී සහ විදුලි සංදේශ කුළුණ ඉදි කිරීම ආරම්භ කර ඇත. එමෙන්ම අමාත්‍ය මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතියේ ඉදි කිරීමට කටයුතු China National Electronics Importers & Exports Corporation (CEIEC) හා Aeraspace Long March International Trade Co. Ltd. (ALIT) සමාගම්වලට ප්‍රදානය කරන ලදී.

එසේම කොළඹ නෙළුම් කුළුණ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් පසු 2 වන අදියර වශයෙන් සුවිශාල විනෝදාස්වාදය සපයන උද්‍යානයක් ඉදිකිරීමට සැලසුම් කර ආරම්භ කිරීමට නියමිතය.

මෙම ඉදිකිරීමේ පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 104.3 වශයෙන් ඇස්තමේන්තු කර ඇති අතර, ඉන් 85% ක් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ඇපකරුවකු වශයෙන් අත්සන් තබන ලද, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සහ EXIM බැංකුව විසින් අත්සන් කරන ලද අංක BLA-201207 දරන ගැනුම්කරුවන්ගේ ණය ගිවිසුම යටතේ - Export-Import Bank of China (EXIM) බැංකුව විසින් වසර 14 ක ණය ක්‍රමය මත මුදල් සපයන ලදි.

ඇමරිකානු ඩොලර් මිලියන 15.645 ක් වන සියයට 15ක් වූ ව්‍යාපෘති පිරිවැය ශේෂය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දරනු ඇත.

වැඩබිමේ ද්‍රව්‍ය ඇතුලත්ව සිදු කරන ලද සමස්ථ කාර්ය අන්තර්ගතව ව්‍යාපෘතියේ නිම කරන ලද සියයට 77 ක් වන අතර ඇමරිකන් ඩොලර් මිලියන 77.499 ක් වැය වී ඇත. 2017.12.31 දින වන විට පවත්නා රඳවා ගැනීම් සහ අත්තිකාරම් පියවා ගැනීම් පිළිවෙලින් ඇමරිකන් ඩොලර් මිලියන 5.215 ක් සහ ඇමරිකන් ඩොලර් මිලියන 8.861 ක් වූහ. ව්‍යාපෘති උපදේශක ඒකකයේ (PCU) අනුමැතිය සහ නිර්දේශය මෙන්ම අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද සාක්ච්ඡා සම්පුති කමිටුවේ (CANC) අවධාරණය කිරීම මත කොන්ත්‍රාත්තුව කොන්දේසි ප්‍රකාරව මුදාහරින ලද රඳවා ගැනීම් සහ HSBC මගින් අවලංගු කළ නොහැකි පරිදි ඉල්ලුම් බැංකු ඇපකරය ඉදිරිපත් කිරීම සිදු කර ඇත.

කොළඹ නෙළුම් කුළුණ ව්‍යාපෘතිය ඉදිකිරීම පිණිස ලබා ගන්නා ලද එක්සිම් බැංකු ණය මුදල සියයට සියයක වෙන්කළ ණය මුදලක් වන බැවින් , ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 23 ප්‍රකාරව ව්‍යාපෘතිය අවසන් වන විට මුළු ණය මුදල් පිරිවැය සහ අදාල වියදම් සම්පූර්ණයෙන්ම ප්‍රාග්ධනීකරණය කෙරෙනු ඇත.

### 3.6.2 ඉඩම - නෙළුම් කුළුණ

2011 දෙසැම්බර් 22 දිනැති යොමු අංක 11/2262/501/026TBR දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අක්කර 7 රූඩ් 2 පර්චස් 8.41 (හෙක්ටයාර 3.0564) ප්‍රමාණයකින් සමන්විතව “කොළඹ නෙළුම් කුළුණ” ඉදිවන නෙළුම් කුළුණ භූමිය නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත පොළී රහිතව පවරා දෙනු ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) හා නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් අත්සන් කළ අවබෝධතා ගිවිසුම අනුව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රුපියල් මිලියන 1500 මූලික ගෙවීමක් සහ පැවරීමේ ගිවිසුම අත්සන් කළ දින සිට වසර 34ක් ඇතුලත රුපියල් මිලියන 300 ක් ගෙවීමට එකඟ විය.

ඉඩම භාර දුන් දින සිට අදාල බලධරයා වෙත උපයෝගී බිල්පත් සහ තක්සේරු අනුපාත ගෙවීමට යටත්ව, 2012 ජූලි 18 දිනැති, නාගරික සංවර්ධන අධිකාරියේ ලිපිය මගින් හිස් භෞතික අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට භාර දෙන ලදි. අදාල බලධාරීන් විසින් නියමිත පටිපාටිවලට යටත්ව හිමිකම් අයිතිය පැවරීමේ ක්‍රියාවලිය සිදු කරනු ලබයි. මෙය අවසන් කිරීමට නියමිත දිනය 2015 මැයි 15 දින වූ අතර ව්‍යාපෘතියේ ඉන්ජිනේරු (මොරටුව විශ්ව විද්‍යාලය) ව්‍යාපෘති උපදේශක ඒකකයේ නිර්දේශය මත එම කාලය 2017 ඔක්තෝම්බර් 31 දක්වා දීර්ඝ කරන ලදි.

### 3.6.3 තොරතුරු තාක්ෂණ උද්‍යානය, හම්බන්තොට, සූරියවැව

2012.06.14 දිනැති අංක 12/0836/501/019 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සලකා බලා අමාත්‍ය මණ්ඩලය විසින් 2012 ජූලි 04 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළැඹි තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථාන ව්‍යාපෘතිය ( හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතිය) ස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර ) ව්‍යාපෘති ඉන්ජිනේරු වශයෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRDC) පත් කරන ලදී,

අනුමත ටෙන්ඩර් පටිපාටිය මත, ඉදිකිරීමේ පිරිවැය රුපියල් 2,493, 870,318 සහිතව සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම වෙත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී.

සැලසුම් කර ඇති පරිදි, 2015 ජූනි වන විට ගොඩනැගිල්ලේ තෙවන මහල දක්වා සැලකිය යුතු පමණකින් ගොඩනැගිලි ව්‍යුහය සම්පූර්ණ කරන ලදී. නමුත් මෙම ප්‍රදේශයේ වෙනත් සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කළ ආකාරයට ආරම්භවී නැති බව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ආයෝජන මණ්ඩලය හා ජනාධිපති ලේකම් කාර්යාලය නිරීක්ෂණය කර ඇති අතර මෙම ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ ඉන්ජිනේරු උපදේශක වශයෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRDC) ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ කටයුතු වල නිරත වන අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම අතර එළැඹුණු කොන්ත්‍රාත්තුව 2016 අගෝස්තු 10 දින අවසන් විය. එබැවින් ව්‍යාපෘති ඉන්ජිනේරු වන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නිර්දේශය ප්‍රකාරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම සමග වූ කොන්ත්‍රාත්තුව අවසන් කිරීම හැර වෙනත් විකල්පයක් නොතිබිණි. මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද මුළු පිරිවැය රුපියල් මිලියන 715 ක් (ආපසු අය කර ගැනීමට ඇති රුපියල් මිලියන 157 අත්තිකාරම් මුදල ඇතුලත්ව) වන අතර සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම නැමැති කොන්ත්‍රාත්කරු, කොන්ත්‍රාත්තුව අවසන් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තීරණයට එරෙහිව ආරාවුල් බේරුම්කාර මණ්ඩලය වෙත යොමු කර ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, රාජ්‍ය හා පෞද්ගලික හවුල් පදනම මත මෙම ව්‍යාපෘතිය දියුණු කරමින් ඉදිරියට පවත්වාගෙන යාමේ හැකියාව මේ වන විට සලකා බලමින් පවතී.

වැඩබිමේ ද්‍රව්‍ය ඇතුලත්ව සිදු කරන ලද සමස්ථ කාර්ය අන්තර්ගතව ව්‍යාපෘතියේ නිම කරන ලද ව්‍යාපෘතිය සියයට 33 ක් වන අතර රුපියල් මිලියන 423.9 ක් වැය වී ඇත. 2017.12.31 දින වන විට පවත්නා රඳවා ගැනීම් සහ අත්තිකාරම් පියවා ගැනීම් පිළිවෙලින් රුපියල් මිලියන 46 සහ රුපියල් මිලියන 157 ක් විය. සුරිය වැව ඉඩමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය කළ යුතු අතර ඉඩමේ වටිනාකම රජයේ තක්සේරුකරු මගින් ත්ක්සේරු කළ යුතුය.

## 3.7 අවිනිශ්චිත වියදම්

(අ) <u>දිසා අධිකරණ නඩු අංකය 6188/2010</u>

Gewaan Engineering සමාගමේ හිමිකරු වන ගාමිණී රාජපක්ෂ මහතා, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වගඋත්තරකරුවකු කරමින්, අංක 6188/2010 දරන නඩුව දිසා අධිකරණයේ ගොනු කර ඇත.

2007 ජූලි 19 දින පැමිණිලිකරු හා වගඋත්තරකරු අතර එළැඹි ගිවිසුම උල්ලංඝනය කිරීම මත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ඒ සඳහා වූ හානිය අයකර ගැනීම පිණිස පැමිණිලිකරු මෙම නඩුව ගොනු කර ඇති අතර අපේක්ෂිත සහන යටතේ පැමිණිලිකරු හානිය වෙනුවෙන් අපේක්ෂිත මුදල රු. මිලියන 1.5 කි.

(ආ) **<u>මහාධිකරණය සිවිල් නඩු අංක 137/2011</u>**

නිත්‍යානුකූල මැදිහත්වීම ඇතිව නඩු තීන්දුවේ දිනය දක්වා රුපියල් බිලියන 47 ,345,112,000 සම්පූර්ණ මුදල පියවන තෙක් නඩු තීන්දුවේ මුදල රැස්කර ගැනීමේ නඩු තීන්දුව/නියෝගය සඳහා සීමාසහිත ELECTROTEKS සමාගම විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට එරෙහිව අංක HC (Civil) 137/11 දරන නඩුව පවරා ඇත.

සංඛ්‍යාත බලපත්‍ර ගාස්තුව රු. 172, 500,000 සහ රු. 2,300,000 නොපියවීම මත වගඋත්තරකරු විසින් ප්‍රතිස්ථාපනය කිරීමේ ගාස්තුවක් අයකර ඇත.

(ඇ) **<u>තොරතුරු තාක්ෂණ උද්‍යානය - හම්බන්තොට</u>**

ආරවුල් බේරුම්කාර මණ්ඩලය විසින් 2017 නොවැම්බර් 20 වන දින මෙම තීරණය ලබාදී ඇත. ඒ අනුව හිමිකරු රු. 189,931,875 මුදලක් ගෙවිය යුතු බවට ආරවුල් බේරුම්කාර මණ්ඩලය විසින් තීරණය කරන ලදි. ශ්‍රී ලංකා විදුලු සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ආරවුල් බේරුම්කාර මණ්ඩලයේ තීරණය ප්‍රතික්ෂේප කරන ලද අතර එය වැඩිදුරටත් බේරුම්කරණය සඳහා යොමුකර ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ගිණුම් සටහන් - 2017.12.31
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

4. දේපල, පිරියත සහ උපකරණ

| | 2017.01.01 දිනට ශේෂය | 2017වර්ෂය සඳහා | | 2017.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | එකතු කිරීම් | ඉවත් කිරීම් මාරු කිරීම් | |
| ඉඩම් | 148,863,771 | 0 | 0 | 148,863,771 |
| බද්දට ගත් ඉඩම් | 345,502 | 0 | 0 | 345,502 |
| ගොඩනැගිලි | 150,381,065 | 0 | 0 | 150,381,065 |
| කොකාවිල් කුළුණ | 314,933,479 | 0 | 0 | 314,933,479 |
| වවුනියා කුළුණ | 29,900,741 | 0 | 0 | 29,900,741 |
| වාහන | 168,717,224 | 0 | 0 | 168,717,224 |
| වායුසමීකරණ | 15,104,152 | 0 | 0 | 15,104,152 |
| විදුලි සෝපාන | 4,683,848 | 0 | 0 | 4,683,848 |
| විදුලි උත්පාදක යන්ත්‍ර | 2,665,428 | 0 | 0 | 2,665,428 |
| පරිඝණක | 91,874,487 | 6,598,900 | 0 | 98,473,387 |
| වෙබ් සර්වර් | 2,213,661 | 0 | 0 | 2,213,661 |
| වෙනත් කාර්යාල උපකරණ | 31,736,137 | 2,344,150 | 0 | 34,080,287 |
| ජංගම දුරකතන | 1,061,867 | 20,101 | 0 | 1,081,968 |
| කාර්යාල ගෘහ භාණ්ඩ | 21,274,957 | 1,091,774 | 0 | 22,366,731 |
| තාක්ෂණ උපකරණ | 68,833,886 | 1,170,631 | 0 | 70,004,517 |
| FMMS ව්‍යාපෘති ආවේක්ෂණ වාහන | 61,712,127 | 0 | 0 | 61,712,127 |
| FMMS ව්‍යාපෘති උපකරණ | 408,303,544 | 0 | 0 | 408,303,544 |
| කායවර්ධන උපකරණ | 5,629,707 | 0 | 0 | 5,629,707 |
| වීඩියෝ ඒකක උපකරණ | 12,572,266 | 0 | 0 | 12,572,266 |
| | **1,540,807,848** | **11,225,556** | **0** | **1,552,033,405** |
| නෙළුම් කුළුණ ඉඩම | 11,715,212,127 | 0 | 0 | 11,715,212,127 |
| | **13,256,019,976** | **11,225,556** | **0** | **13,267,245,532** |

| ක්ෂය කිරීම් | 2017.01.01 දිනට ශේෂය | 2017වර්ෂය සඳහා | | 2017.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | එකතු කිරීම් | ඉවත් කිරීම් මාරු කිරීම් | |
| ගොඩනැගිලි | 115,893,349 | 4,534,700 | 0 | 120,428,049 |
| කොකාවිල් කුළුණ | 181,550,778 | 31,493,348 | 0 | 212,044,126 |
| වවුනියා කුළුණ | 17,940,445 | 2,990,074 | 0 | 20,930,519 |
| වාහන | 93,902,245 | 20,093,797 | 0 | 113,996,042 |
| වායු සමීකරණ | 10,519,694 | 766,548 | 0 | 11,286,242 |
| විදුලි සෝපාන | 4,683,848 | 0 | 0 | 4,683,848 |
| විදුලි උත්පාදක යන්ත්‍ර | 2,665,428 | 0 | 0 | 2,665,428 |
| පරිගණක | 79,765,577 | 9,453,587 | 0 | 89,219,164 |
| වෙබ් සර්වර් | 2,213,661 | 0 | 0 | 2,213,661 |
| වෙනත් කාර්යාල උපකරණ | 21,733,690 | 1,871,569 | 0 | 23,605,259 |
| ජංගම දුරකතන | 657,856 | 78,287 | 0 | 736,144 |
| කාර්යාල ගෘහභාණ්ඩ | 13,772,184 | 1,383,859 | 0 | 15,156,043 |
| තාක්ෂණික උපකරණ | 20,295,044 | 6,483,616 | 0 | 26,778,660 |
| FMMS ව්‍යාපෘති ආවේක්ෂණ වාහන | 11,622,467 | 7,714,016 | 0 | 19,336,483 |
| FMMS ව්‍යාපෘති උපකරණ | 315,625,433 | 10,760,214 | 0 | 326,385,647 |

| | | | | |
|---|---|---|---|---|
| කායවර්ධන උපකරණ | 5,616,607 | 13,100 | 0 | 5,629,707 |
| මාධ්‍ය ඒකක උපකරණ | 10,684,912 | 822,412 | 0 | 11,507,324 |
| | **909,143,218** | **98,459,127** | **0** | **1,007,602,345** |
| **ශුද්ධ පොත් අගය** | **12,346,876,758** | | | **12,259,643,187** |

**සටහන්**

ඉඩම සඳහා අගය වන රු. 148,235,572 තුල මීගමුව කදිරාන පිහිටා ඇති රු. 45,000,000.00 වටිනා ඉඩම්වල වටිනාකමද ඇතුලත්ය. එම ඉඩමේ විශාලත්වය අක්කර 113 රූඩ් 02 පර්ච් 10.5 කි. ඉඩමේ විශාලත්වයෙන් ආසන්න වශයෙන් සියයට 50 ක ප්‍රමාණයක් කටාන ප්‍රාදේශීය ලේකම් විසින් අත්පත් කරගෙන ඇත. එම අත්පත් කර ගැනීමෙන් වූ බලපෑම ගිණුම් වලට ගෙන නැත.

**4.1 අස්පෘෂ්‍ය වත්කම්**

| පිරිවැය | 2017.01.01 දිනට ශේෂය | 2017වර්ෂය සඳහා | | 2017.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | එකතු කිරීම් | ඉවත් කිරීම් මාරු කිරීම් | |
| පරිගණක මෘදුකාංග | 8,429,774 | 9,495,150 | 0 | 17,924,924 |
| | 8,429,774 | 9,495,150 | 0 | 17,924,924 |

| ණය හිලව් කිරීම | 2017.01.01 දිනට ශේෂය | 2017වර්ෂය සඳහා | | 2017.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | එකතු කිරීම් | ඉවත් කිරීම් මාරු කිරීම් | |
| පරිගණක මෘදුකාංග | 6,036,938 | 3,333,800 | 0 | 9,370,737 |
| | 6,036,938 | 3,333,800 | 0 | 9,370,737 |
| **ශුද්ධ පොත් අගය** | **2,392,836** | | | **8,554,187** |

5. **කෙරීගෙන යන වැඩ**

| ණය හිලව් කිරීම | 2017.01.01 දිනට ශේෂය | 2017වර්ෂය සඳහා | | 2017.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | එකතු කිරීම් | ඉවත් කිරීම් මාරු කිරීම් | |
| ප්‍රවේශ ශාලාව සහ ප්‍රධාන ගොඩනැගිල්ල | 10,057,910 | 0 | 0 | 10,057,910 |
| නෙළුම් කුළුන ඉදි කිරීම | 10,638,930,582 | 3,513,666,793 | 0 | 14,152,597,375 |
| තොරතුරු තාක්ෂණ උද්‍යානය හම්බන්තොට | 652,930,152 | 29,926,444 | 0 | 682,856,596 |
| | 11,301,918,644 | 3,543,593,237 | 0 | 14,845,511,880 |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ගිණුම් සටහන් - 2017.12.31
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

| | | 31.12.2017 | 31.12.2016 |
|---|---|---|---|

6. <u>ආයෝජන</u>

| | | | |
|---|---|---|---|
| භාණ්ඩාගාර තැන්පතු | | 354,000,000 | 354,000,000 |
| ස්ථාවර තැන්පත් - මහජන බැංකුව | | 5,600,000,000 | 0 |
| ප්‍රතිගැනුම් ගිවිසුම යටතේ රජයේ සුරැකුම්පත් | | 0 | 0 |
| | | 5,954,000,000 | 354,000,000 |
| ස්ථාවර තැන්පතු සහ ප්‍රතිගැනුම් යටතේ ලැබිය යුතු පොලී | | 267,020,046 | 3,097,404 |
| | | 6,221,020,046 | 357,097,404 |

7. <u>අත්තිකාරම් ගෙවීම් ලියාපදිංචි කිරීම</u>

| | | | |
|---|---|---|---|
| අත්තිකාරම් ගෙවීම් ලියාපදිංචි කිරීම (නෙළුම් කුළුන) | | 832,687,828 | 1,092,602,866 |
| අත්තිකාරම් ගෙවීම් ලියාපදිංචි කිරීම (තොරතුරු තාක්ෂණඋද්‍යානය | | 157,081,430 | 229,136,568 |
| | | 989,769,257 | 1,321,739,434 |

8. <u>ලැබිය යුතු ගිණුම්</u>

| | | | |
|---|---|---|---|
| ලැබිය යුතු සෙස් ගාස්තු | | 408,978,695 | 397,538,451 |
| ලැබිය යුතු විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | | 911,312,704 | 1,208,927,093 |
| ලැබිය යුතු පිටතට යැවෙන දේශිය ප්‍රවේශ ඇමතුම් ගාස්තු මතබදු | | 53,403,552 | 72,880,642 |
| ලබිය යුතු විදුලි සංදේශ බදු | | 1,635,306,264 | 1,892,659,609 |
| අයකර ගතයුතු කොකාවිල් කුළුන | | 94,308,595 | 91,665,480 |
| අයකර ගතයුතු හිග කාර්ය මණ්ඩල ණය | | 2,547,337 | 2.547,337 |
| ලැබිය යුතු ගිනුමට කොකාවිල් බදු කුලී | | 1,536,292 | 13,294,668 |
| ලැබිය යුතු කෙටි සංකේත අංක ගාස්තු | | 0 | 20,433 |
| වෙළඳ ණය ගැතියෝ | **08 A** | 3,231,627,673 | 2,870,904,371 |
| | | 6,339,021,114 | 6,550,438,085 |

08 A. <u>වෙළඳ ණය ගැතියන්</u>

| | | |
|---|---|---|
| ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු | 3,603,995,092 | 3,212,914,856 |
| ආධුනික ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු | 43,614 | 44,783 |
| | ------------------ | ------------------ |
| | 3,604,038,706 | 3,212,959,639 |
| අඩුකලා බොල්ණයගැතියන් සඳහා වෙන් කිරීම් | (372,411,033) | (342,055,268) |
| | ------------------ | ------------------ |
| | 3,231,627,673 | 2,870,904,371 |
| | =========== | =========== |

**සටහන (1)**

බොල්ණයගැතියන් සඳහා වෙන් කිරීම්

| | ණයගැතියෝ | | වෙන් කිරීම් |
|---|---|---|---|
| වසර 02 වඩා වැඩි | 371,451,5700 | 100% | 371,451,570 |
| වසර 01 වඩා වැඩි වසර 02 වඩා අඩු | 9,594,627 | 10% | 959,463 |
| මාස 06 වඩා වැඩි වසර 01 වඩා අඩු | 3,354,837 | 0% | 0 |
| මාස 02 වඩා වැඩි මාස 06 වඩා අඩු | 137,056,788 | 0% | 0 |
| මාස 01 වඩා වැඩි මාස 02 වඩා අඩු | 1,400,531,132 | 0% | 0 |
| මාස 01 වඩා අඩු | 1,682,049,752 | 0% | 0 |
| | ---------------- | | --------------- |
| | 3,604,038,706 | | 372,411,033 |
| | ----------------- | | ---------------- |

**සටහන (2)**

ඉහත ආකාරයෙන් පිළිවෙලින් වසරකට වඩා වැඩි බොල් සහ අඩමාන ණය ගැතියෝ සඳහා සියයට 100 සහ 10 වෙන් කිරීම් ලබා දීමෙන් පසු සාධාරණ අගයකින් යුතුව බොල් ණය ගැතියන් ප්‍රකාශ කෙරේ.

9. <u>පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්</u>

| | | |
|---|---|---|
| විශේෂ අත්තිකාරම් | 575 | 575 |
| උත්සව අත්තිකාරම් | 217,000 | 210,000 |
| ගැනුම් අත්තිකාරම් | 132,140 | 186,140 |
| | ---------- | ---------- |
| | 349,715 | 396,715 |
| | ====== | ====== |

10. <u>ණය සහ වෙනත් ලැබීම්</u>

| | | |
|---|---|---|
| ආපදා ණය | 36,930,236 | 27,999,773 |
| මෝටර් රථ ණය | 114,882,989 | 98,511,236 |
| දේපල ණය | 2,053,446 | 2,702,529 |
| මෝටර් බයිසිකල් ණය | 348,401 | 487,546 |
| අයකරගතයුතු වැටුප් අත්තිකාරම් | 20,648 | 27,655 |
| වෙනත් ලැබීම් | 2,066,122 | 2,056,122 |
| ලැබිය යුතු වෛද්‍ය රක්ෂණ හිමිකම් | 0 | 21,500 |
| CEB තැන්පතු ගිණුම්(තොරතුරු තාක්ෂණඋද්‍යානය) | 125,000 | 125,000 |
| | --------------- | --------------- |
| | 156,426,841 | 131,931,361 |
| | ========= | ========= |

11. <u>මුදල් සම මුදල් සමානුපාත</u>

| | | | |
|---|---|---|---|
| බැංකු මුදල් | 11A | 210,286,330 | 7,986,416 |
| අතැති මුදල් | 11B | 70,000 | 55,000 |
| කොටස්වෙළඳපොල ඉතුරුම් ගිණුම් | | 5,414,135,038 | 12,055,152,097 |
| | | ----------------- | ------------------- |
| | | 5,624,491,369 | 12,063,193,512 |
| | | ========== | =========== |

11A. <u>බැංකු මුදල්</u>

| | | |
|---|---|---|
| මහජන බැංකුව නාරාහේන්පිට තැන්පතු ගිණුම ගිණුම් අංක 119/RFC/SA/USD/0032 | 87,987,394 | 84,512,221 |
| ජංගම ගිණුම් අංකය 119-1-001-4-36931690 | 88,545,068 | (115,434,747) |
| මහජන බැංකුව නාරාහේන්පිට ශාඛාව (ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු ජංගම ගිණුම් අංකය 119-1-001-3-3693264 | 379,303 | 204,298 |
| ලංකා බැංකුව නාරාහේන්පිට ශාඛාව ජංගම ගිණුම් අංකය 2323167 | 33,374.566 | 38,704,643 |
| | ---------------- | --------------- |
| | 210,286,330 | 7,986,416 |
| | ========== | ========= |

11B. <u>අතැති මුදල්</u>

| | | |
|---|---|---|
| සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය | 10,000 | 10,000 |
| සුළු මුදල් - පාලන හා මානව සම්පත් අංශය | 5,000 | 5,000 |
| සුළු මුදල්- (කොකාවිල්) | 100,00 | 10,000 |
| සුළු මුදල් (නෙළුම් කුළුණ) | 25,000 | 25,000 |
| සුළු මුදල් - අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය | 15,000 | 0 |
| සුළු මුදල් - අනුකූලතා | 5,000 | 5,000 |
| | ------------- | ----------- |
| | 70,000 | 55,000 |
| | ======== | ======= |

12. <u>රජයේ දායකවීම්</u>

| | | |
|---|---|---|
| ලෝක බැංකු ණය ගිවිසුම් | 298,572,434 | 298,572,434 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | 19,533,906 | 19,533,906 |
| වෙනත් රජයේ දායකවීම් | 208,108,404 | 208,108,404 |
| | --------------- | --------------- |
| | 536,214,744 | 526,214,744 |
| | ========= | ========= |

13. <u>රඳවා ගැනීම්</u>

| | | |
|---|---|---|
| රඳහා ගැනීම් - නෙළුම් කුළුණ | 0 | 790,916,803 |
| රඳහා ගැනීම් - තොරතුරු තාක්ෂණ උද්‍යානය | 46,152,801 | 88,281,496 |
| | ------------- | --------------- |
| | 46,152,801 | 879,198,298 |
| | ======== | ========= |

ව්‍යාපෘති උපදේශන ලේඛනයේ (PCU) නිර්දේශය සහ අනුමැතිය සහ අමාත්‍ය මණ්ඩලය විසි් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවේ (CANC) දැනුම්දීම මත කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ප්‍රකාරව රඳවා ගැනීම් නිදහස් කරන ලද අතර HSBC මගින් අවලංගු කළ නොහැකි බැංකු ඇපකරය ඉදිරිපත් කිරීම.

14. <u>පාරිතෝෂික ප්‍රතිලාභ</u>

| | | |
|---|---|---|
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 49,963,007 | 43,596,474 |
| ස්ථාවර තැන්පතු පාරිතෝෂික | (43,600,000) | (41,000,000) |
| | --------------- | --------------- |
| ශුද්ධ ප්‍රතිලාභ වගකීම් | 6,363,007 | 2,596,474 |
| | ========= | ========= |

15. <u>ගෙවිය යුතු ගිණුම්</u>

| | | |
|---|---|---|
| උපචිත වියදම් | | |
| දුරකථන - කාර්යාල | 811,017 | 1,286,332 |
| දුරකථන - නිවාස | 223,079 | 0 |
| වැටුප් පාලන | 11,884 | 134,543 |
| ගෙවිය යුතු වැටුප් | 216,634 | 216,384 |
| ගෙවිය යුතු වැන්දඹු හා අනත්දරු | 2,991 | 2,991 |
| විදුලිය | 1,019,198 | 2,670,660 |
| ජලය | 86,505 | 43,978 |
| සනීපාරක්ෂක සේවා | 648,438 | 602,691 |
| ආරක්ෂක සේවා | 2,000,000 | 1.782,235 |
| අතිකාල | 1,321,907 | 1,578,169 |
| සේවක අර්ථසාධක අරමුදල | 3,303,928 | 2,826,964 |
| සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | 397,020 | 338,397 |
| අන්තර්ජාල | 506,262 | 356,466 |
| වෛද්‍ය රක්ෂණ හිමිකම් | 250,995 | 250,995 |
| ගෙවිය යුතු ගමන් වියදම් හා යැපීම් | 2,200 | 19,460 |
| කාර්ය මණ්ඩල සුහසාධනය | 272,737 | 246,342 |
| පුවත්පත් හා නිවේදන | 30,040 | 43,325 |
| විගණන ගාස්තු | 1,267,460 | 1,278,110 |
| බදු කුලී | 0 | 624,984 |
| ප්‍රසාද දීමනා | 33,782,946 | 19,774,777 |
| රඳවා ගැනීම් | 40,595 | 40,595 |
| දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාල් | 66,309,297 | 49,092,689 |
| (ආර්ථික සේවා ගාස්තු, ජාතිය ගොඩනැගීමේ | | |
| බදු, මුද්දර ගාස්තු | | |
| වැටුප් අඩු කිරීම් | 132,214 | 228,055 |
| අලුත්වැඩියා සහ නඩත්තු | 23,228,871 | - |
| ගෙවිය යුතු ගුවන් ටිකට්පත් | 154,480 | 112,120 |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | 1,495,449 | 1,033,933 |
| ගෙවිය යුතු උපයනවිට ගෙවීමේ බදු | 3,245,758 | 2,055,248 |
| (කොමිෂන් සහා සාමාජික දීමනා) | | |
| විවිධ | 0 | 1,176,166 |
| ආදායම් බදු සඳහා වෙන් කිරීම් | 34,964,188 | 375,530,411 |
| ගෙවිය යුතු විවිධ ගැනුම් සහ සැපයුම් | 1,629,429 | 0 |
| ගෙවිය යුතු වාර්ෂික දායක මුදල් | 545,611 | 0 |
| ගෙවිය යුතු උපදේශන ගාස්තු | 285,000 | 0 |
| කාර්ය මණ්ඩල ණය වාරික අයකර ගැනීම | 157,010 | 0 |
| ගෙවිය යුතු ඉන්ධන | 265,943 | 0 |
| ගෙවිය යුතු මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය | 2,242,831 | 0 |
| | -------------- | --------------- |
| | 180,850,917 | 463,347,017 |
| | ========= | ========= |

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ගිණුම් සටහන් - 2017.12.31
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

| | 2017.12.31 | 2016.12.31 |
|---|---|---|
| 16. <u>අත්තිකාරම් තැන්පතු සහ වෙනත් ගෙවිය යුතු දෑ</u> | | |
| අත්තිකාරම් ලෙස ලැබුණු ආදායම් | 8,193,005,490 | 3,937,101,869 |
| ටෙන්ඩර් සඳහා ආපසු ගෙවිය යුතු තැන්පතු | 1,508,167 | 1,546,667 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු - සේවක | 2,086,843 | 2,086,843 |
| මෙගාහර්ට්ස් 1800 ක පරාසය සඳහා ලැබුනු ආදායම | 57,500,000 | 57,500,000 |
| තොරතුරු හා සන්නිවේදනය තාක්ෂණය පිළිබඳ ඵලදායී ආර්ථික කමිටුව | 34,210 | 34,210 |
| හානි වූ ඇන්ටනා සඳහා රක්ෂණ හිමිකම් | 25 | 25 |
| සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු වැඩියෙන් අයකර ගැනීම | 2,101,870 | 1,748,731 |
| සීටීඕ විදුලි සංදේශ ව්‍යාපෘතිය | 924,492 | 924,492 |
| එකතු කල අගය මත බදු පාලන ගිණුම | 100,761,116 | 32,931,752 |
| ඉදිකිරීම් ණයගැතියෝ | 751,650 | 751,650 |
| | 8,358,673,863 | 4,034,626,238 |
| 17. <u>භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ</u> | | |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු 50% විදුලි සංදේශ සංවර්ධන අරමුදල | 455,656,465 | 604,463,546 |
| පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු බදු | 53.4 03,552 | 72,880,642 |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු විදුලි සංදේශ බදු | 1,635,306,265 | 1,892,659,611 |
| | 2,144,366,283 | 2,570,003,799 |
| 18. <u>ආදායම</u> | | |
| ආදායම-බලපත්‍රගාස්තු | 18,286,520,005 | 15,859,309,005 |
| විදුලි සංදේශ බදු | 29,133,386,810 | 30,346,376,676 |
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | 6,217,860,564 | 8,690,591,326 |
| පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු බදු | 730,277,719 | 1,127,678,211 |
| | 54,368,045,117 | 56,023,955,218 |

18A. <u>ආදායම</u>

| | | |
|---|---|---|
| ආදායම - බලපත්‍ර ගාස්තු | 690,142,880 | 1,751,344,170 |
| පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු | 4,211,919,781 | 4,067,179,362 |
| ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු | 6,861,209,627 | 7,496,092,897 |
| සංඛ්‍යාත පෙරගෙවුම් ගාස්තු | 4,509,183,673 | 367,346,939 |
| වෙළඳ බලපත්‍ර ගාස්තු | 13,663,749 | 14,770,619 |
| ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු | 29,345 | 72,958 |
| නැව් මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු | 440,142 | 892,001 |
| ගුවන් යානා මධ්‍යස්ථාන | 396,266 | 1,169,944 |
| රැහැන් රහිත දුරකතන බෙදා හැරීමේ ගාස්තු | 457,819 | 417,138 |
| අයදුම්පත්‍ර සැකසීමේ ගාස්තු | 1,428,572 | 1,632,651 |
| කෙටි සංකේත අංක ගාස්තු | 27,704,056 | 19,387,755 |
| අතිරික්ත ආදායම - 18 අ(1) | 2,272,461,943 | 2,295,412,016 |
| | ---------------- | ---------------- |
| | 18,698,254,879 | 16,106,478,647 |
| අඩුකලා ජාතිය ගොඩනැගීමේ බදු | (411,734,874) | (247,169,642) |
| | ---------------- | ---------------- |
| | 18,286,520,005 | 15,859,309,005 |
| | ========== | ========== |

18A(1). <u>අනෙකුත් අදායම්</u>

| | | |
|---|---|---|
| කාර්ය මණ්ඩල ණය වලින් ලද පොලී ආදායම | 6,047,699 | 5,429,347 |
| ස්ථාවර තැන්පතු මත පොලී | 2,027,097,093 | 1,964,452,870 |
| ප්‍රති ගැනුම් ගිවිසුම මගින් පොලී ආදායම | 0 | 136,562,247 |
| කොටස් වෙළඳ පොල ගනුදෙනු මගින් පොලී ආදායම | 209,981,046 | 166,266,227 |
| කොකාවිල් බදු කුලී | 12,348,475 | 21,167,983 |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම මත ලාභය/පාඩුව | 0 | 376,850 |
| වෙනත් ආදායම් - විවිධ | 987,631 | 1,156,492 |
| විත්‍රපටිය සහ ටෙලිනාට්‍ය මගින් අයකර ගැනීම | 16,000,000 | 0 |
| | --------------- | ---------------- |
| | 2,272,461,943 | 2,295,412,016 |
| | ========== | ========== |

18B. <u>විදුලි සංදේශ සංවර්ධන ගාස්තු</u>

| | | |
|---|---|---|
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායම | 6,217,860,564 | 8,690,591,326 |
| | ---------------- | ---------------- |
| | 6,217,860,564 | 8,690,591,326 |
| | ========== | ========== |

19. <u>නියාමන වියදම්</u>

| | | |
|---|---|---|
| ITU වාර්ෂික සාමාජික මුදල් | 24,727,919 | 24,876,586 |
| APT වාර්ෂික සාමාජික මුදල් | 370,835 | 2,278,072 |
| SAFIR වාර්ෂික සාමාජික මුදල් | 545,611 | 604,416 |
| SATRC සඳහා දායකත්වය | 2,315,430 | 0 |
| වාර්ෂික පුස්තකාල සාමාජික මුදල | 5,000,836 | 15,000 |
| CTO වාර්ෂික සාමාජික මුදල | 5,000,836 | 3,997,302 |
| නියාමන කටයුතු සඳහා සහභාගී වීම | 18,051,265 | 22,228,930 |
| නඩුව ගොනු කිරීම සහ පෙනී සිටීමේ ක්‍රියා මාර්ග | 3,783,278 | 3,339,278 |
| පොදු දුරකථන කුටි කර්මාන්තය පිළිබඳ සමීක්ෂණ වැඩසටහන් | 0 | 4,796 |

| | | |
|---|---|---|
| අන්තර්ජාලයෙන් දරුවන් ආරක්ෂා කරගැනීමේ වැඩසටහන | 4,110 | 487,646 |
| විවිධ නියාමන වියදම් | 1,175,537 | 1,652,713 |
| විශේෂ අවශ්‍යතාවයන් සහිත තැනැත්තන් සඳහා සන්නිවේදන පහසුකම් | 0 | 1,054,244 |
| ආර්ථිකමය සමාජ වගකීම් | 825,000 | 101,575,000 |
| විදේශ නියෝජිතයන් පැමිණීම | 0 | 55,550 |
| නෙළුම් කුළුණ ව්‍යාපෘතිය | 126,121 | 209,531 |
| නියාමන කටයුතු සඳහා ප්‍රවාහන සහ යැපීම් වියදම් | 1,788,052 | 1,398,719 |
| ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සත්කාරකත්වය | 5,924,234 | 0 |
| | ------------- | --------------- |
| | 66,857,614 | 164,191,324 |
| | ======== | ========= |

20. <u>ආයතන හා පරිපාලන වියදම්</u>

| | | |
|---|---|---|
| වැටුප් | 159,514,188 | 134,208,108 |
| සේවක අර්ථසාධක අරමුදල (15% දායකමුදල) | 22,456,336 | 19,310,021 |
| සේවානියුක්තියන්ගේ භාරඅරමුදල | 4,564,951 | 4,586,671 |
| ප්‍රවාහන දීමනාව | 18,581,767 | 18,756,408 |
| ගෙවල්කුලී දීමනාව | 13,313,846 | 11,681,493 |
| වෙනත් දීමනා | 1,532,366 | 1,553,687 |
| කාර්යසාධන දිරිදීමනාව | 33,261,744 | 29,097,764 |
| විශේෂ දීමනා | 139,567 | 531,589 |
| අතිරේක දීමනා | 9,142,552 | 23,585,722 |
| ප්‍රසාදදීමනා | 27,085,968 | 12,549,822 |
| අතිකාල | 12,656,173 | 10,257,964 |
| සභාපතිගේ වේතනය | 400,000 | 1,200,000 |
| භාවිතා නොකළ විවේක නිවාඩු දීමනා | 9,773,331 | 11,317,504 |
| විශ්‍රාම වැටුප් සඳහා කොමිෂන් සභාවේ දායකත්වය | 2,569,049 | 485,815 |
| නිවාස දූරකතන | 2,813,275 | 2,778,853 |
| නිළ ඇඳුම් | 504,127 | 474,511 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | 10,469,038 | 8,422,002 |
| ක්‍රීඩා ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම | 2,120,947 | 887,567 |
| කාර්ය මණ්ඩල වෘත්තීය සාමාජික මුදල් | 484,198 | 417,935 |
| දේශීය පුහුණු | 1,919,716 | 1,376,700 |
| කොමිෂන් සභා සාමාජිකයන්ගේ දීමනා | 262,500 | 175,000 |
| විගනණ කමිටු දීමනාව | 110,000 | 150,000 |
| 2/3 නිවාස ණය මුදල ප්‍රතිපූර්ණය කිරීම | 5,480,175 | 3,137,421 |
| ප්‍රවාහන සහ යැපීම් දීමනා | 20,325 | 246,277 |
| පාරිතෝෂික | 3,115,425 | 3,260,668 |
| විදුලිය | 13,788,075 | 13,879,419 |
| ජලය | 713,702 | 744,517 |
| සනීපාරක්ෂක සේවා | 5,196,220 | 5,141,810 |
| ආරක්ෂක සේවා ගාස්තු | 10,454,599 | 8,399,435 |
| වරිපනම් හා බදු | 142,839 | 917,093 |
| පුස්තකාල පොත් | 0 | 167,125 |

| | | |
|---|---|---|
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 7,904,072 | 8,052,509 |
| ඉන්ධන | 2,819,109 | 2,714,740 |
| විදුලි භාණ්ඩ | 0 | 132,050 |
| තැපැල් ගාස්තු | 814,290 | 879,546 |
| දුරකතන, ෆැකස් සහ PABX | 7,423,220 | 7,272,401 |
| රක්ෂණ (දේපල සහ වෙළඳ) | 44,494,863 | 46,605,122 |
| අන්තර්ජාල ගාස්තු | 3,261,138 | 4,612,123 |
| පුවත්පත් හා දැන්වීම් | 5,598,646 | 4,406,543 |
| උපදේශන ගාස්තු | 385,000 | 0 |
| සමුළු හා සම්මන්ත්‍රණ | 1,005,852 | 412,102 |
| විගණන ගාස්තු | 600,000 | 600,000 |
| නීති වියදම්, විනය විමර්ශන/මූලික විමර්ශණ | 378,680 | 417,504 |
| කල්බදු පරිශ්‍ර සඳහා කුලී | 1,665,554 | 442,600 |
| ක්ෂයවීම | 98,459,127 | 95,280,094 |
| ණය හිලව් කිරීම | 3,333,800 | 6,036,938 |
| විවිධ පාලන වියදම් | 704,127 | 376,522 |
| විවිධ මිලදී ගැනීම් සහ සැපයීම් | 969,352 | 1,069,214 |
| විවිධ මෙහෙයුම් පිරිවැය | 61,490 | 868,384 |
| කාර්යාල උපකරණ නඩත්තු වියදම් | 1,513,406 | 2,494,583 |
| විදුලි සෝපාන නඩත්තු වියදම් | 1,118,417 | 585,000 |
| විදුලි උත්පාදක යන්ත්‍ර නඩත්තු වියදම් | 62,438 | 226,008 |
| වාහන නඩත්තු වියදම් | 4,751,277 | 4,774,022 |
| ගොඩනැගිලි නඩත්තු වියදම් | 1,460,319 | 4,905,172 |
| තාක්ෂණික උපකරණ නඩත්තු වියදම් | 2,614,209 | 1,572,029 |
| මෘදුකාංග නඩත්තු වියදම් සහ සංවර්ධන වියදම් | 43,610,724 | 19,624,833 |
| වැඩි දියුනු කළ පිරික්සුම් පද්ධති | 697,701 | 3,575,804 |
| කුළුණු නඩත්තු වියදම් | 253,996 | 730,294 |
| විවිධ අළුත්වැඩියි සහ නඩත්තු වියදම් | 26,000 | 0 |
| EX-grath ගෙවීම් | 143,300 | 0 |
| | 608,717,107 | 548,374,998 |

21. <u>මූල්‍ය සහ අනෙකුත් වියදම්</u>

| | | |
|---|---|---|
| බැංකු ගාස්තු | 256,651 | 272,329 |
| මුද්දර බද්ද | 0 | 600 |
| පාරිතෝෂික මුදල් වෙන් කිරීම මත පොලිය | 3,917,840 | 2,809,761 |
| | 4,174,491 | 3,082,690 |

22. <u>ඒකාබද්ධ අරමුදලට දායක වීම</u>

| | | |
|---|---|---|
| 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විදුලි සංදේශ පනත යටතේ දායකවීම | 7,800,000,000 | 13,000,000,000 |
| ගෙවන ලද විදුලි සංදේශ බදු | 29,133,886,819 | 30,343,930,211 |
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තුවෙන්50% | 3,108,930,282 | 4,345,295,663 |
| පිටතට යැවෙන දේශිය ප්‍රවේශ ගාස්තු බදු | 730,277,739 | 1,127,678,211 |
| | 40,773,094,840 | 48,816,904,084 |

**විදුලි සංදේශ පනත යටතේ දායකමුදල** 22.2

| | | | |
|---|---|---|---|
| 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායමෙන් | | 15,000,000,000 | 15,000,000,000 |
| | | =========== | =========== |

23. **<u>මෙහෙයුම් වලින් උත්පාදනය වූ මුදල්</u>**

| | | | |
|---|---|---|---|
| බදු වලට පෙර ශුද්ධ ලාභය | | 53,576,471,208 | 55,341,721,121 |
| ගැලපුම් සඳහා | | | |
| දේපල, පිරියත සහ උපකරණ ක්ෂයවීම | | 98,459,127 | 101,317,032 |
| බොල්ණය සහ අඩමාන ණය ණයැතියන් සඳහා වෙන්කිරීම් | | 30,355,765 | (30,742,498) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් | | 3,115,425 | 3,260,668 |
| ස්ථාවර තැන්පතු හා ප්‍රතිගැනුම් ගිවිසුම මගින් පොලී ආදායම | | (2,027,097,093) | (2,101,015,117) |
| කොටස් වෙළඳපළ ගණුදෙන් වලින් පොලී ආදායම | | (209,981,046) | (166,266,227) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් මත පොලී පිරිවැය | | 3,917,840 | 2,809,761 |
| විදේශ මුදල් ගණුදෙනු මත ලාභය | | 81,468,932 | (2,672,418) |
| ස්ථාවර වත්කම් ඉවත්කිරීම මත ලාභය | | 0 | (376,850) |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් කිරීම** | | | |
| ලැබිය යුතු ගිණුම් | 23-1 | 181,061,207 | (698,741,648) |
| පූර්ව ගෙවීම් සහ අත්තිකාරම් | | 47,000 | 4,927,575 |
| ණය සහ වෙනත් ලැබීම් | | (24,495,480) | 147,087,176 |
| ගෙවිය යුතු ගිණුම් | 23-2 | 58,070,122 | (15,976,728) |
| අත්තිකාරම් තැන්පතු සහ වෙනත් ගෙවීම් | | 4,324,047,625 | (851,484,766) |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු | | (425,617,516) | (158,877,668) |
| | | ---------------- | ---------------- |
| මෙහෙයුම් තුලින් උත්පාදනය වූ මුදල් | | 55,673,136,915 | 51,574,969,413 |
| | | ========== | ========== |

23-1. **<u>ලැබිය යුතු ගිණුම්</u>**

| | | |
|---|---|---|
| ලැබිය යුතු සෙස් ගාස්තු | 408,978,695 | 397,538,451 |
| ලැබිය යුතු විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | 911,312,704 | 1,208,927,093 |
| ලැබිය යුතු පිටතට යැවෙන දේශීය ගාස්තු මත බදු | 53,403,552 | 72,880,642 |
| ලැබිය යුතු විදුලි සංදේශ බදු | 1,635,306,264 | 1,892,659,609 |
| අයවිය යුතු කොකාවිල් කුළුන | 94,308,595 | 91,665,480 |
| හිග කාර්ය මණ්ඩල ණය අයවීම් | 2,547,337 | 2,547,337 |
| ලැබිය යුතු ගුවන් ටිකට්පත් | 0 | 0 |
| ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු | 3,603,995,092 | 3,212,914,856 |
| ලැබිය යුතු කොකාවිල් බදු කුලී | 1,536,292 | 13,294,668 |
| ලැබිය යුතු කෙටි සංකේත අංක ගාස්තු | 0 | 20,433 |
| ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු | 43,614 | 44,783 |
| ජංගම ක්‍රියාකරු බදු | 0 | 0 |
| | ---------------- | ---------------- |
| | **6,711,432,147** | **6,892,493,354** |
| | ---------------- | ---------------- |
| | **181,061,207** | **(698,741,648)** |
| | ========== | ========== |

23-2 **<u>ගෙවිය යුතු ගිණුම්</u>**

| | | |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ප්‍රකාරව | 180,850,917 | 463,347,017 |
| අඩුකාල ආදායම් බදු වෙන් කිරීම් | (34,964,188) | (375,530,411) |
| | **145,886,728** | **87,816,606** |
| | **58,070,122** | **(15,976,728)** |

# විගණකාධිපතිගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව

கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்

**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } සීඑම්යූ/ඒ/ටීආර්සී/01/17/11 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 ඔක්තෝබර් 02 දින

සභාපති

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතේ 22(ඒ)(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කොමිෂන් සභාවේ සභාපති වෙත 2018 ජූලි 31 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ .

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයෙහි 99 ඡේදය ප්‍රකාරව ආයතනයක් විසින් වියදම්වල ස්වභාවය අනුව හෝ ආයතනයේ කාර්යයන්ට අදාලවන ආකාරයට එහි වියදම්, මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් කොමිෂන් සභාවේ කාර්යයන්වලට පරිබාහිර කාර්යයන් සඳහා වැය කර තිබුණු රු. 825,000 ක් සභාවේ කටයුතු නියාමනය කිරීමේ වියදම් (Regulatory Expenses) ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 9,562,937 ක් වූ ස්ථාවර වත්කම සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ, ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

(i) ප්‍රමිතයෙහි 57 (ඇ) (III) වගන්තිය අනුව පාරිතෝෂික සඳහා වන ස්ථාවර තැන්පතුවෙහි වර්ෂයට අදාල පොළී ආදායම රු. 5,589,452 ක් විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගත යුතු වුවද පාරිතෝෂික වෙන්කිරීමේ ගිණුමට බැර කිරීම හේතුවෙන් පාරිතෝෂික වෙන්කිරීම වැඩියෙන්ද වර්ෂයේ ලාභය අඩුවෙන්ද පෙන්නුම් කර තිබුණි.

(ii) තවද එම ස්ථාවර තැන්පතුවට අදාල පොළී ආදායම එම වත්කමට එකතු කිරීමකින් තොරව කොමිෂන් සභාවේ ආයෝජනවලට එකතුකර පෙන්වා තිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංඛ්‍යාත කළමනාකරණ නඩත්තු මෘදුකාංග (Frequency Management Maintenance Software – FMMS) ව්‍යාපෘතියේ මෘදුකාංග නඩත්තු කිරීම වෙනුවෙන් 2017 නොවැම්බර් 01 සිට 2018 ඔක්තෝබර් 31 දක්වා රු. 21,697,523 ක් 2018 වර්ෂයේදී ගෙවා තිබූ අතර එම සම්පූර්ණ මුදලම සමාලෝචිත වර්ෂයේ වියදම් හා උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. එසේවුවද ගෙවූ මුදලින් රු.18,071,362 ක් අදාල වනුයේ 2018 වර්ෂයට වූ බැවින් සමාලෝචිත වර්ෂයේ වියදම් හා උපචිත වියදම් එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව 2018 වර්ෂයේදී ගෙවන ලද නෙළුම් කුළුණ ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා උපදේශක සේවාවන් ලබාගැනීමේ වියදම් ඇතුළුව එකතුව රු. 4,310,660 ක් සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2010 වර්ෂයේ මිලදී ගන්නා ලද රු. 1,795,000 ක් වටිනා වාහනයක් වෙනුවෙන් 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ ක්ෂය නිවැරදිව ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සමුච්චිත ක්ෂය වටිනාකම වාහනයේ පිරිවැය ඉක්මවා රු. 2,855,310 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගන්නා ලද රු.4,866,987 ක් වටිනා පරිගණක මෘදුකාංග ඒ යටතේ දෙවරක් සටහන් කිරීම නිසා එම අගයෙන් මූල්‍ය ප්‍රකාශනවල පරිගණක මෘදුකාංග වටිනාකම වැඩියෙන් දක්වා තිබුණ අතර ඊට අදාල බැර සටහන කාර්යාල උපකරණ අළුත්වැඩියා හා නඩත්තු වියදම් ගිණුමෙන් අඩුකර දක්වා තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය ද රු.4,866,987 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන දක්වා තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල බදු ගෙවීමේ උපලේඛන අනුව ජාතිය ගොඩනැගීමේ බදු සහ ආර්ථික සේවා ගාස්තුවලට යටත් පිරිවැටුම, රු. 20,586,730,761 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එම පිරිවැටුම රු. 20,681,696,557 ක් වූයෙන් බද්දට යටත් පිරිවැටුම රු. 94,965,796 ක වෙනසක් විය. කෙසේ වුවද ඒ සඳහා සැසඳීම් ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුකළ අගය මත බදු පාලන ගිණුමේ ශේෂය රු.100,761,116 ක් වුවද බදු උපලේඛන අනුව රු. 113,182,122 ක් වූයෙන් වෙනස රු.12,421,006 ක් විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ..

(අ) රාජ්‍ය සමාගමක් විසින් ප්‍රමාද වී ගෙවන ලද රු. 6,779,212 ක විදුලි සංදේශ සංවර්ධන ගාස්තු සඳහා ගෙවිය යුතු රු. 813,505 ක අධිභාර 2018 ජූලි 16 දින වන විටත් ගෙවා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී සන්නිවේදන ක්‍රියාකරුවකුගෙන් මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු ලෙස රු. 7,621,129 ක් අයකර නොතිබුණි.

(ඇ) කොකාවිල් ඇන්ටනා හා ට්‍රාන්ස්මිෂන් කුළුණ භාවිතා කරනු ලබන රාජ්‍ය අංශයේ ක්‍රියාකරුවන් 4 දෙනෙකුගෙන් හා පෞද්ගලික අංශයේ එක් ක්‍රියාකරුවෙකුගෙන් 2012 වර්ෂයේ සිට අයවිය යුතු වාරික මුදල් ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණ අතර එම ක්‍රියාකරුවන් සමඟ ගිවිසුම්වලටද එළඹී නොතිබුණි.

ඊට අමතරව 2012 ජනවාරි සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා තවත් ආයතන 04 කින් රු. 93,846,873 ක විදුලි බිල්පත් ගාස්තු කොකාවිල් ඇන්ටනා හා ට්‍රාන්ස්මිෂන් කුළුණ භාවිතා කරනු ලබන ක්‍රියාකරුවන්ගෙන් 2018 ජූලි 16 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු. 3,604,038,706 ක් වූ ණයගැති ශේෂයෙන් රු. 371,451,570 ක් වර්ෂ 02 කට වැඩි ණය ශේෂ වූ අතර ඒ තුළ වසර 09 සිට වසර 26 දක්වා වූ රු. මිලියන 01 ට වැඩි ණයගැති ශේෂය රු. 197,130,954 ක් විය.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය සහ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී කොමිෂන් සභාව විසින් රු.42,700,000,000 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ආ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | උපයන විට ගෙවීම් මත බදු අදාල නිලධාරීන්ගේ වැටුපෙන් අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු වුවද, ඊට පටහැනිව පෙර වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද රු. 9,474,320 ක් උපයන විට බදු කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ඈ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය | කොමිෂන් සභා අනුමැතිය මත කොමිෂන් සභාවේ නිලධාරීන් හා සේවකයින් බඳවා ගැනීම සඳහා බඳවා ගැනීම් පරිපාටියක් සකස් කර එය භාවිතා කළද ඒ සඳහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. |
| (ඉ) 2005 ජනවාරි 27 දිනැති අංක PED/27 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | සෑම රාජ්‍ය ආයතනයක්ම තම ආයතනය යටතේ වන සියළුම වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු අදාල ආකෘතීන්ට අනුව කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කල යුතු වූවද කොමිෂන් සභාව විසින් එසේ කර නොතිබුණි. |

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1 ඡේදයට අනුව රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ස්ථාපිත කිරීම සඳහා පනවනු ලබන පනත්වල කාර්ය මණ්ඩලයේ වැටුප් හා දීමනා නියම කිරීමට අදාලව විවිධ ප්‍රතිපාදන සලසා තිබුණද ඒ සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. එසේ වුවද එම නිර්දේශ හා අනුමැතිය නොමැතිව කොමිෂන් සභා තීරණ මත හා අභ්‍යන්තර චක්‍රලේඛවලට අනුගත වෙමින් කාර්යමණ්ඩලය වෙත දිරි දීමනා, ප්‍රසාද දීමනා හා ගෙවල් කුලී දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු.73,661,558 ක් ගෙවා තිබුණි.

(ආ) 2007 ජූනි 01 දිනැති අංක එන්එස්සීසී/3/ජීසී/24 දරන ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලිපියෙන් මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලය සඳහා රු. 2,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් අනුමත කර තිබුණද, රු. 6,000 බැගින් සමාලෝචිත වර්ෂයේ ද ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ බදු පසු ලාභය රු. 53,040,035,396 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ බදු පසු ලාභය රු. 54,613,961,089 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,573,925,690 ක අඩුවීමක් දක්නට ලැබුණි. බලපත්‍ර ගාස්තු ආදායම, විදුලි සංදේශ බදු ආදායම, විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායම සහ පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු මත බදු ආදායම් (Levy on outgoing local access charges) රු. 1,655,910,100 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ දී රු. 46,937,880,323 ක් වූ අතිරික්තය 2017 වර්ෂය වන විට රු. 53,040,035,396 ක් දක්වා වර්ධනය වුවද එය 2016 වර්ෂයට සාපේක්ෂව රු. 1,573,925,693 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසුව 2013 වර්ෂයේදී රු.47,643,341,372 ක් වූ දායකත්වය 2017 වර්ෂයේදී රු. 54,005,262,703 ක් වුවද එය 2016 වර්ෂයට සාපේක්ෂව රු. 1,728,987,321 කින් අඩු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

කොමිෂන් සභාවේ ආදායම හා වියදම පසුගිය වසර හා සැසඳීමේදී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2017 දෙසැම්බර් 31 | 2016 දෙසැම්බර් 31 | වෙනස වැඩිවීම/ (අඩුවීම) | වෙනසේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු | 690,142,880 | 1,751,344,170 | (1,061,201,290) | (61) |
| සංඛ්‍යාත පූර්ව ගාස්තු | 4,509,183,673 | 367,346,939 | 4,141,836,734 | 1,127 |
| ස්ථාවර තැන්පතු පොළී ආදායම | 2,027,097,093 | 1,964,452,870 | 62,644,223 | 3 |
| නියාමන වියදම් | 66,857,614 | 164,191,324 | (97,333,710) | (59) |
| Levy on outgoing local access charges | 730,277,739 | 1,127,678,211 | (397,400,472) | (35) |
| මුළු ආදායම | 54,368,045,117 | 56,023,955,218 | (1,655,910,101) | (3) |
| මුළු වියදම | 791,573,908 | 682,234,096 | 109,339,812 | 16 |
| වර්ෂයේ බදු පෙර ලාභය | 53,576,471,208 | 55,341,721,121 | (1,765,249,913) | (3) |

(අ) සමාලෝචිත වර්ෂය තුළදී පෞද්ගලික ආයතන 05 කින් සංඛ්‍යාත පූර්ව ගාස්තු (Frequency Upfront fee) රු.4,509,183,673 ක් අයකර ගැනීම හේතුවෙන් 2017 වර්ෂයේ සංඛ්‍යාත පූර්ව ගාස්තු සියයට 1,127 කින් ඉහළ ගොස් තිබුණි.

(ආ) පසුගිය වසරට සාපේක්ෂව ආර්ථික සමාජ වගකීම් වියදම් රු. 100,750,000 කින් අඩුවීම හේතුවෙන් නියාමන වියදම් සියයට 59 කින් අඩුවී තිබුණි.

(ඇ) පසුගිය වසරට සාපේක්ෂව Levy on Outgoing local access Charges සියයට 35 කින් අඩුවී තිබූ අතර ස්මාර්ට් ෆෝන් (Smart Phone) භාවිතය හා ඕවර් ද ටොප් (Over –the -top) නොමිලේ භාවිතා කළ හැකි මොබයිල් ඇප්ලිකේෂන් භාවිතය සහ රජයේ බදු ප්‍රතිපත්තියේ වූ වෙනස්වීම මේ සඳහා බලපා තිබුණි.

## 3.3 කොමිෂන් සභාවට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතන 02 ක් විසින් පිළිවෙලින් සංඛ්‍යාත ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හා කොන්ත්‍රාත් ගිවිසුම කඩවීම මත එකතුව රු. 47,346,612,000 ක් වන්දි ඉල්ලා කොමිෂන් සභාවට එරෙහිව නඩු පවරා තිබුණි.

(ආ) හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරු හා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අතර 2014 ජූලි 28 දින එළඹුණු කොන්ත්‍රාත් ගිවිසුම 2016 අගෝස්තු 10 වන දින අවසන් කර ඇති අතර කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තීරණයට එරෙහිව කොන්ත්‍රාත්කරු විසින් ආරවුල් බේරුම්කාර මණ්ඩලය වෙත පැමිණිල්ලක් යොමු කර තිබුණි. බේරුම්කාර මණ්ඩලයේ තීරණය අනුව රු. 139,931,875 ක මුදලක් පැමිණිලිකරුට ගෙවන ලෙස කොමිෂන් සභාවට නියම කර තිබුණද කොමිෂන් සභාව විසින් 2017 දෙසැම්බර් 14 දින එම තීරණයට එරෙහිව වැඩිදුරටත් බේරුම්කරණය (Arbitration) සඳහා යොමු කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

කොමිෂන් සභාවේ කටයුතු කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කළ යුතු බැවින් අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක ළඟා කර ගැනීමට හැකි වන පරිදි කටයුතු මෙහෙයවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ වගකීම වේ. එහෙත් කොමිෂන් සභාවේ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අනුමත කර තිබුණේ මූල්‍ය වර්ෂය අවසන් වී මාස 02 ක් ඉක්ම යාමෙන් පසු එනම් 2018 පෙබරවාරි 06 දින දීය.

4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය තුළදී සිදුකළ යුතුව තිබූ එහෙත් 2017 වර්ෂය සඳහා කල් දමන ලද අන්තර්ජාල ළමා අරක්ෂණ වැඩසටහන, සංඛ්‍යාත කළමනාකරණ අංශය ස්වයංක්‍රීය කිරීමේ පද්ධතියක් සථාපිත කිරීම හා විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදු කිරීම යන කාර්යයන් 2017 වර්ෂය තුළදී ද සිදුකර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ සංඛ්‍යාත නිරීක්ෂණ පද්ධතිය ස්වයංක්‍රීය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම 2017 වර්ෂය දක්වා කල්දමා තිබුණද එය සිදුකර නොතිබුණි. එම පද්ධතිය ක්‍රියාකරවීම, භාවිතා කිරීම සහ නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් තාක්ෂණික නිලධාරීන් නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මේ සඳහා ප්‍රතිපාදන ලබා නොගත් බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දන්වා තිබුණි.

(ඇ) ජංගම දුරකථන භාවිතා කරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම උදෙසා කොමිෂන් සභාව විසින් අසාදු ලේඛන ගත ජංගම දුරකථන පිළිබඳ විස්තර ජංගම දුරකථන ජාල ක්‍රියාකරුවන් අතර හුවමාරු කරගැනීමට හැකිවන පරිදි එකී ජාල ක්‍රියාකරුවන්ගේ භාවිතය පිණිස "ජාතික උපකරණ හඳුනාගැනීමේ ලේඛනය" (National Equipment Identity Register) සකස් කිරීම සඳහා 2014 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අදාල කාර්යය සිදුකර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22 (උ) වගන්තිය යටතේ වූ නියමය පරිදි සහ 2010 දෙසැම්බර් 27 දිනැති අංක 1686/4 දරන ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව ඊළඟ මාසයේ 15 වෙනි දිනට පෙර සෙස් ගාස්තු ගෙවිය යුතු වුවත් එක් විදුලි සංදේශ ක්‍රියාකරුවෙකු 2016 හා 2017 වර්ෂ සඳහාත් තවත් ක්‍රියාකරුවෙකු 2017 වර්ෂය සඳහාත් සෙස් ගාස්තු ගෙවා නොතිබුණ අතර එක් ආයතනයක් ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා ගෙවීම් කර තිබුණේ 2018 මාර්තු 15 දිනදීය. සෙස් ගාස්තු නොගෙවීම හෝ ප්‍රමාද වී ගෙවීම් කරන ක්‍රියාකරුවන්ගෙන් දඩ මුදලක් අයකර ගැනීම සඳහා නීතිමය බලය ලබා ගැනීමට හැකි වනු පිණිස විදුලි සංදේශ පනතට වගන්ති ඇතුලත් කිරීමේ අවශ්‍යතාවය වරින් වර විගණන වාර්තා තුලින් පෙන්වා දුන්න ද මේ වනතෙක් එය සංශෝධනය කර නොතිබුණි. තවද විදුලි සංදේශ බදු පනත සංශෝධනය නොකිරීම හේතුවෙන් විදුලි සංදේශ සංගමයේ ප්‍රවීනයන්ගේ සහයෝගීතා වැඩසටහන යටතේ ඉදිරිපත් කර ඇති වාර්තාව ක්‍රියාත්මක කිරීමටද නොහැකි වී තිබුණි.

(ආ) 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතට අනුව විදුලි සංදේශ බදු ඊළඟ මාසයේ 15 දිනට පෙර ගෙවිය යුතු වුවත් ක්‍රියාකරුවන් තිදෙනෙකුගෙන් නියමිත පරිදි බදු සහ අධිභාර අයකර ගෙන නොතිබුණ අතර එසේ අය විය යුතු කාල පරාසය මාස 05 සිට වසර 03 දක්වා විය.

(ඇ) කොමිෂන් සභාවට අයත් අක්කර 112 රූඩ් 01 පර්චස් 10.5 ප්‍රමාණයකින් යුත් ඉඩමකින් ආසන්න වශයෙන් සියයට 50 ක ප්‍රමාණයක් කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් භුක්ති විඳිමින් පවතින අතර ඒ සම්බන්ධයෙන් කළමනාකරණය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

ඩිජිටල් භූමිෂ්ඨ විකාශන ජාල ව්‍යාපෘතිය (Digital Terrestrial Broadcasting Network Project) ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂයේ දී විදේශීය සමාගමක් සමඟ ගිවිසුම් ගත වී තිබුණද 2018 ජූලි 16 දින වන තෙක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීමට හේතු ලෙස ව්‍යාපෘතියට සම්බන්ධව කොමිෂන් සභාවට නෛතිකව වගකීම පැවරෙන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොමැති බවටත් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතනය (DBNO) මෙතෙක් පිහිටුවා නොමැති බවටත් අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා තිබුණි.

4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.8 වගන්තිය අනුව පරිත්‍යාග කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවත් එම අනුමැතිය ලබාගැනීමකින් තොරව ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමක් සඳහා සහ ජයවර්ධනපුර කෝට්ටේ රජ මහා විහාරයේ ශ්‍රී දළඳා පෙරහැර වෙනුවෙන් පිළිවෙළින් රු. 300,000 ක් හා රු. 500,000 ක් ගෙවා තිබුණි.

(ආ) කොමිෂන් සභාවේ අරමුණුගත කාර්යයක් නොවන චිත්‍රපටයක් හා ටෙලි නාට්‍යයක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් පිළිවෙලින් රු. 32,192,177 ක හා රු.7,160,400 ක මුදලක් කොමිෂන් සභා අනුමැතිය මත නිෂ්පාදන හා අධ්‍යක්ෂ වෙත 2015 වර්ෂයේදී ගෙවා තිබුණු අතර චිත්‍රපටය වෙනුවෙන් වැයකරන ලද මුදලින් රු. 26,400,000 ක් චිත්‍රපට අධ්‍යක්ෂවරයා විසින් 2018 ජනවාරි 12 දින වන විට ආපසු ගෙවා තිබුණි. විගණිත දිනය වූ 2018 ජූලි 16 දින වන විටත් ටෙලිනාට්‍ය විකාශනය කර නොතිබුණ අතර මුල් පිටපත කොමිෂන් සභාව විසින් ආපසු භාරගෙන තිබුණි. කෙසේ වුවද චිත්‍රපටය හා ටෙලිනාට්‍ය වෙනුවෙන් පිළිවෙලින් රු.5,792,177 ක් රු.7,160,400 ක් අයකර ගත යුතුව තිබුණි.

(ඇ) කොමිෂන් සභාව විසින් කුලියට ලබා ගන්නා ලද ලොන්ඩන් පෙදෙසේ පිහිටි ගොඩනැගිල්ලක් 2015 වර්ෂයේ ආපසු භාරදී තිබුණද එහි තැන්පත් මුදල වන රු. 1,350,000 ක් 2018 ජූලි 16 දින වන විටත් ආපසු ලබාගෙන නොතිබුණි.

(ඈ) 2017 වර්ෂයේ කොමිෂන් සභා නිලධාරීන්ගේ පවුල් සුහද හමුව වෙනුවෙන් කොමිෂන් සභා අරමුදලින් වැයකර තිබූ මුදල රු. 7,999,125 ක් විය.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 299 ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 206 ක් විය. මෙහිදී පුරප්පාඩු සංඛ්‍යාව 98 ක් හා අතිරික්ත සංඛ්‍යාව 05 ක් විය. 2018 ජූනි 01 දින වන විට අත්‍යාවශ්‍ය බඳවා ගැනීම් සිදුකර ඇති බවත් අනුමත කාර්ය මණ්ඩලය, ආයතනික ව්‍යුහය හා බඳවා ගැනීමේ රීති කාණ්ඩයෙහි සිදුකල යුතු වෙනස්කම් සිදුකරමින් පවතින බවත් අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා තිබුණද එම කටයුතු 2018 ජූලි 16 දින වන විටත් නිමකර නොතිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවූ සහකාර ගණකාධිකාරි තනතුරු 02 ක් ස්ථිර පදනමින් හා එක් ව්‍යාපෘති උපදේශක තනතුරක් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන තිබුණි.

(ඇ) ව්‍යාපෘති සහායක තනතුරට අදාලව සුදුසුකම් සපුරා ඇති පුද්ගලයෙකු සඳහා තත්කාර්ය පදනම ව්‍යාපෘති උපදේශක තනතුරක් ලබාදී 2017 ඔක්තෝබර් 09 වන දින සිට වසරක කාලයක් සඳහා මාසයකට රු.114,400 ක වැටුපක් හා රු.22,000 ක ඉන්ධන දීමනාවක් ලබාදී තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයක් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(ආ) තිරසාර සංවර්ධන අරමුණු පාදක කර ගනිමින් විදුලි සංදේශ තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධනය සඳහා 2030 වන විට සෑම ග්‍රාමීය ප්‍රදේශයක් තුළම විදුලි සංදේශ කටයුතු ආවරණය කිරීමේ ඉලක්කය කරා ලඟා වීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබුණි.

(ඇ) 2016 හා 2017 වර්ෂවලදී තිරසර සංවර්ධන ඉලක්ක කරා ලගා වීම සඳහා අවශ්‍ය තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පදනම් කරගෙන මූල්‍ය ප්‍රතිපාදන හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජූනි 02 දිනැති අංක පිඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව 2015 හා 2016 වර්ෂවල වාර්ෂික වාර්තා 2018 ජූලි 16 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6.2 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8 (1) වගන්තියට අනුව කෙටුම්පත් අයවැය ලේඛනය ගිණුම් වර්ෂය ආරම්භ වීමට මාස 03 කට පෙර අනුමත කළ යුතු වුවත් එය අනුමත කර තිබුණේ 2017 පෙබරවාරි 14 දින දීය.

(ආ) අයවැය ලේඛනයේ අයවැයගත හා තථ්‍ය අගයන් අතර සියයට 11 සිට සියයට 79 දක්වා විචලනයන් නිරීක්ෂණය විය. තවද වටිනාකම රු. මිලියන 53.5 ක් වූ වැය 09 ක් අයවැය ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6.3 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 ජූනි 23 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නිකුත් කරන ලද අංක 9 නියෝගය අනුව ආයතනය ණයක් ලබා නොගෙන ආයතනයේ මුදල්වලින් මෙම ඉදිකිරීම සිදු කළේ නම් ලැබෙන ලාභය යනාදී කරුණු ඇතුළත් වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාව වෙත එවීමට නියෝග කළද එය 2018 ජූලි 16 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2016 ජූනි 23 දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නෙළුම් කුළුණ ඉදිකිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු බව අවධාරණය කළද 2018 ජූලි 16 දින වන විටත් එය සිදුකර නොතිබුණි.

## 6.4 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.4.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන සැලැස්ම පරික්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) වර්ෂය ආරම්භ වීමට ප්‍රථම ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අනුමත කළ යුතු වුවත් 2017 වර්ෂය සඳහා සකස් කර තිබූ ප්‍රසම්පාදන සැලස්ම අනුමත කර තිබුණේ මූලා වර්ෂය ආරම්භ වී මාස 11 ක් ගතවීමෙන් පසු 2017 නොවැම්බර් 28 දින දීය.

(ii) පරීක්ෂාවට භාජනය වූ ප්‍රසම්පාදන අතරින් රු.50,769,759 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු දෙකක් මෙම ප්‍රසම්පාදන සැලැස්මට අතුලත් කර නොතිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ 4.2.3 අනුව ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) සම්මත ලංසු ලේඛනයට (Standard Bid Document) අනුව වැට්බදු පමණක් වෙනමම පෙන්විය යුතු අතර අනෙකුත් බදු හා ගාස්තු ලංසු මිලටම එකතුකර පෙන්විය යුතුය. මෙම උපදේශය ලංසු කැඳවීමේ ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) 2016/2017 මයික්‍රොසොෆ්ට් ඔෆිස් 365 බලපත්‍රය ලබාගැනීමට තරගකාරී මිලගණන් කැඳවා තිබුණ අතර ආයතන 05 ක් ලංසු ඉදිරිපත් කර තිබුණි. මෙහිදී සියළු අවශ්‍යතා සපුරා ඇති බව නිර්දේශ කර වැට් සහිත රු. 4,866,988 ක නොවන මිල සහිත ලංසුව ඉදිරිපත් කළ ආයතනය වෙත ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2017 සැප්තැම්බර් 15 දින තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීම් සිදුකර ආයතනයක් නිර්දේශ කර තිබියදී එම ආයතනය කොන්දේසිවලට පටහැනිව මෙම ප්‍රසම්පාදනය ඉදිරිපත් කර ඇති බවට හේතු ඉදිරිපත් කරමින් 2017 සැප්තැම්බර් 20 දින එම නිර්දේශය ප්‍රතික්ෂේප කර ඉතිරි ලංසුකරුවන්ගෙන් සුදුසු අයෙක් තෝරා ඉදිරිපත් කරන ලෙසට ප්‍රසම්පාදන කමිටුව විසින් නැවත තාක්ෂණික ඇගයීම් කමිටුවට දන්වා තිබීම විගණනයේදී ගැටළුකාරී විය.

(ii) ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ 7.8.4 වගන්තිය පරිදි ලංසු කොන්දේසි අනුව ප්‍රමාණවත් ලංසු සුරක්ෂණයක් ලබානොදීම හා ඉල්ලා තිබූ පලපුරුද්ද නොමැති වීම විශාල විශාල බැහැරවීම් ලෙස සලකා විස්තරාත්මක ඇගයීම් සිදු නොකරම ලංසුව ප්‍රතික්ෂේප කළයුතු වුවත් එම ආයතනය ජයග්‍රාහී ලංසුකරු ලෙස තෝරාගෙන 2017 සැප්තැම්බර් 28 දින ප්‍රසම්පාදන කාර්යය පිරිනමා තිබුණි.

(ඇ) කොමිෂන් සභාවේ 2017/2018 වර්ෂය සඳහා සේවක ජීවිත හා වෛද්‍ය රක්ෂණ සහ දේපල, පිරියත හා උපකරණ සඳහා සාමාන්‍ය රක්ෂණාවරණය ලබා ගැනීමට 2017 අගෝස්තු 14 දින රජයේ රක්ෂණ ආයතන 03 කින් මිල ගණන් කැඳවා තිබුණ අතර ආයතන 02 කින් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. මෙහිදී රු. 49,663,655 කට අවම ලංසුව ඉදිරිපත් කල ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ආයතනය තෝරාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ලංසු කොන්දේසිවලට අනුව ලංසු කැඳවීමේ ක්‍රියාවලියට සහභාගිවන සියළුම ලංසුකරුවන් විසින් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කල යුතු වුවත් ප්‍රසම්පාදන ප්‍රදානය කරන ලද ආයතනය එවැනි සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ලංසු ලේඛනවල කොන්දේසිවලට අනුව ලංසු වටිනාකමින් සියයට 10 ක කාර්යසාධන බැඳුම්කරයක් ඉදිරිපත් කළ යුතු වුවත් එය ඉදිරිපත් කර නොතිබුණි.

**6.4.2** කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

---

නෙළුම් කුළුණ ව්‍යාපෘතිය

---

2010 ඔක්තෝබර් 29 දිනැති අංක 10/2473/401/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නෙළුම් කුළුණ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව චීන සමාගම 02 ක් වෙත ප්‍රදානය කර තිබුණ අතර සමාගම විසින් 2012 ජනවාරි 03 දින වටිනාකම එ.ජ.ඩො 104,300,000 ක්වූ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමට අනුව 2012 නොවැම්බර් 12 සිට 2015 මැයි 12 දින දක්වා දින 912 කින් මෙම කොන්ත්‍රාත්තුව නිම කළ යුතුව පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ණය මුදල සඳහා එකඟතා ගාස්තු ගෙවීම

---

(i) චීනයේ පෞද්ගලික බැංකුවක් වූ EXIM බැංකුව විසින් පළමු ණය මුදල 2013 අගෝස්තු 19 දින නිදහස් (Disbursement) කර තිබූ අතර 2016 අගෝස්තු 18 දින වන විට ඇ.එ.ජ.ඩොලර් 88,655,000 ක්වූ මුළු ණය මුදලම ණය නිදහස් කිරීමේ කාලය අවසන් වීමට නියමිතව තිබුණි. එහෙත් ඉදිකිරීම් ප්‍රගතිය පහළ මට්ටමක පැවතීම හේතුවෙන් එම දින වන විට සම්පූර්ණ ණය මුදලින් එ.ජ.ඩො. 43,746,097 ක් පමණක් එනම් සියයට 49 ක් නිදහස් කරගෙන

තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් නියමිත දිනට සිදු නොකිරීම නිසා 2016 අගෝස්තු 19 දින සිට 2017 ඔක්තෝබර් 27 දක්වා කාලය සඳහා පමණක් උපයෝජනයට නොගත් ණය මුදල සඳහා ගෙවීමට සිදුවූ අමතර එකඟතා ගාස්තු ප්‍රමාණය එ.ජ.ඩො. 322,984 ක් විය.

(ii) ණය ගිවිසුමෙහි කාල සීමාව ඉක්මවීම මත EXIM බැංකුව විසින් නිදහස් කරනු ලබන සම්පූර්ණ ණය මුදල එ.ජ.ඩො. 67,259,754 කට සීමා කර තිබුණද ආරම්භයේ සිටම එකඟතා ගාස්තු ගණනය කිරීමේදී සම්පූර්ණ ණය මුදලම යොදා ගැනීම හේතුවෙන් එ.ජ.ඩො. 636,508 ක එකඟතා ගාස්තු ප්‍රමාණයක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) ඉඩමේ අයිතිය පවරා ගැනීම

(i) 2011 දෙසැම්බර් 14 දිනැති අංක අමප/11/2262/501/026/ටීබීආර් දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ආයතනය විසින් ඉඩම පවරා ගැනීම සඳහා කටයුතු කර තිබුණද නාගරික සංවර්ධන අධිකාරිය මගින් කොමිෂන් සභාව වෙත ඉඩම පවරා දී නොතිබුණි.

(ii) අමාත්‍ය මණ්ඩල තීරණයට සමගාමීව නොවීම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ 2012 ජනවාරි 23 දින ඇතිකරගෙන තිබුණු අවබෝධතා ගිවිසුමෙහි 03 වගන්තිය අනුව තැපැල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වල පූර්ව අයිතිය මාස 06 ක් ඇතුළත ලබාගැනීමටත් වසරක් ඇතුළත එම ඉඩම් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට පැවරීමටත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් කඩිනම් පියවර ගත යුතු බව සඳහන් වුවද 2018 ජූලි 16 වන තෙක් එසේ කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉදිකිරීමේ ප්‍රමාදය

(i) තෙළුම් කුළුණ ඉදිකිරීමෙහි කොන්ත්‍රාත් කාලය අවසන් වීමෙන් පසු 2015 අගෝස්තු 28 දිනැති අංක 2K15.217.02(2) දරන කොමිෂන් සභා තීරණය අනුව කොන්ත්‍රාත් කාලය 2017 ඔක්තෝබර් දක්වා දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දී තිබුණද 2018 ජූලි 31 දින වන විටත් ඉදිකිරීම් අවසන් කර නොතිබුණි.

(ii) කොන්ත්‍රාත් ගිවිසුමෙහි 8.7 උප වගන්තියට අනුව දිනක ප්‍රමාද ගාස්තුව මූලික ගිවිසුම් මුදලින් සියයට 0.05 ක් හා උපරිම ප්‍රමාද ගාස්තුව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 10 ක් විය. ඒ අනුව ප්‍රමාද ගාස්තු අයකළ හැකිව තිබුණේ දින 200 ක් සඳහා පමණි.

(ඇ) විදුලි සෝපාන සහ විදුලි තරප්පු පෙල සවිකිරීම

(i) විදුලි සෝපාන හා විදුලි තරප්පු සඳහා ව්‍යාපෘති උපදේශන ඒකකය විසින් 2014 සැප්තැම්බර් 19 හා 2014 ඔක්තෝබර් 17 දිනැති ලිපි මගින් 'OTIS' සහ 'KOYO' සන්නම් නාම නිර්දේශ කර තිබියදී 2014 දෙසැම්බර් 11 දිනැති ව්‍යාපෘති උපදේශන කමිටු වාර්තාව මගින් විදුලි සෝපාන L4 සහ L8 හැර ඉතිරි සෝපාන සහ විදුලි තරප්පු සඳහා 'Fujitec' සන්නම් නාමය නිර්දේශ කිරීම සඳහා හේතුව විගණනයට අනාවරණය නොවිය. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට එකඟවීමක් හෝ නොවීමක් ප්‍රකාශ කළ නොහැකි බව ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා තිබුණි.

(ii) එසේ වුවද විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් L4 හා L8 ඇතුළුව විදුලි සෝපාන 8 ක් හා විදුලි තරප්පු 8 ක් සැකසීමේ කාර්යය Fujitec වෙත ලබාදීමට කොමිෂන් සභාව විසින් 2016 මාර්තු 29 දින අනුමැතිය ලබා දී තිබුණද ඒ සඳහා ව්‍යාපෘති උපදේශන ඒකකයේ නිර්දේශයක් ලබා ගෙන නොතිබුණි.

(iii) මෙහිදී ජනාධිපති උපදේශකවරු දෙදෙනෙකුගෙන් කැඳවන ලද යෝජනා සහ නෙළුම් කුළුණෙහි විදුලි සෝපාන සහ විදුලි තරප්පු පෙල සවිකිරීම සඳහා උපකොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම සම්බන්ධයෙන් පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ නිර්මාණ මධ්‍යස්ථානය වෙතින් රු. 1,000,000 ක් වැයකර කැඳවන ලද වාර්තාවෙහි ඇතුළත් කරුණු පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

(iv) 2013 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලද විදුලි සෝපාන සහ විදුලි තරප්පු සඳහා උප කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීමේ ප්‍රසම්පාදනය සඳහා වසර 2 මාස 8 ක් දීර්ඝ කාලයක් ගත කිරීමෙන් අනතුරුව 2016 මාර්තු 31 දින කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණ අතර මෙම ප්‍රසම්පාදනයේ ප්‍රමාදය මූලිකවම නෙළුම් කුළුණ ව්‍යාපෘතිය ඉදිකිරීමේ ප්‍රමාදය සඳහා හේතු වී තිබුණි.

(v) විදුලි සෝපාන 06 ක් සහ විදුලි තරප්පුපෙලවල් 08 ක් සවිකිරීම 2017 අප්‍රේල් 30 ට පෙර අවසන් කළ යුතු වුවත් 2017 ජූනි 28 දින වන විට එම උපකරණ පමණක් වැඩබිම වෙත සපයා තිබුණි. සියළුම විදුලි සෝපාන සහ විදුලි තරප්පුපෙලවල් සවිකිරීම සහ ක්‍රියාත්මක කිරීම 2017 සැප්තැම්බර් 30 දින වන විට අවසන් කළ යුතු වුවත් 2018 මැයි 11 දින වන විටත් එය අවසන් කර නොතිබුණි.

(ඉ) උපදේශන ගාස්තු ගෙවීම

2010 ඔක්තෝබර් 27 දිනැති අංක 10/2473/401/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව ඉදිරිපත් කරනලද කොමිෂන් සභා පත්‍රිකා අංක DC/1994 සඳහා අංක 2K13.DC.199H හා 2013 පෙබරවාරි 06 දිනැති කොමිෂන් සභා තීරණයට අනුව උපදේශන සේවා ලබාගැනීම සඳහා අනුමැතිය හිමිවී තිබුණි. ඒ අනුව 2013 පෙබරවාරි 15 දින ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා මොරටුව විශ්වවිද්‍යාලය අතර උපදේශන සේවා ලබාගැනීම සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණ අතර උපදේශන ගාස්තු ලෙස කොන්ත්‍රාත් මුදලින් සියයට 1.5 ක් එනම් රු. 198,691,500 ක් ගෙවීමට එකඟවී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මෙම උපදේශන ගාස්තු ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) උක්ත ගිවිසුමට පටහැනිව 2015 නොවැම්බර් සිට මාසයකට රු. මිලියන 03 බැගින් අමතර උපදේශන ගාස්තු ගෙවීමක් සිදු කිරීමට එකඟ වී තිබුණි. 2018 අප්‍රේල් වන විට උපදේශන ගාස්තු ලෙස රු. මිලියන 240 ක් මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවා තිබුණි.

(ඊ) නෙළුම් කුළුණ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් බදු ගෙවීම

(i) නීතිපති දෙපාර්තමේන්තුවේ 2011 සැප්තැම්බර් 08 දිනැති නීතිපතිගේ, සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ඇමතූ ලිපිය අනුව බදු ගෙවීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වගකීම කොන්ත්‍රාත් ගිවිසුමෙහි නිවැරදිව හඳුනාගැනීම සිදුකළ යුතු බව දන්වා තිබුණද එලෙස හඳුනාගැනීමකින් තොරව කොන්ත්‍රාත් ගිවිසුමෙහි 23.2 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළදී අයකරනු ලබන සියළු බදු, ගාස්තු හා

වෙනත් ගාස්තුවලින් කොන්ත්‍රාත්කරු නිදහස් බවටත් 23.3 වගන්තිය අනුව කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සියළුම බදු, ගාස්තු හා වෙනත් ගාස්තු සඳහා ශ්‍රී ලංකාවේ නීති, රෙගුලාසි අනුව විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වගකිව යුතු බවට දක්වා තිබුණි.

මෙ සම්බන්ධයෙන් එකඟවීමක් හෝ නොවීමක් මෙම අවස්ථාවේ ප්‍රකාශ කළ නොහැකි බවත් අදාල වගන්තිවල පවතින නීතිමය ස්වභාවය සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදේශන සහාය ලබාගනිමින් සිටින බවත් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ii) කොන්ත්‍රාත් වටිනාකම වූ එ.ජ.ඩො. 104,300,000 ඇතුලත ගෙවීම් සිදුකළ යුතු වුවත් ඊට අමතරව උක්ත වගන්ති ප්‍රකාර කොන්ත්‍රාත්කරු විසින් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවන ලද ආදායම් බදු රු. 87,394,566 ක් හා උපයන විට ගෙවීම් බදු රු. 11,175,734 ක් කොමිෂන් සභාව මගින් අයකරගැනීම සඳහා කොන්ත්‍රාත්කරු හිමිකම් ඉල්ලා තිබුණ ද මෙසේ බදු ගෙවීමට දේශීය මුදල් ප්‍රතිපාදන ලබාගෙන නොතිබුණි.

(උ) නෙළුම් කුළුණ ඉදිකිරීම නිම කිරීමෙන් පසු ක්‍රියාවලිය

(i) 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත හා 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට සමාගමක් ස්ථාපනය කිරීම සඳහා බලතල නොතිබීම නිසා 2010 ඔක්තෝබර් 27 දිනැති අංක 10/2473/401/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී තිබුණද ඒවා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

- යෝජිත රූපවාහිනී කුළුණ සහ විනෝදාස්වාද මධ්‍යස්ථානය, කළමනාකරණ උපදේශන සමාගමක් වෙත සාකච්ඡා කර පැවරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ හිමිකාරිත්වය යටතේ කොළඹ රූපවාහිනී කුළුණ සහ විනෝදාස්වාද මධ්‍යස්ථානය, ප්‍රසිද්ධ සමාගමක් ලෙස පිහිටුවීම, කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීම සහ ආරම්භක මහජන නිකුතුවක් මගින් සියයට 30 ක කොටස් ප්‍රාග්ධනයක් නිකුත් කිරීම.

(ii) විදුලි සංදේශ පනතට අනුව සමාගමක් පිහිටුවීමට බලතල නොතිබීම නිසා කොළඹ නෙළුම් කුළුණ දේපළ කළමනාකරණ සමාගමකට බදු දීම ක්‍රියාත්මක කර තිබුණද ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2018 ජූලි 16 දින වන විටත් ලබාගෙන නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුදල් මගින් යොදවන රු. බිලියන 4 ක් නොඉක්මවන මුළු ආයෝජනයක් මත ඉදිකිරීමට යෝජිත රථගාල් සංකීර්ණය ඉදිකිරීම සඳහා 2018 ජූලි 16 දින වන විටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා ඉඩමේ හිමිකාරීත්වය ලබාගෙන නොතිබුණි.

## 8. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | අයවැය පාලනය | අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබීම. |
| (ආ) | ණය පාලනය | දීර්ඝ කාලීනව නිරවුල් නොකළ ණය ශේෂ පැවතීම හා ණය අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවතීම. |
| (ඇ) | ආදායම් පාලනය | ආදායම් එකතු කර ගැනීම සඳහා ප්‍රමාණවත් නීති ප්‍රතිපාදන අනුමත කරගෙන නොතිබීම. |
| (ඇ) | දීමනා ගෙවීම් | අනුමැතියකින් තොරව කොමිෂන් සභා තීරණ මත දිරි දීමනා, ප්‍රසාද දීමනා හා නිවාස කුලී දීමනා ගෙවීම. |
| (ඉ) | කොන්ත්‍රාත් පාලනය | නෙළුම් කුළුණ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති

www.trc.gov.lk | dgtsl@trc.gov.lk

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
276, ඇල්විටිගල මාවත, කොළඹ 08, ශ්‍රී ලංකාව
දු: +94 11 268 9345 | 2689351 | 2689352 | ෆැ: +94 11 268 9341